# රසවත් රසකථා

## (2 වන පොත)


## කතෘ: චානක බණ්ඩාරගේ

BA (Hons), LLB, GDLP (Aust), DAG, DTAG (UK)



**KKN ප්‍රකාශණයකි**

කොළඹ 8

දුරකථනය: 071 133 4224

arwdc@bigpond.com



සියළු හිමිකම් ඇවිරිණි

Copyrights Protected

කතෘවරයාගේ වෙනත් කෘති:

- හොඳ උවදෙස් (1 වන පොත) (පිටු 200)

(අප සමාජය/ජීවිතය, ආදරය/විවාහය/පවුළ, අපගේ දෑස් වැනිවූ දරුවෝ, ඉංග්‍රීසි ගැන, අපට අත්‍යාවශ්‍යම නීරෝගීකම, /මනා සෞඛ්‍ය, සතුන්/ වනජීවීන්/සුරතල් සතුන්, කාළින රසවත් ප්‍රස්ථාව පිරුළු)

- හොඳ උවදෙස් (2 වන පොත) (පිටු 200)

(අපේ පරිසරය විනාශ වීම අපි වළකමු, අපේ රට දියුණු කිරිම සඳහා වූ සාධාරණ හොඳ රාජ්‍ය ප්‍රතිපත්ති මෙන්න:, කළාව/ක්‍රීඩා, මගී ප්‍රවාහන දියුණු කරන ක්‍රම)

- රසවත් රස කථා (1වන පොත) (පිටු 160)

(හිනා හිනා හිනා හතර හිනා, මසුරන් වටිනා වැකි)

- රසවත් රස කථා (3 වන පොත) (පිටු 138)

(පෙම්වතුන්/විවාහය/පවුල් ජීවිතය/ නැට්ටුක්කාරියෝ, රස ආහාර පාන, බීමතුන්, සොඳුරු පාසැල් දිවිය, සිඟන්නෝ, පිස්සෝ, හොල්මන්/මරණ/ මිනීමැරුම්/ජොතිෂ්‍ය)

- **Selected Writings of Chanaka Bandarage** (324 pages – in English)

**රසවත් රසකථා (2 වන පොත)**

*බාල, වැඩිහිටි සැමට එක හුස්මට කියවන්න පුළුවන් වටිනා පොතක්; රස සාගරයක්*

*නම්, ස්ථාන මනංකල්පිතයි*

**පිළිගැන්වීම - ආදරණීය මාතෘ භූමියට සහ මා සහෘද ශ්‍රී ලාංකික ඔබ වෙත ............**

---

**@චානක බණ්ඩාරගේ, KKN ප්‍රකාශණයකි, කොළඹ 8**

---

**ISBN 483 – 950 – 657 223 -2 – 9**

---

**ප්‍රථම මුද්‍රණය: 2016 සැප්තැම්බර්**

# පටුන


- අප සමාජය — පිටු 1 – 79
- වෛද්‍යය සේවය — පිටු 80– 83
- හෝටල් — පිටු 84 – 94
- සුන්දර අතීතය — පිටු 95 – 124
- හොඳ තේරවිලී — පිටු 125 – 128

# • අප සමාජය

1. මගේ ගිණුම තියෙන්නේ ඩුබායිවල එච්එස්බිසි කියන බැංකුවේ. කාලෙකට උඩදී මගේ ගිණුමට ඩොලර් 8,200ක් නොදන්නා කෙනෙකු විසින් තැන්පත් කරලා තිබුනා. අනිවාර්යෙන්ම ඒවා මගේ සල්ලි නොවන බව මම දන්නවා. මම බැංකුව ට ගිහින් ඒ බව දැනුම් දුන්නා. එයාලා ඒකට බොහොම පැහැදිලා මට ලස්සන මල් කලඹකුත් දීල නොයෙක් විදිහට ස්තුති කළා. තව මට අඩු පොලියට ගෙයක් ගන්න ණයකුත් දුන්නා. අපේ රටේ බැංකුත් ඒ වගේ හැසිරෙන්න ඉගෙන ගන්නවානම් කොච්චර හොඳද?.

2. බස් එකක කොන්දොස්තර (මැදිවියේ) හාදයෙක් හිටියා; කොයි තරම් අවංකද කියනවා නම් බොහෝ විට වැඩිපුරත් එක්ක ඉතිරි සල්ලි දෙනවා. දවසක් ඇහුවා ඇයි ඉතුරු රුපියල් 2ට 5ක් දුන්නේ කියලා. මට කියනවා ‘නිකං අපහාස කතා අහන් ඉන්න බැහැනේ අයියේ කියලා’.

3. සමහර පුද්ගලික බස් කොන්දොස්ත්‍රලාට දවල් මේ දැන් වෙච්ච දේත් මතක නැහැ. ඉතිරි සල්ලි දෙන්න කියල කිව්වම ඉස්සරහට යන්න කියල බෙරිහන් දීල බහින්න කිට්ටුව ඉතිරි සල්ලි ඉල්ලුවම ඇයි මම දුන්නේ කියනවා.

4. පුද්ගලික බස් කොන්දොස්ත්‍ර ගාව  හොඳටම දෙන්න මාරු රුපියල් 12 තිබුනා, බහිනකොට ඉල්ලන්න කිවුවා. මම තුඩැල්ලෙන් පිටිපස්ස දොරෙන් බහින්න බෙල්  එක ගහනකොට මැන්  සීරුවන් ඉස්සරහ දොර ගාවට මාරු වෙලා, හොර ඇහින් වගේ මගේ දිහා බලනවා බැස්සද කියලා.

5. කොළඹ සිට අනුරාධපුරේ යන බසයට කොළඹින් ගොඩ වෙලා දඹුල්ලෙන් බැස්සා  කෙනෙක්  සිගිරිය නගින්න ඕන කියලා හිතාගෙන. බැස්සට පස්සෙයි  එයාට මතක්වුනේ ඉතුරු සල්ලි නොගත් බව. ටිකට්පතේ තියෙන දුරකතන අංකයට කතා කළ විට අයිතිකරු අනුරාධපුරේ සිට කිවුවා බසය දැන් කැකිරාව  හරියේ තියෙන්නේ ඔයා ඉක්මනට ගිහින් ඉතුරු සල්ලි ඉල්ලා ගන්න කියලා.  මිනිහා මගදී අත දාල මෝටර් ස්ය්කලයක් නවත්තගෙන වේගයෙන් ගොස් කැකිරාවෙදී බසයට ආයිත් ගොඩ උනා. මෙන්න මිනිහා ඉතුරු සල්ලි දෙන්න ඇතියි  කියලා  අමුතු කථාවක් කියනවා. ආයිත් ඕනර්ට කතා කරලයි ඉතුරු සල්ලි, රුපියල් 80,  ඉල්ලා ගත්තේ.

6. ඕස්ත්‍රේලියාවේ  සිඩ්නි පුරුද්දට බස් එකෙන් බහින කොට ඩ්‍රයිවර්ට ‘තැනක් යූ’ කියලා බැස්සා අපේ මහත්තයෙක්. ඩ්‍රයිවර් අන්දුන්කුන්දුන් වෙලා, පුරුදු නැතිව, මහත්තයා දිහා අමුතු විදියට බලලා.

7. සමහර අය බස් එකේ නිදාගෙන වගේ යනවා, ඒ, පුළුවන් නම් එහා අසුනේ ඉන්නකෙනාගේ පොකට් එකට විදින්න

8. දවසක් කොළඹ සිට ගාල්ලට යන බසයක ටිකට් එකට ඉතුරු සල්ලි දීලා නැහැ. මේ ගැන සිද්දවුණ කතාව නිසා කොන්දොස්තර මහතා බස් මගියාව හික්කඩුවේදී බස් එකෙන් බැස්සුවා. එයා බස් එකෙන් බහිකොට එක මගියෙක් - ටයි එකක් දාපු මහත්තයෙක් - හාමුදුරු සීට් එකේ වාඩිවෙලා හිටියේ, කිව්වා. 'මාරු රුපියල් පහ මොකක්ද අයිසේ' කියලා. ඒත් ඒ දවස්වල ඒ මහත්තයාට රුපියල් පහ කියන්නෙ ගාල්ලලේ සිට එයාගේ ගමට (ලබුදූවට) යන බස් එකේ දෙවරක් යන්න පුළුවන් ගණන.

9. 107 රූට් එකේ අම්මා කෙනෙක් මොනතරම් මොබයිල් ෆෝන් එකට ඇදී සිටියාද කියනවනම් පිටකොටුවෙන් යමෙක් එක්ක කතා කරමින් බස් එකට දරුවාත් සමඟ නැග්ග ඇය හැඳල හන්දියෙන් බහින තුරුත් ඒ කෝල් එකෙමයි හිටියේ, ඒ මදිවට දරුවවත් අමතක කරලා බස් එකේ දමලායි බැස්සේ. කොන්දොස්තරට සිදු වුනා පස්සේ අම්මාව හොයලා දරුවාව එයාට බාර දෙන්න.

10. කාලාන්තරයක් බස්වල ගැට කැපීමෙන් ජීවත්වූ මිනිසෙක් කොන්දොස්තර කෙනෙක් උනා, එවිට, හොඳට ගැටකපන්න පුළුවන් බව සිතා. හොඳට පැක් වෙච්ච බස් වල ගෑනු, පිරිමි දෙගොල්ලගෙම හොඳට ගැට කැපුවා. දවසක්

බස් එකේ මහත්තයෙක්ගේ ගැට කපලා අහු උනා. කොන්දොස්තර/ ගැටකපන්නාව පොලිසියට භාර දුන්නා. උසාවි නියෝගයක් අනුව තනිකඩයෙක් වන මිනිහාගේ ගෙදර පරික්ෂා කරාම පොලිසිය උඩ ගියා. මිනිහා ගැට කපපු මහත්වරුන්ගේ පර්ස් 400 විතර, සල්ලි අරගෙන, ගෙදර ලස්සනට ක්‍රමානුකූලව අහුරලා, හරියට ප්‍රදර්ශනයකට වගේ. සමහර පර්ස් වල උඩින් අයිතිකාරයාගේ අයිඩෙන්ටිය හෝ වාහන බලපත්‍රය තබා තිබුනා. මහත්තුරුන්ගේ පර්ස් සහ නොනාලගේ හෑන්ඩ් බෑග් කපන දැලි පිහි වගේ පිහියාම 12ක් විතර හමු උනාලු.

11. මොබයිල් ෆෝන් කථා වලට ඇදී පිටිපස්සෙන් එන කෝච්චිය නොදැක මොන තරම් ජීවිත පසුගිය කාලේ විනාශ උනාද? 2016 මැයි මාසේ එක දවසේ තැන් දෙකක තරුණ ජීවිත 2ක් නැති උනා.

12. අපේ ගෙදර වැඩ පටන් ගන්නකොට මගේ වයස 8යි. තාත්තා මුල්ගල තියන්න කිවුවේ මට. ලොකු අයියාගේ මූණ අඳුරු උනා. මම පවුලේ බාලයා. මට එදා තේරුනේ නැහැ. අද (අවුරුදු 50 පසු) ඒ ගේ ලොකු අයියාගේ, තාත්තා රවටලා මිනිහා ලියා ගන (තාත්තා මට ලියන්න හදනකොට මං කිවා ඔක්කොම ළමයිට ලියන්න කියලා).

13. නැකතක් නෑ කියන නිසා මම මගේ හිතේ තිබුන වෙලාවක් කිවා නැකත් වෙලාව කියලා. ඒ වෙලාවට මුල් ගල

තිබ්බා.අනේ කිසිම අවහිරයක් නැතුව වැඩේ හොදින් කෙරුණා.

14. ලංකාවේ හිටපු සුද්දෙක් එන්ගලන්තේදී හම්බවෙලා කිවුවා ආපහු සිය රටට ගියාට පසු මාස 6ක් විතර යනකම් කෑම රහ නැහැල්ලු, ලංකාවේ කෑම ඒ තරම්ම රසයිලු. ඒ ගොල්ල කෑම රස වෙන්න දාන්නේ ලුනුයි ගම්මිරිසුයි විතරයි.

15. අපේ වැඩපොලේ ගංජා බීමට විරුද්ධව නිතරම කතා කරන අයෙක් රාත්‍රි වැඩපොළේ  නිදා ගන්නා අතර ගංජා කාරයෝ කීපදෙනෙක් මිනිහගේ බෑගයේ සහ සාක්කුවේ  ගංජා පැකට් හංගලා  ආරක්ෂක අංශයට දැන්වුවා. අනේ අහිංසකයාගේ රස්සාව නැතිවුනා. අපමණ නින්දා අපහාස ආවා.

16. ගෙදර හාල් නැති දවස්වල පොල් ගාලා පාන්පිටි වලින් රොටියක් හදාගෙන පුච්චන් කාපු දවස් එමට තියෙනවා. කිරි සප්පයෝ ඒ අහාරයට පුරුදු උනා. පාසැල් යන වයසේ ළමයි ටවුමේ කඩ වල වැඩට යැව්වා; වේටර්, වලන් පිඟන් හෝදන වැනි වැඩ මගේ  දරුවෝ කළා.

17. නුගේගොඩ විජේරාම අසල වයසක වෙළෙන්දියක් දිනපතා කිතුල් හකුරු මුල් 20 පමණ ගෙනත් රුපියල් 80 ගානේ විකුනනවා. හැමෝම හිතන්නේ කිතුල් හකුරු කියලා. මේවා හදන්නේ තල් සක්කර සමග සීනි දාලා කියලා දන්නේ නැහැ.

18. ලීවර් සමාගමේ කම්කරුවෙක් වැඩ ඇරිලා එළියට එනකොට වයර් වගයක් කුඩේ ඇතුලේ හංගගෙන එනකොට සිකියුරිටියට අහු උනා. වහාම වැඩ තහනම් කලත් පස්සේ දරුවෝ 5දෙනෙක්ගේ තාත්තා කෙනෙක් නිසා ආයි ස්ථාපිත කළා.

19. හැමර්ස්ලි කියලා වයසක නෝනා කෙනෙක් මිය ගියා නිව්යෝර්ක් නගරේ. එතකොට එයා නිව් යෝර්ක් නගරේ හිටපු ධනවත්ම වගේ පුද්ගලයා. මැරෙනකොට වයස 100යි. තනියම ජීවත්වූ මේ කාන්තාවගේ බුදලයෙන් වැඩි කොටසක් ලියා තිබුනේ තම බල්ලන් සහ පූසන්ගේ සුභ සිද්ධියටයි. එක කොන්දේසියක් තිබුනා සතියකට වරක් ඒ අයව සතුන් සඳහාවූ ආපන ශාලාවකට ගෙන යා යුතු බව.

20. එක රියදුරු සහායකයෙක් ඉන්නවා එන්ජිමට බ්රේක් ඔයිල් දාපු. වාහන හිමිකරුට මුළු එන්ජිමම අලුත්වැඩියා කරන්න වුණා. රුපියල් 20,000 ට වැඩියි පාඩුව.

21. පොලිස් නිලධාරියා මා හොඳින්ම දන්නා අයෙකි. ඔහු රාජකාරී කරන දිනක මීකිරි රැගෙන ආ වරෙන්තු කරුවෙක් 'ඔබතුමාට පොඩි තෑග්ගක්' කියා කිරිහට්ටිය මෙසය මත තියා හිසනමා ගරු කරඇත. ඉන් පසු පොලිස් නිලධාරියා අතින් මුදල්දී සීනි ගෙන්වා වරෙන්තු කරුට කිරිහට්ටියම කෑමට දී අවවාද කර ඇත.

22. මගේ මහත්තයා ෆුට් බෝඩ් එකේ යන්න ආසයි - කපටි කමට. යන ගමන් තරුණ ගෑනු ළමයි එහෙම ඉන්න කොට ඒ අයට පෙන්න ඇඩ්‍රස් කොළ විසි කරනවා ටෙලිෆෝන් නොම්මරයත් දාලා. දවසක් වැරදිලා විසි කරලා තියෙන්නේ මගේ නෑනා කෙනෙකුට (මගේ මල්ලි බැඳපු නෝනා) . එයත් එක ජාතියක සක්කරවට්ටමක්. නෑනා හැරෙන තැපැලෙන් පොස්ට් කාඩ් එකක් එව්වා මගේ හස්බන්ඩ් කියලා නොදැන සියලු විස්තර දන්වලා. හස්බන්ඩ් ප්‍රති උත්තර ලිවුවේ නැහැ, නමුත් කරන සෙල්ලම නවත්තුවෙත් නැහැ. මේ 1970 මැද ගණන් වල. හස්බන්ඩ් සහ නෑනා අදත් කුකුලා සහ කිකිළි.

23. එක්තරා නිවසක හොරා කෑම කන නිසා ගෙහිමියා සුනඛයෙක්ව කාර් එකේ දමාගෙන සැතපුම් 25 ක් පමණ දුරක ගෙනිහින් දාලා. දැන් ඉතින් ඒ කරදරේත් ඉවරයි කියලා ගෙදර ඇවිත් නිදාගෙන පහුවදා උදේ ඇහැරුනාලු. එතකොට සුනඛයා කන්පොට ගහ ගහ, වලිගය වන වන, ගෙහිමියා ආදරයෙන් පිළිඅරන් ස්තෝප්පුවේ ඉන්නවලු. ගෙහිමියාට තමන් ගැනම ලැජ්ජා හිතුනලු.

24. මගේ ලොකු අයියා වෝකර් ඇන්ඩ් ග්‍රේග් එකේ චීෆ් ඉලෙක්ට්‍රිකල් බාස්. ඒ ගොල්ලා කුලියට ගෙයක් අරං හිටියා කොළඹ 15හේ සමිට් පුර. දවසක් කුඩු රජෙක් අයියගේ බෙල්ලට දැලි පිහියක් තියලා කියලා තියෙනවා ‘මම

දන්නවා තමුසේ සී අයි ඩී ඒජන්ට්'කියලා, ' දවස් 2කින් මෙහෙන් නොගියොත් කපනවා දැලි පිහියෙන් බෙල්ල' කියලා. අහිංසක අයියා එදාම එයාගේ නෝනාවයි, ළමයි දෙන්නවයි, බඩු මුට්ටුයි ලොරි බාගෙක දාගෙන, තට්ටු දෙකේ ගෙදරක උඩ තට්ටුව කුලියට ගත්තා කොළඹ 4රේ හේග් පාරේන්.

25. කාන්තාවක් හොඳටම පිච්චිලා ගේනාවා රෝහලට.ඒ කාන්තාව කිව්වේ ලාම්පුව පෙරලුනා කියලා ඒ කාන්තාව පුංචි දරුවෙකුට කිරි දෙන අම්ම කෙනෙක්. කිරි එරිලා අඩනවා, වාට්ටුව දෙකක් වෙන්න. කෙසේ වෙතත් දොස්තර මහත්වරුන්ට හොඳ කරන්න බැරි බව ලෙඩාටම කිව්වා. අන්තිමට කියන්න දෙයක් තියෙනවාද කියලා අහන කොට තමා කියල තියෙන්නේ 'පුරුෂයා මට ගිනි තිබ්බා' කියලා. පස්සේ එයා මැරුණා.

26. මේ ලඟදි, බොරැල්ල කනත්ත හන්දියේ රාලහාමි කෙනෙක් වාහන එකක් වත් නැති සේනානායක මාවතට අත වනනවා එන්න කියලා; අනිත් මාර්ග 3නේ වාහන කට්ටට පිරිලා.

27. ඉස්කෝලේ ඉඳලා ගෙදර ආපු මම 'බඩගිනියි' කියලා ඉස්කෝලේ ඇඳුම් පිටින්ම වරිච්චි කුස්සියට ගියා. 'පොඩ්ඩක් ඉන්න පුතේ' කියලා අම්මා පිගානකට බත් එකක් බෙදන් ගෙනත් දුන්නා. බතුයි පෙර දා රෑ ඉතිරිවෙලා තිබු, අම්මා විසින් දවල් නැවත තෙම්පරාදු කර තිබු පරිප්පුයි, මම දමලා ඇරියා. කෑවට පස්සේ 'අම්මේ, ඇයි අම්මා මාත්

එක්ක කැවේ නැත්තේ' කියලා අහුවහම 'වලඳේ තියෙනවා පුතේ, පස්සේ කනවා කියලා' කිවුවා. මම කෝකටත් කියලා කුස්සියේ දර ලිප උඩ තිබබිච්ච කළු ගැහිච්ච මැටි වලඳේ ඇළුමිනියන් මුඩිය උස්සල්ලා බැලුවා, අනේ වලඳේ අඩිය විතරයි, මුකුත්ම නැහැ. අම්මා හුරලම මට ගෙනත් තියෙන්නේ, එයාට දන්කුඩවත් නැහැ. මට ඇඬුම් ආවා, 'අම්මා බඩගින්නේ නේද අම්මේ' කියලා කියවුනා. 'දූප්පත් කමත් වලිගෙ නැති ගොනා වගේයි පුතේ' කියලා අම්මාත් ඇගේ කඳුළු බිංදුව ඇඳුමෙන් පිහි දා ගත්තා.

28. මිය ගිය මවගේ අවසන් කටයුතු වෙලාවේ වේදනාවෙන් විලාප තබමින් හඬන හොඳම මිතුරා සනසන පිරිස දුටු මිතුරා තමන්ටත් එසේ දුක් වී අඬලා වැළපෙන්න හිතිලා ගෙදර ඇවිත් අම්මාට මැරෙන්න කියලා.

29. ගැටවර පුතෙක් අම්මාගෙන් අහනවා - ඇයි අම්මේ මගේ සමහර කෙස් සුදුයි, ඒත් ඔයාගෙයි, තාත්තගෙයි කළුම කළු?. අම්මා කියනවා 'අද කාලේ පුතේ තරුණ ළමයිට සුදු කෙස් තියෙනවා ඒ අය ගණන් ගන්නේ නැහැ; මැදිවියේ අප සුදු කෙස් ගහක් දැක්ක ගමන් ඩයි කරන්න පටන් ගන්නවා.'

30. මගේ මහත්තයාගේ මල්ලි කොළඹ ගිහින් ආපහු ආවේ නැහැ. මාස 3ක් විතර හොඳටම හෙව්වා. මහත්තයා අන්තිමට කොළඹ මෝචරියේ චෙක් කළා. මල්ලිගේ ෆොටෝ එකක් තියෙනවා, බෙල්ල ලඟින් විතරයි. මල්ලි

මීරිගමදී කෝච්චියට පැනලා, මැරිලා. ආණ්ඩුවෙන් වලලලා තියෙන්නේ. මල්ලිගේ වයිෆ් ආයි බැන්දේ නැහැ, තවමත් රැට හොරෙන් අඬනවලු. මගේ මහත්තයා කොච්චර වෙනස් උනාද කියනවා නම් එදායින් පස්සේ මට රෞද්‍ර නැහැ, හරිම කරුණාවෙන් සලකන්නේ.

31. මමත් එක්ක හමුදාවක රාජකාරි කළ දකුනේ කෙනෙක් හිටියා. අපි සමග සිටි එක් අයෙකුගේ අම්මට බොහෝ තද බල රෝගයකින් පෙලෙන බව අප කවුරුත් දැන සිටියා. දිනක් හදිසියේම ඔහුට විදුලි පණිවිඩයක් ලැබුනා. එහි මෙසේ සදහන්ව තිබුනා. අම්මට අසනීපයි ඉරිදා 10 ට ගාල්ල කොටුවට එන්න, කැමරාවත් අරන් එන්න මීට උදේශිකා, මෙය සිදු උනේ 1989දී.

32. ගහක් ගලක් වගේ හිටපු අපේ තාත්තා මාස 3ක් ඇතුලත මැරිලා ගියා වයස අවුරුදු 89න්, අවුරුදු 100ක් ඉන්නවා කියලයි එයා කිවුවේ.

33. එක තාත්තා කෙනෙක් දැනට වසර 5 කට පමණ හදිසියේ මිය ගීයා. ඔහු පහල මධ්‍යම පාන්තිකයෙක්, ඔහුගේ පුතා හිටියේ පිටරටක. ඒ විතරක් නොවේ ඔහුගේ බිරිඳත් (අම්මා) සිටියේ පිටරට සිටින පුතාගේ ගෙදර ඔය අවස්ථාවේ. ඉතින් දරුවන් එන්න ප්‍රමාද නිසා ලංකාවේ හිටපු බාලම පුතා එයාට පුළුවන් විදියට නෑදැයනුත් මිතුරනුත් අවමගුල් උත්සවය සංවිධානය කළා. ලොකු පුතා ලංකාවට ආවා බිරිඳත් සමග.

ඇවිල්ලා කළේ මුලින්ම පෙට්ටිය ඒ අයගේ සමාජ මට්ටමට හරි නැහැ කියලා මාරු කරන්න ලැහැස්ති වූ එකයි. පත්තර ඔක්කොගෙම දාන්න ඕනේ කිවුවා. ඒ වෙලාවේ එක්තරා නෑ කෙනෙක් (පුංචි අම්මා) ඉදිරියට ඇවිල්ලා හොඳට ලුණු ඇඹුල් ඇතුව කියලා දුන්නා පුත්‍රයාට. පුත්‍රයා මේ තාත්තට ජීවත් වෙලා ඉන්න දවස්වල සැළකූ විදිය සහ දුප්පත් පොඩි පුතා නේද තාත්තාව බලාගත්තේ කියලා.

34.ඔලුවේ කැක්කුමට ලාම්පුතෙල් දාලා ගාලා සුව වෙච්ච එක්කෙනෙක් ඉන්නවා. අත්හදා බලන්න එපා.

35.ඉස්සර රැට කන්න දරුවොත් එක්ක ක්‍රෙස්ට් කැට් යන පුරුද්දක් තිබුනා. දවසක් බිල ගෙවන්න මම පර්ස් එක අතේ තියන් සාක්කුවේ  පර්ස් එක හොයනවා. වයිෆ් දැකලා දැක්කේ නැහැ වගේ හොරෙන් චුටි දුව එක්ක හිනා වෙනවා; එයාට හැමදේටම හිනා.  හොඳ වේටර් තමයි මට පෙන්නා දුන්නේ.

36.රූපලාවන්‍ය ශිල්පිනියන් කියා ගන්නා අය කොච්චර සල්ලි ගරා ගන්නවාද? මගේ ඥාති අක්කා කෙනෙක් විවාහයට අන්දවා ගන්න ගිහින් එයාව බංකොලොත් වුනේ නැති ටික විතරයි. රූපලාවන්‍ය ශිල්පිනිය කියන තැනින් ඇඳුම් මහන්න ඕන, එයාගේ මිතුරියගේ මල් බිස්නස් එකෙන් මල් ගන්න ඕන. ඡායාරූප ශිල්පියා එයාගේ සැමියා. පෝරුවේ අෂ්ටක කිව්වෙත් එයාගේ නෑදෑයෙක් වන බාප්පා කෙනෙක් කියල අපිට පසුව ආරංචි වුනා. තව බෙර වාදකයන් නැට්ටුවන් එතැනින්ම ගන්න වුනා. ජයමංගල ගාථා කියන ළමයිත් එයාගේ පන්තියේ ළමයි. මේ ඔක්කොම කරන්න

වුනේ ඒ අක්කා පිටරට යන්න කලින් විවාහ වෙන්න ඕන නිසා ඇති වුන හදිසියෙන්; මේ කාන්තාව හොඳටම ප්‍රයෝජනය ගත්තා.

37. දැන් කොහොමත් රටේ බහුතරයක් ගෘහිනියන් දවාලට රූපවාහිනියේ, කේක් පන්තිය, රූව අලංකරණය කොණ්ඩා සැකසීම බලා ගත්තු ගමන් තමයි. ගෙට හොරු පැන්නත් මේ ලෝකේ සිහියක් නැහැ. අපේ ගමේ ගෙදරක රෙදි වැලේ තිබුන වටිනා උත්සව ඇඳුම් වගයක් හොරු අරන් ගිහින්. කවුරුවත් වත්තට ඇතුළු වෙනවා දැනුනේ වත් නැද්ද කියල ගමේ කට්ටිය ඇහුවම ඒ බවලති කියලා තියෙන්නේ ගෙදරදී ෆේෂල් එකක් දමාගෙන ඇස් පිපිඤ්ඤා පෙති වලින් වහගෙන පැයක් හිටපු නිසා කවුරුවත් ගෙදරට එනවා දැක්කේ නැහැ කියලා.

38. ඔත්පලව සිටි අභිංසක ස්වාමියා සමග බහින් බස් වීමේදී ඔහුට පයින් ගහලා වට්ටපු  වයසක අම්මෙක් හිටියා. ස්වාමියා මාස තුනකට විතර පස්සේ මලා. මිනිය ඉස්පිරිතාලේ ඉඳන් ගමට ගේන කොට මේ කෙනා බෙරිහන් දී හැඬුවා ගමටම ඇහෙන්න , කල වැරදි වැඩේ දන්නේ ගෙදර ළමයි විතරයි. පුච්චලා ආදාහනෙන් දවස් කිහිපයින් මෙයා ගෙදර පාලනය සියතට අතට ගත්තා, හිට්ලර් වගේ පාලනය. හොඳට හිටපු ළමයි අතර බෙදීම් ඇති කළා. අද හස්බන්ඩ්ගේ පෙන්ෂන් එක අරගෙන සැපට ඉන්නවා (එයාටත් වෙනම පෙන්ෂන් එකක් ලැබෙනවා, විශ්‍රාමික

උසාවි ස්ටේනෝ කෙනෙක් නිසා). අවුරුද්දේ දානෙන් පස්සේ හස්බන්ඩ්ට එකම දානයක් වත් දෙන්නේ නැහැ.

39. ඉඩම් ඔප්පු අත්සන් ලබාගත්, වාහන පැවරුම් ෆෝම් සුරැකුමට තියාගෙන සල්ලි පොලියට දෙන අම්මන්ඩියෙක් හිටියා. ගෙය අහිමි වූ අසරණ කාන්තාවක් වෙන කරන්න දෙයක් නැතිම තැන ඒ ගැනිගේ ගෙට ඇවිත් 'උඹ මැරියන්' කියලා මුනටම සාප කරලා ගියා. ඊට සති දෙකකට පස්සේ ගෑණි කොච්චිකඩේ ඉඳලා පිටිපනට මුහුදු වෙරල දිගේ ඇවිදගෙන එනකොට එක පාරටම ලොකු රැල්ලක් ඇවිත් එයාව මුහුදට ඇදගෙන ගියා. මිනිය ගොඩ ගැහුවේ මෝදරින්.

40. සීලිමා කියලා ලොකු සල්ලිකාරයෙක් හිටියා; 1 වැනි බිරිඳගෙන් ළමයි 6යි; එයාගෙන් ගොඩාක් කරදර ආවා. දික්කකසාද මිනිහා විශ්වාස කලේ නැහැ. ලාබාල තරුණියක් සමඟ අනියම් සම්බන්ධයක් පටන් ගෙන තවත් ළමයි 2ක් බිහි කළා මුල් පවුලත් ගෙන යන ගමන් . ඒ තරුණිය මෙයාට සැබැවින්ම ආදරේ කළා පමණක් නොව හොඳින් බලා ගත්තා. සීලිමා පවුල් දෙකටම හොඳට සැලකුවා. දවසක් 1වැනි බිරිඳ 2වෙනි බිරිඳගේ කෙස් වල්ලෙන් අල්ලලා හොඳටම ගැහුවා. මෙය දුටු සීලිමා ඉතා කලකිරී බොන්න පටන් ගන්නා. අවුරුද්දකින් පමණ පස්සේ මැරිලා ගියා. 2වෙනි බිරිඳට මරණෙට එන්න පවුලේ අය ඉඩ දුන්නා. පවුල් දෙකේ දරුවෝ දැන් යම් ආශ්‍රයක්

පවත්වනවා, හැබැයි බිරින්දෑ වරුන් දෙදෙනා අදටත් නයි වෙරයි.

41. පත්තරේ මෙහෙකාරියක් ඉල්ලා දැන්වූ දැන්වීමට බොහෝ අය දුරකථන අංකයට කතා කළා. ඉතා අසරණ පහේ මැදිවියේ ගැහැණු කෙනෙක්ව තෝරා ගත්තා. සති 2ක් පමණ ඉතා හොඳින් ගෙදර සියලු වැඩපල කර ගමේ හදිසියක් ඉක්මනට ගිහින් එන්නම් කියා යන්න ගියා, පඩියවත් නොගෙන. කොතරම් කතා කලත් අවේ නැහැ, පසුව මොබයිල් ෆෝන් එක දිගටම ඔෆ් කරලා. දින කිහිපයකට පස්සේ පාතලෙන් කියා ගත්තු කට්ටියක් කථා කර කිවා ඒ ගැනු කෙනාව එව්වේ අපි, ඕගොල්ලන්ගේ ඔක්කොම විස්තර අපි දන්නවා, රුපියල් ලක්ෂ 25ක් දුන්නේ නැත්නම් 'වැඩ වරදියි' කියලා. හොඳටම බයවූ ගෙදර වාසය කල වැඩිමහලු යුවල ලක්ෂ 15ක් ගෙවා තර්ජනයෙන් මිදුනා, පොලිසියට කිව්වෙත් නැහැ. මෙවැනි පාතාල කල්ලි විවිධ අයුරින් සමාජයට තර්ජන ඇති කරනවා.

42. ෆාමසි 10ක් අයිති අන්තිම ලස්සන කාන්තාවක් මුහුණේ පිළිකාවක් හැදිලා අන්තිම, අපමණ දුක් වින්දාලා මැරුණා. මැරෙන කොට මුහුණ කොපමණ අවලස්සනද කිවොත් ඇගේ රට ඉඳන් ආපු දරුවෙක් ඉල්ලීමක් කළා මිනි පෙට්ටිට ය සීල් තියන්න කියලා. එම්බාම් වැඩපොලෙන් ආපහු මිනිය ගෙනිහින් හොඳට හදපු නිසා එහෙම කරන්න ඕන උනේ නැහැ.

43. කාලයක් තිස්සේ දිනපතා රාත්‍රී යාමයේ කුමක් හෝ කාරණයකට තම බිරිදට තඩිබාන බේබදු සැමියා හදිසියේ මලා. එතැන් පටන් රෑට රෑට ගුටි කෑම පුරුද්දට ගිය කාන්තාවට නින්ද නොයෑමේ ලෙඩේ සෑදී බැරිම තැන වංගෙඩිය බාල්කයක එල්ලා එය පද්දා රිදෙන්න ඇඟට කිහිප සැරයක් වද්දාගෙන කාගෙන් හරි ගුටි කනවා වගේ බෙරිහන් දෙනවලු නිදාගන්න පෙර රෑ ජාමෙට හැමදාම.

44. කන්න දෙන දේවලට ජාපාල දමල දෙන සමාජයක් මේක, අඳුනන්නේ නැති අය දෙන දේ හොයලා බලලා කන්න.

45. හික්කඩුවේ ගොනාපිනුවල සුරුට්ටු බොන පුරුද්ද ඇති කෙනෙක් වෙලේ ගිරව් පන්නන ගිහින් රතිංඤා කරලකට ගිනි අවුලලා ඒක කටේ තියාගත්තලු.

46. තඩි මරපු ඌරෙක් උදේ ඉස්සරහ ගෙදර දොර අරිනකොට ගෙනත් දාලා තිබුනා. ඌගේ කටේ ලේ. තාම දන්නේ නැහැ කවුරු කරපු වැඩක්ද කියලා. අම්මා කිවුවා තරහා කාරයෙක්ගේ වැඩක් කියලා, නමුත් ඊට වැඩිය මුකුත් කිවේ නැහැ. තාත්තයි අම්මයි ඉස්සරහා කාමරේ කුටු කුටු ගෑවා. කුණු ලොරියට රුපියල් 100ක් දීලයි ඉවත් කලේ. දින 7 ට පස්සේ අහන්න ලැබුනා අපේ පරම හතුරු යදොරිස් බාසුන්නහැලගේ ගෙදර ඉස්සරහ කවුද මිනී හිස් කබලක් දාලා ගිහිල්ලා කියලා. දෙන්නගේ කුටු කුටුවේ තරම නේද කියලා මම මටම කියා ගත්තා.

47. මැදවච්චියේ තරුණියක් මාතර පැත්තේ හමුදා නිලධාරියෙක් සමග දැන හැඳුනුම්කමක් ඇති වුණා. පසුව දෙමාපියෝ මැදවච්චි ගොස් ගම් බිම් බලා ආවා (සමහර විට දෙමාපියෝ කියලා වෙන කව්රුහරි පෙන්නලා බොරුවක් කළා කියලයි හිතෙන්නේ). විවාහ වෙන දවසේ පෝරුවට නගින්න නැකත එන තුරු ඉන්නකොට එක්තරා කාන්තාවක් පොලිසියත් සමග පැමිණ මේ මගේ මහත්තයා, මේ එයාගෙයි මගෙයි දරුවා, මේ අපේ සහතිකය, මේ ෆොටෝ එක කියලා නිවැරදිව සියල්ල පෙන්නලා දුන්නා. ඔහු අත්අඩංගුවට පත් වුණා. රැස්ව සිටි අයගෙන් ගුටි සංග්‍රහයක් ලැබුණත් පොලිසිය මැදිහත් වෙලා බේරගත්තා. තරුණිය අවසාන මොහොතේ බේරුණා.

48. තාත්තා මැරිච්ච වෙලේ ගෙදර වැඩ පල කරලා දීපු ගෑනු අය පපුවට ගගහා අඬන්න පටන් ගත්තා. අම්මා මුකුත් කිව්වේ නැහැ. තාත්තාගේ නංගි (මගේ ලොකු නැන්දී) ඒ අයට බැනලා නැවැත්තුවා.

49. ඔන්න ගමක වඳුරෝ වගයක් හිටියලු. විටින් විට ගමට කඩා වැදිලා කරදර කරනවලු.මේක නවත්වන්නේ කොහොමද කියලා ගෑනු කෙනෙක් කල්පනා කළවිට නුවණක් ඇවිල්ලා. කුස්සියට ගිහින් හොඳ කොච්චි ගුලියක් ඇඹරුවාලු.හෙමින් ගිහින් මේ මිරිස් ගුලිය ළඟ තිබුණ කළුගල් තලාවේ හැමතැනම ගෑවලු.අතනින් මෙතනින් කුරුඳුපොලු කීපයකුත් තැබුවලු. ඒ ළඟින්ම තැඹිලි ගෙඩි

කීපයකුත් කපලා බාගෙට කට ඇරලා තියලා ගෙදර ආවලු. වඳුරෝ හිතලා අද අපිට ගස් යන්න ඕනෑ නැහැ, තැඹිලි තියෙන්නේ අර ගලේ කියලා එතැනට පැනලා තැඹිලි බොන්න පටන් ගත්තලු. වඳුරෝ තැඹිලි බොන කොට දන්නවා නේ - වතුර ඉහිරවාගෙන. අනේ දෙයියනේ, කළුගලේ තිබුණු මිරිස් දියවෙලා වඳුරන්ගේ පසුපස දැවිල්ල අරන්. උන් ගත්තලු කුරුඳු පොලු අතට. ගැහුවලු අනික් එකාට. වඳුරෝ එක එකා දැවිල්ලේ ඔලු පලා ගෙන විනාශ වුණාලු.

50. දවසක් තමුන්ට ගෙදර බල්ලගෙන් කරදර නිසා නෝනගේ ඉල්ලීමට බල්ලව අරගෙන ගිහිල්ල කැලේකට දාලා ආපහු එන්න බලද්දී මිනිහට ගිය පාර අමතක වෙලා.පස්සේ රවුම් ගහලා ගහලා පාර හොයා ගන්න බැරි වෙනකොට මිනිහා දැකලා තියෙනවා බල්ලා දුවනවා කැළේ මැදින්.පස්සේ බල්ලාගේ පස්සෙන් දුවලා තමා ගෙදරට යන පාර හොයාගෙන තියෙන්නේ.

51. ඉස්සර අවිස්සාවේල්ලේ කොන්ත්‍රාත් කරන හොර තක්කඩි කෙනෙක් හිටියා එයාට කියන්නේ 'මැටි මාස්ටර්' කියලා. මැටියෙන් බිත්ති හදලා, ඒ මැටි බිත්ති මත සිමෙන්ති කපරාරු කරනවා.

52. අන්තිමටම කෙල්ලන්ට ලියුම් ලිවුවෙ අපේ පරපුරේ අය. ඒ **1990** මුල් භාගයේ. දැන් මොබයිල් ෆෝන්, ෆේස්බුක්, ඉන්ස්ටර්ග්‍රෑම්, OKCupid, **RSVP.......**

53. සමහර රටවලදී මිය ගිය චීනා වෙනුවෙන් වෙනත් කෙනෙකු ජීවත් වනවා , මිය ගිය චීනා වසන් කර වලලා හෝ පුච්චා දමලා.

54. එක්තරා ප්‍රදේශයක විශාල ගඟක් තිබුණා. මේ ගමේ ජීවත්වූ අයට ගඟෙන් එගොඩ පිහිටි නගරයට යාමට පාලමක් පිහිටා තිබුණේ නැහැ. පහසුකම් අඩු දුෂ්කර ගමක්. එම ගඟ තරණය කිරීම සඳහා ඔරුවක් දමා තිබුණා. එම ඔරුවෙ තොටියා ලෙස කටයුතුකලේ කොලු ගැටයෙක්. ඔහුගේ දිනචාර්යාව වූයේ මේ පැමිණෙන මිනිසුන්ව එගොඩ මෙගොඩ කිරීමයි.ඒ උපයාගන්න මුදලින් ඔහු අහිංසක ලෙස ජීවත්වුවා. දිනක් මෙම ගමේ පාසැලේ රැකියාව සඳහා පැමිණි ගුරුවරුන් තිදෙනෙක් නගරයට යාම සඳහා පැමිණියා. මෙම ගුරුවරුන් මෑතකදී ගුරුවෘත්තියට ඇතුලත්වූ තරුණයන් තිදෙනෙක්. ඔවුන් නිතරම විහිළුතහළුවෙන් තමයි තම ජීවිතය ගතකලේ. පාසැලේදීත් ළමුන්ට ඉගුන්වූයේ කුමක්හෝ විහිළුවක් කරලයි. එක් අයෙක් ඉංග්‍රීසි ගුරුවරයෙක්. අනෙක් අය ගණිත ගුරුවරයා. තුන්වැන්නා විද්‍යා ගුරුතුමා. මෙ තිදෙනාද සුපුරුදු පරිදි ගඟෙන් එගොඩවීම සඳහා ඔරුවට නැග්ගා. තරුණ කොලුගැටයාද සිනහවක් පා තම ඔරුව පැදගෙන ගියා. එදිනට පෙර දින වැසිදිනයක් වූ හෙයින් මෙදින ගඟේ වතුර

පාර සැඩපාර ඉතා දැඩිවපැවතුනා. මෙසේ යන අතර එක් ගුරුවරයෙක් මෙම කොලුගැටයාට විහිළුවක් කිරීමට සිතා මෙසේ විමසුවා. ළමයෝ ඔය ළමයා ඉංග්‍රීසි ඉගෙනගෙන තියෙනවාද? එවිට එම කොලුවා අනේ මහත්යෝ මම දන්න ඉංගීසියක් නෑ. මම දන්නේ මෙ ඔරුව පදින්න විතරයි යනුවෙන් පිලිතුරු දුන්නා. එවිට ගුරුතුමා අයියෝ ළමයෝ ඔය ළමයාගේ ජීවිතෙන් කාලක්ම ඉවරයැයි පිළිතුරු දෙමින් සිනහවෙන්න පටන් ගත්තා. එවිට අනෙක් තරුණ ගුරු ළමයෝ ඔය ළමයා විද්‍යාව සම්බන්ධව මොනවාද දන්නේ යනුවෙන් විමසුවා. එවිට පෙර ලෙසම කොලුවා අනේ මහත්තයෝ මම දන්නේ මෙ ඔරුවෙන් මිනිසුන්ව එගොඩ මොගොඩ කරන්න විතරයි යනුවෙන් පිළිතුරු දුන්නා. එවිට ගුරුවරයා අයියෝ ළමයෝ ඔය ළමයාගේ ජීවිතෙන් භාගයක්ම ඉවරයිකියා පැවසුවා. එවිට අනෙක්ගුරුවරයා ළමයෝ ඔය ළමයා ගණිතය සම්බන්ධව මොනවාද දන්නේ යනුවෙන් විමසුවා. පෙර ලෙසම මෙම කොලු ගැටයා පිළිතුරු දුන්නා. එවිට ගුරුතුමා මෙසේ පැවසුවා අයියෝ ළමයෝ ඔයළමයාගේ ජීවිතෙන් තුන්කාලක්ම ඉවරයි. මෙ අයුරින් විශ්වවිද්‍යාලයේ මෙන් මෙ ළමයාට රැග්එකක් දෙමින් මෙම ගුරුවරුන් තිදෙනා සිනා සිසී සතුටින් විනෝදයෙන් ඔරුවේ යන අතර දැන් ඔරුව ගග මැදට පැමිණ තිබුනා. වතුරපාරද සැරයි. ඔරුව හසුරුවා ගැනීමට කොලුවා සෑහෙන උත්සහයක් දරනවා. නමුත් සැඩපහර නිසා ඔරුව එකතැන කැරකෙමින් තිබුණා. කෙසේ වෙතත් සුලියකට හසුවී ඔරුව ගිලෙන්නට යන බව කොලුවාට හැගුණා. එවිට කොලුවා මෙ පංඩිත ගුරුවරුන්

තිදෙනාගෙන් මෙසේ ප්‍රශ්න කළා. මහත්තයෝ මහත්තයලට පීනන්න පුළුවන්ද කියා. එවිට ඒ තුන්දෙනාම බයේ ගැහෙමින් අනේ ළමයෝ අපි පීනන්නම් දන්නේ නැහැ. අපිට ස්විමින් දන්නේ නැහැ යනුවෙන් පවසනවාත් සමගම ඔරුව ගිලෙන්න පටන් ගත්තා. එවිට කොලුවා මෙසේ පවසමින් මගේ ජීවිතේ තුන්කාලක්ම ඉවරයි, මහත්තයලගේ ජීවිතේ සම්පූර්ණයෙන්ම ඉවරයි යනුවෙන් පවසා එගොඩට පීහිනුවා.

55. කුඩම්මාගේ ගිනිගෙඩි නිසා මිය ගීය අහිංසක  තාත්තා ගැන සිතින් වැලපුනු   දුවකට  කුඩම්මාව  ක්‍රමයෙන් එපා උනා; ඒත් ඒ බව කුඩම්මාට  දැක්වුවේ නැහැ. වෙන කාටවත් සිද්ධිය කිව්වෙත් නැහැ.  දුව මානසිකව වින්ද වේදනාව/අසහනය අපමණයි. දෙන්නම තවම එක වහල යට ඉන්නවා. කුඩම්මා දන්නවා දුව ඔක්කොම දන්නා බව.

56. 'තාත්තා මට කැඩිච්ච වලං කැල්ලක් හොයලා දෙන්න' 'මොකටද පුත්? 'එතකොට මම ලොකු වුනාම තාත්තට එකේ කන්න දුන්නහැකි. ඇයි පුතා මට වලන් කැල්ලක කන්න දෙන්න හිතන්නේ? ඇයි දැන් මේ ගෙදර අය ආත්තාම්මට කන්න දෙන්නේ එහෙමනේ'.

57. ලංකාවේ ව්‍යාපාරය බලාගන්න දුන්න මිනිහා ලක්ෂ 120 ක් ගිල්ලා, සහෝදර කමත් නැතිවුණා , දෙවැනි පාර බාරගත්ත මිනිහ ලක්ෂ 15 ගිල්ලා , මම මිනී මරාගන්නේ නැතිව

ලංකාවෙන් ආවා , ලංකාව ලෝකෙන්ම තියෙන හොඳම රටක්, සමහර මිනිස්සු ගේ ඔලු මකල ගත්තොත්.

58.මගේ ඔෆිස් එකේ වැඩකරපු සේවයෙන් අස් කරපු පියන් කෙනෙක් අපිට ඉතා හිතවත් උනා. ගෙදර පොඩි පොඩි වැඩපල මිනිහා කරලා දුන්නා. ගෙදර වැඩ කාරයෝ නැති නිසා දවසක් මම මිනිහගෙන් ඇහුවා අපට ගෙදර වැඩට කෙනෙක් හොයලා දෙන්න පුලුවන්ද කියලා. 'හා' කියලා, ඉරිදා දවසක මට එන්ඩ කියලා ඇඩ්රස් එක දුන්නා. හද්ද පිටිසර පලාතක්, අපිට (මමයි මගේ ඥාති සොහොයුරායි) යන්න තිබුනේ කඳු, හෙල් තරණය කරගෙන බොහෝ දුර පයින්ම. අන්තිමට කොහොමහරි ඒ ගෙදර සොයා ගෙන ගියා. දුප්පත් මැටි ගහපු ගෙයක්, හැබැයි පිරිසිඳුවට තියාගෙන තිබුනා. අපිව බොහොම ආදරයෙන් වතුර විදුරු දීලා පිළිගත් පියන් ආගිය විස්තර කථා කළා. මම ඇහුවා 'කෝ ඒ වැඩට ගැනු කෙනා ඉන්නවද කියලා'. 'ඔවු ඔවු ඉන්නවා' කියලා, 'ආ මහත්තයා යන්න' කියලා අපිව ඇතුලේ කාමරයකට එක්කන් ගියා. කාමරය ඇතුලේ හිටියේ අංග විකල - කකුල් දෙකම පෝලියෝ කාන්තාවක්. මාව දැක්කහම ඒ යුවතිය ලජ්ජාවෙන් ඇඳේ අනිත් පැත්තට හැරුනා. මට කරගන්න දෙයක් තිබුනේ නැහැ. බැලුවහම පියන්ගේ නංගි. මම කිවා 'බොහොම ස්තුතියි; ඒත් මෙයාව අපට හරි යන්නේ නැහැ; ආ මෙන්න බෙහෙත් අරං දෙන්න' කියා රුපියල් 2000ක්ද ඔහු අත තියා මල්ලි සමඟ මම ඉක්මන් පියවරින් ඒ ගෙදරින් පිටත්ව, කන්ද බැස අපේ

ගෙදර බලා ආවා. බස් එකේදී මල්ලි කිවා එක්කෝ ඒ මිනිහා හොඳ මිනිහෙක් නංගිට උදවු හොයන, නැත්නම් නංගිගේ අසනීපේ පෙන්නලා සල්ලි හම්බකරන ජාවාරම් කාරයෙක් කියලා.

59. ලොකු අක්කා මට හරි හිතවත්, කිට්ටුවෙන්ම හිටියේ. මහ ගෙදර එයාගේ නමට ලියාගත්ත දවසේ ඉඳලා මාව මඟ හරිනවා, කතාවට එන්නේ නැහැ.එයාට එයාගේ දරුවලු මතක් වෙන්නේ - ඔස්ට්‍රියාවේ ඉන්න දරුවා ලංකාවට ආවහම ඉන්න ගෙයක් ඕන කියන එක පමණයි එයාට පෙන්නේ.

60. සහෝදරයෝ තිදෙනෙක් තම අන්ධ මවගේ උපන් දිනයට ත්‍යාග දුන්නා. පළමුවැන්න විශාල ලස්සන ගෙයක්ද, දෙවැන්නා වටිනා සුඛෝපභෝගී මෝටර් රථයක්ද, තුන්වැන්නා කුකුලෙක්ද දුන්නා. පසු දවසක ඔවුන් සියලු දෙනාම රැස්වූ විට අම්මාගෙන් ඇහුවා ඇය වැඩියෙන්ම කැමති වූ තෑග්ග මොකක්ද කියා. ඇය කිවා තුන්වෙනි පුතාගේ තෑග්ග, ඒ කුකුල් මස් නම් හරි රහයි කියා

61. හොංකොං ගුවන් තොටුපොළේ පාර්කින් එකේ වාහනේ දලා ලංකාවට ආවා සතියකට. ලංකාවේ වැඩ ඉවර කරලා හොංකොං ඇවිල්ල කෝච්චියෙන් ගෙදර අවා. මගේ බිරිද වාහනේ කොහෙද කියලා අහනකම් දන්නේ නැහැ , හිතුවේ වාහනේ ගෙදර කියලා.

62. අම්මා ඉස්පිරිතාලෙට ඇතුල් කරපු දවසේ හවස  මහා පාලු මුසල ගතියකින් ගෙදර  පිරීලා තිබුනා. කොච්චර ලයිට් දැම්මත් ගෙදර අඳුර මකන්න බැරි උනා. තාත්තා එදා කොච්චර අසරණ උනාද? අනේ කාටවත් එහෙම දුකක් නම් නොදැනෙවා.

63. දිය නාන රෙද්දත් එක්ක ලේදර් හැන්ඩ් බෑග් එකයි අඩි උස සපත්තුයි, ඇඳුම් ගොඩකුයි අරගෙන කෙනෙක්  ලිඳ ලඟට යනවා නාන්න.  ලඟට ගිහින් ඇහුවහම කියනවා ‘අක්කේ නාලා ඇඳගෙන එහෙමම කොළඹ බස් එකේ මාවනැල්ලේ යනවා හදිසියකට; දිය රෙද්ද අක්කලාගේ වැලේ වනලා, කමක් නෑනේ’ කියලා.

64. පානදුරේ නල්ලුරුවේ අපේ ලේන් එකේ රට පිළිගත් ලොකුම සල්ලි කාරයෙක් මැරුන වෙලේ සල්ලි දීලාඅඬන්න මිනිස්සු ගෙනාවා මීගමුවෙන්.

65. බෝඩිම රන් කරන ඒ කාන්තාවට  මම නාන දිහා බාත්රූම් එකේ ජනේලෙන් බැලුනේ වැරදීමකින්. එයාට එදායින් පස්සේ මගේ මුහුණ බලන්න බැහැ. මාව දැක්කහම ලැජ්ජාවේ බිම බලා ගැහෙනවා, හරියට ලොකු වරදක් කළා වගේ. මට  නම් සිද්ධිය කිසි ගානක් නැහැ. පස්සේ මම සතියක් නෝටිස් දීලා වෙන බෝඩිමකට ගියා.

66. අපේ පවුලේ 9කි. මම බාලයා.මා කුඩා කල වයස 2 දී,තාත්තා ක්ෂණික කෝපය මත අපේ අම්මාට පිහියෙන්

ඇන මරා දමා තියෙනවා.  අපේ නෑදෑයෝ ටික ළමයි ටික බෙදා ගත්තලු. නමුත් මෙයාලා අපිව තියාගෙන තියෙන්නේ වැඩකාරයෝ විදිහට.  මට මතකයි අවුරුද 10දි මාව අරං හදා ගත්ත මාමාගේ ගෙදරින් මම පැනලා යනවා. සල්ලි නැතුව කොළඹ ග්‍රෑන්ඩ්පාස් එකේ සේයින්ස්තාන් හෝල් එක ගාව බිම ඩෝලේ දාගෙන ගගහා සින්දු කිවුවා. තොටළඟ නානා කෙනෙක් මාව අරන් හදා ගත්තේ. අද මා උසස් තැනක් දරනවා; දරු මුනුපුරෝ ඉන්නවා. පහු කලක අපේ තාත්තා හිරෙන් නිදහස් වී අපේ සහ සහෝදරයන්ගේ ගෙවල් වලට බීගෙන ඇවිත් කෑ ගසා ලැජ්ජා කළ වාර අනන්තයි. අපි නම් පුළුවන් විදියට එයාව බලා ගත්තා; ලොකු අයියා පොල්ලක් අරගෙන තාත්තා පස්සේ පන්නලා තියෙනවා ගහන්න.  තාත්තා රෝහලකදී මිය ගියා, ග්‍රාම සේවක රෝහලට ඇඩ්මිට් කරලා තිබුනේ.  අප පවුලේ 9 දෙනාම මේ වන විට ඉතා හොද ජීවිත ගත කරතනවා; තාත්තා ගැන කවුරුවත් කතා කරන්නේ නැහැ. තාත්තාට ගහපු, තාත්තගේ මළ ගමටවත් නොආපු අයියා මහා ගේ ලියා ගත්තා.

67. අපේ මාමා කෙනෙක්  වත්තල හේමාස්  හොස්පිටල් එකේදී රු 2ට විතර පන ගිහින් තියෙන්නේ. මාස ගණනක් දුක් වින්දා ඒ හොද මාමා. මැරිච්ච දා රෑ පවුලේ කවුරුවත් ඇඳ වටේ ඉදලා නෑ. එයා තට්ට තනියම රෝහල් කාමරේ මිය ගියා. ගෙදර ලියා ගත්ත, පවුලේ ලොකු දුව රට ඉඳන් ඇවිත් හිටියා, ඒත් පන යන තැන ඉදලා නැහැ. කවුරුවත්ම

ඥාතියෙක් ළඟ ඉඳලා නැහැ, මාමා තනියෙම රෝහලේ ඇඳේදී පන ගිහින් තියන්නේ.  ඇටෙන්ඩන්ට් කෙනෙක්වත් ළඟ හිටියද? ඒ ගෙදර අය රෑ ගෙදර කෝපි බී බී රෑ බර කථාවකලු. ඉස්පිරිතාලෙන් ෆෝන් කරලා කිව්වාට පස්සේ පහුවෙනිදා උදේ මිනිය මහබාගේ රේමන්ඩ් එකට කෙළින්ම භාර දීලා, එදාම හවස භූමිදානය කරලා. දැන් දානයක්වත් හරියට දෙන්නේ නැහැ.

68.මගේ අක්කා  AL කරන කාලෙත් දිය රෙද්ද ඇඳලා ගඟට බැස නැවේ. පීනලා නානකොට දිය රෙද්ද ඇඟටම ඇලිලා. ඒත් ගමේ කිසි කෙනෙක් නරක විදියට බැලුවේ, කිව්වේ නැහැ.  අපිට පාරේ වතුර හෝ ළිං වතුර තිබුනේ නැහැ.

69.එක ඉහල මධ්‍යම පාන්තික මහත්මයෙක් මිය ගියා. නෝනා කළු ඇඳගෙන කාමරයෙන් එලියට බහින්නේ නැතුව හිටියා.මහත්තයා මැරුණු බව දැනගෙන ණයකාරයෙක් ගෙදරට ආවා.වැඩකාරයා කිව්වා නෝනා එලියට එන්නේ නැහැ වෙන දවසක එන්න කියලා .ණයකාරයා කිව්වා නෝනට එන්න කියාපන් කියලා .කොල්ලා බයෙන් බයෙන් ගිහිල්ලා නෝනට කිව්වා .නෝනා එලියට අවේම නැහැ. ණයකාරයට කේන්ති ගිහිල්ලා කිව්වා මම අද යන්නේ නැහැ කියලා සෙටියේ වාඩි උනා. බැරිම තැන නෝනා එලියට ආවා .ණයකාරයා කියනවා කළු ඇඳගෙන හිටියට තොල් සායම් පවුඩර් ගාන්න නම් අමතක වෙලා නැහැ කියලා. උසාවි ගෙනියනවා කියලා තර්ජනය කලාම ණය ටික ඔක්කොම ගෙව්වා පොලීත් එක්ක.

70. විනිශ්චයකාරතුමා චූදිතයාගෙන් ඇහුවා දඬුවම් නියම කිරීමට කලින් කියන්න යමක් ඇද්ද කියා. චූදිතයා කියනවා - 'ස්වාමිනි සුමානයක් තුල විශාල හොරකම් 5ක් මං කළා. මං වගේ අනිත් මිනිස්සුත් උනන්දු වෙලා වැඩ කරනවානම් මේ රට හරි දියුණු වේවි කියා. ඔහුගේ ඒ ප්‍රකාශය නිසා ඔහුගේ දඬුවම් දෙගුණයක් වුනා.

71. දවසකට නෙළුම් මල් 7,000 ඕඩර බාරගන්න අම්මෙක් ඉන්නවා අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය ළඟ. මෙයා කියනවා වැඳලා අයින් කරන නෙලුම් මල් ගෙනල්ලා සමහර අය මල් රේණු ගලවලා, වේලලා සිංහල බෙහෙත් බඩු කඩවලට විකුණනවාලු. මල් රේණු කිලෝ එකක් රුපියල් පන්සියයක් විතර වෙනවාලු. පූජා කරලා අයින් කරන පොල් පැළ සමහර කපු මහත්තුරු ගොවිතැන් කරන අයට දෙනවාලු (විකුනනවලු). හැබැයි එයා නම් පූජා කරපු මල් කවදාවත් ආයෙත් ගෙනල්ලා විකුණන්නේ නැතැයි කියා ශපත කලා. පූජා කරපු නෙළුම්/මානෙල් මල්, පොල්පැල නැවත විකිණීම දැරිය නොහැකි මහා පාප කර්මයක් බවයි ඇය කියන්නේ.

72. දේවාලේ කපු මහත්තයා ඇහුවාලු ඇයි පූජාවට්ටියට ලාවලු තිබ්බේ නැත්තේ කියලා. මිනිහා අහලා ඇයි කපු මහත්තයෝ දෙවියෝ ලාවලු කන්න කැමතිද කියා. 'නෑ මගේ නෝනා කැමතියි' කියාලා කපු මහත්තයාට කිය වුනාලු.

73. මිනිසා අවු 70ක් සැපවත්ව ඉඳ, එතැන් පටන් නාටු හරකා සේ අනුන්ට බරක් වී ජිවත් වෙයි  දරුවන් වෙනුවෙන් අවු 80 වෙනකම්, බල්ලා සේ ගෙවල් මුර කරයි දරු මුණුබුරු බිරියන් සමගින් , අන්තිම කාලය ඇවිද ගන්නත් බැරිව ගෙයි අඳුරු මුල්ලක ඇඳක වැතිර අසන කියන හැම දෙකකට ඇස් කරක කරකවා බෙල්ල විතරක් හරව හරවා හැමදේටම හ්ම්,හ්ම් කියමින් ජිවත් වෙන්න වෙයි. තාත්තේ බෙහෙත් බොන්න, හ්ම්.... තාත්තේ ගිහින් එන්නම් හ්ම්..හ්ම්.

74. ‘මාදින්නාගොඩ මුදලාලි, කැම ටික නම් හරි පංකාදුයි, ඔහේගේ ගෙදරම හදපුවනේ කියලා ඉන්ස්පෙක්ටර් මහත්තයා කියනවා. ‘ඉන්ස්පෙක්ටර් මහත්තයා,  ඔයා ඔය අද කැවේ මිනි මස් ‘කියලා මුදලාලි අවඥයාවෙන් සිනා සුනා. දෙන්න අතර පරණ විරසකය ඉන්ස්පෙක්ටර් මහත්තයට මතක් උනේ එවෙලෙයි.

75. මගේ මාමා මේ  රටේ හිටපු ප්‍රසිද්ධ චිත්‍රපට අධ්‍යක්ෂක වරයෙක්, චිත්‍රපට ගොඩාක් හදපු මෙයා එක චිත්‍රපටයක් වැඩ පටන් ගන්න ඉස්සර නැකත් බලලා චාරිත්‍ර වාරිත්‍ර කලේ නැහැ. ඇන්ටි හොඳටම බය වෙලා කවුරුවත් කරන්නේ නැති වැඩක් කළා. එයා රීගල් හෝල් එකේ තිබ්බ මුහුරත් උත්සවය නැකත් අනුව කළා, හාමුදුරුවරුත් වඩම්මලා. එදා ඇවිල්ල හිටිය නළු නිලියෝ මැති ඇමතිවරුන්ට සිද්දධ උනා මේකප් අස්සේ පැදුරුවල වාඩිවෙලා  අත්වල පිරිත්

නූල් බැඳ ගන්න. පිල්ම් එක සියලු ආදායම් වාර්තා අභිබවා ගියා.

76. අවුරුදු 5 කට ඉස්සෙල්ල ලොකු අක්කා ගෙයක් කිසිම නැකතක් බලන්නේ නැතුව හදන්න හැදුවා, බාස්ලා දෙන්නෙක් වැඩ බාර ගන්න කැමති උනේ නැහැ, පස්සේ මැලේ කොන්ත්‍රාත් බාස් කෙනෙක් අල්ලලා නැකැත් නැතුව වැඩේ කරගත්තා.

77. ඔන්න පහුදිය දවසක මම ගියා දේශනයක් අහන්න. මහා තර්ක විතර්ක ගොඩක්. මිනිස්සුන්ට ලංකාවේ ඕනැම තැනක ජීවත් වෙන්න පුලුවන්ලු. එතකොට උතුරේ පරම්පරා ගානක් හිටපු සිංහලයෝ උතුරට ආපසු යන්නේ නැද්ද කියලා ඇහුවහම හ්ම් නැහැ. හෙට තවක් රැස්වීමක්. බලමු හෙට මොකද මේ අය කියන්නේ?

78. ගොඩාක් කොලඹ කාක්කෝ ගම්වලින් ආරම්භ වෙලා කොළඹ ආපු උන්, කොටන්නේ කොළඹ හොඳ මොළවලට.

79. නැකත් නැතුව ගේ හැදුවා, කිසි අඩුවක් වුනේ නැහැ. නමුත් දැන් ටෝයිලට් වල වෙනස් කරන්න වෙලා. හස්බන්ඩ් මට බනිනවා නැකත් නොබලපු හින්දලු.

80. වයිෆ්ගෙන් වෙන්වෙලා සිටිය මම රත්තරන් මඟුල් මුද්ද හිර නිසා රෑට ගලවලයි නිදා ගන්නේ කාමරේ මෙසේ උඩින් තියලා. රෑ පහන් ගත කරන්න ආපු යාළුවා පාන්දර ටොයිලට් යන ගමන් (මගේ කාමරේ ඇතුලෙන් යන්න තියෙන්නේ) අර මුද්ද දැකලා ඉස්සුවා. උදේ පාන්දර සිටන් මමත් මුද්ද නෑ කියලා සුසුම්ලමින් කෑ ගහනවා.  මම දන්නවා මෙයා ගත්තා. අන්තිම සල්ලි අමාරුවෙන් මිනිහා හිටියේ (දැනුත් ඉන්නේ). හැබැයි තීන්ත කුඩුව වගේ සාන්ත දාන්ත කථා මාත් එක්ක. තාම අපි හොඳ යාළුවෝ, හැබැයි මම දැන් ගොඩක් පරිස්සෙමින්.

81. මහ මුදලිගේ වත්තේ පොල් හොරකමක් වෙනවලු. මේක නවත්තන්න මහමුදලි ගමේ මිනිස්සුන්ට කිව්වලු. මුරකාරයෝ දැම්මලු එත් හරි ගියේ  නැහැල්ලු. මේ පොල් හොරකම් කරන්නේ ගමේ ගැහැනුලු. ඉතින් බැරිම තැන කාන්තාවෝ පොල් හොරකම් කරන්න ආපු වෙලාවේ ඇගේ නූල් පොටක්වත් නැතුව මහ මුදලි වත්තේ අවිදිනවලු. ගෑණු පන එපා කියල දිව්වලු ආයේ පළාතේ ආවේ නැහැල්ලු. ඉතින් මහමුදලි කියලත් අහපු නැති වැඩේ ලැජ්ජා නැතිකම හින්දා දිගටම කෙරුනලු. ඊට පස්සෙලු ඔය ‘ලජ්ජා නැතිකම මහ මුදලි කමටත් වඩා ලොකුයි' කියන්නේ.  කට කහනවට නොවෙයිනෙ.

82. මගේ යාලුවා  කුලියට හිටපු ගෙදර මීයන්ගෙන් හරිම කරදර නිසා මිනිහගේ බිරිඳ කියා සිටියේ වෙන ගෙයක් බලමු යනුවෙනි. යාලුවා කියනවලු මොන පිස්සුද, මීයෝ අල්ලන

එක සුළු වැඩක්නේ කියලා ගෙදර කොලුවාව කඩේට යැව්වේ මී කතුරක් අරගෙන එන්නට. කඩේට ගිය කොලුවා ගෙදර ආවේ කඩේ මී කතුරු නැති බව කියමිනි. පසුව යාලුවා පාරෙන් පූසෙක් අල්ලා ගෙනවිත් ඇතිකළා.

83. මේ කතාව මීට අවුරුදු 20කට විතර උඩදී වුණු දෙයක්. මම එතකොට හිටියේ කිරිබත්ගොඩ.කඩවත මුදලාලි කෙනෙකුගේ පුතෙක් කඩවත හිටි ලස්සන ගැහැණු ළමයෙක් සමග යාළුවෙලා ඉදලා තිබෙනවා. කොහොමහරි දෙන්නා අතරේ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අවසානයේ කෙල්ලව මරලා ගෙදර වත්තේම වළදාලා.පොලිසියෙන් කොහොම හරි මිනීමැරුම ගැන හොයලා විස්තර හොයාගෙන. ගමේ මිනිස්සුන්ට මේක ආරංචි වෙලා අර මුදලාලිගේ ගෙදරට ගිනි තියලා ලොකු විනාශයක් කළා. ඒක බලන්න මමත් ගියා. පිච්චිච ගෙදර මුදලාලි බිත්තියේ ලියලා තිබෙනවා ' අද කළයුතු වැඩේ අදම කරන්න' කියලා. කවුදෝ අර වාක්‍යට යටින් ලියලා ගිහිල්ලා තිබුණා 'ඕන් කළා' කියලා.

84. 1977 විතර දෙමටගොඩ සමන්තා හෝල් එක ඉස්සරහා ටයර් කඩයක් සම්පූර්ණයෙන්ම ගිනිබත් උනා. පාඩුව කෝටි ගානක්ලු. පස්සේ දැනගන්න ලැබුනා ඕන කමින් කඩේ අයිති කාරයෝ ගින්න කරලා තියෙන්නේ, ඉන්ෂුවරන්ස් ක්ලේම් එක ගන්න.

85. කැලණිය පැත්තේ කැළණි ගඟට මුහුණලා ලස්සන හෝටලයක් අයිති කාරයෙක් හිටි හැටියේ ඝාතනය කළා. හැමෝම කතා කළා, මරණේ ගැන. පස්සේ බැලින්නම් පුතාලු වැඩේ දීලා තියෙන්නේ.

86. අපේ කර්මාන්ත ශාලාවේ කෙල්ලෙක් අම්මා මැරුනා කියලා. එකතු කරපු සල්ලිත් අරන් ගියා. අපි ඉතින් හවස වැඩ ඉවර වෙලා කට්ටිය එක්ක මල් වඩමකුත් අරගෙන කර්මාන්ත ශාලාවේ වාහනෙන් මහා රෑ බෙන්තර ඉදන් කතරගමටත් එහා ගියා. අනේ අම්මා අඬා ගෙන දුවගෙන අවා අපි ගාවට දුව මැරිලා කියලා හිතාගෙන. බලන කොට කෙල්ල පැනල ගිහින් කොල්ලෙක් එක්ක.

87. අපේ ගෙවල් පැත්තෙත් ඉස්සර සීයා කෙනෙක් හිටියා. මෙයා හැම වෙලේම අනිත් අය කරන දෙයි මොකක් හරි වැරද්දක් දකිනවා. එයා හැම වෙලේම කියනවා එයා දන්නා සාස්තරේ පොත් පත් වලින් ගන්න බැහැ කියලා. එයා කවදාවත් දොස්තර කෙනෙක් ලගට ගිහින් නැහැ කියල කියනවා. කොහොම උනත් මේ සීයා අවරුදු 100 කට වඩා ජීවත් උනා.

88. අපේ ආතා හරි සල්ලි කාරයා, හැම තැනම ඉඩ කඩම්. බස් කොමපැනියකුත් අයිතිව තිබුනා. මැරෙන්න ඉස්සරින්දා රෑ 12ට විතර ආතා තනිවම පිළියන්දල වත්තේ මායිම වටේටම ඇවිදලා තියෙනවා. කවදාවත් කරන්නේ නැති වැඩක්.

89. රැකියාවට යන දියණියගේ දාන්ගලේ ගැන ලැබුණු ආරංචිය අනුව ඇගේ මව සිටියේ හිත කලබලෙන්. දිනක් එම මව දියණියද කැටිව ගියේ දොස්තර කෙනෙක් ලවා දියණියගේ මුත්‍රා පරීක්ෂණයක් කරගැනීමටය. පරීක්ෂණය අවසානෙදි දොස්තරවරයා එම දියණියට කීවේ ඔයාට සුභ ආරංචියක් තියෙනවා කියන්න. ඔයා අම්මා කෙනෙක් වෙන්න යනවා යනුවෙනි. එවිට දියණිය පැවසුවේ අනේ ඩොක්ටර් මම තවම විවහා වෙලා නැහැ යනුවෙනි. එවිට දොස්තර වරයා කියා සිටියේ එහෙනම් ඉතින් මේක ඔයාට අසුභ ආරංචියක් යනුවෙනි.දුව කිවා නෑ ඩොක්ටර් මම ඒත් ගොඩාක් සතුටුයි ආරංචියට කියලා; අම්මගේ මූණ පුංචි වෙලා, කළු වෙලා තිබුනා.

90. දවසක් මම බෝම්බ එහෙම පිපිරෙන කාලේ පිටකොටුවේ බස් එකෙන් බහිනකොට දැක්ක හොඳ වටිනා ෆෝන් එකක් සීට් එකක් උඩ තියනවා.අයිතිකාරයා දාලා ගිහින්.මට ගන්නත් ලැජ්ජයි. ඕක අරගෙන අයිතිකාරයා හොයන කොට මිනිහා හිතයි මම හොරකං කරලා කියලා. අනික් එක බෝම්බ බයත් තියනවා.ඕන දෙයක් කියල අරගෙන කොන්දොස්තරට කිව්වා මේක කවුරුහරි දාලා ගිහිල්ල හොයාගෙන අවොත් දෙන්න කියල. පස්සේ හොයලා බලනකොට මිනිහා ඒක පොලිසියට දීලා අයිතිකාරයව පොලිසියෙන් හොයලා දීලා. මට නිහඬ සන්තෝෂයක් ආවා.

91. ගුණතුංග විජේසිංහ එකල රටේ හිටපු ප්‍රසිද්ධ ලේඛකයෙක්. ඉරිදා පත්‍රයේ කතුවරයා ඔහුගේ ලිපි පල කලේ ජී විජේසිංහ කියා. මේකට උරණ වූ ලේඛකයා කතුවරයාව පත්‍රය අයිතිකාර මහතාට පැමිණිලි කළා. පත්‍රය අයිතිකාරයා කතුවරයාගෙන් ඉල්වා සිටියා මීට පසු එසේ ඔහුගේ නම පල කරන්න එපා කියා. හා කිවූ කතුවරයා ඊට පසු සුමානේ ඔහුගේ ලිපි පල කලේ ගූ විජේසිංහ කියා.

92. මහියංගනේ පැත්තේ ගියා නිවාඩුවකට. කැලේ පැත්තේ ඇවිදිනකොට ගැමියෙක් බෙනයක වේයෝ කන්න ආව තලගොයෙක් වලිගෙන් අල්ලාගෙන අදිනවා. මිනිහා හැඩි දැඩි කෙනෙක්. නමුත් තල ගොයා එන්නේ නැහැ, තදින්ම බෙනේ අතුලට වෙලා ඉන්නවා. මිනිස්සු 4 -5ක් ඇවිල්ලා එකා පස්සේ එකා ඉඳලා අදිනවා, තලගොයා නෙවයි හෙල්ලුනේවත්. පස්සේ මිනිස්සු පෝලිම 10ක් පමණ උනා, තලගොයා නෙවෙයි හෙලවුනේවත්. මෝඩ පාහේ මිනිහෙක් ඇවිල්ලා ඉනේ තිබුන පිහිය දිග ඇරලා තලගොයාගේ වලිගෙ තුඩ කපලා හුණු ගෑවා. සුරුස් ගාලා තලගොයා එලියට ආවා. ඌව හමගහගෙන මිනිස්සු පුළුස්සලා කෑවා.

93. තලගොයා බෙනේ ඇතුලේ වේයෝ කනවා ගැමියෙක් දැක්කා. දුවලා ගිහින් තලගොයා අල්ලන්න හදනකොට ඌ බෙනේට රිංගුවා. මිනිහා කොල්ලෙක් එක්ක එකතුවෙලා

බෙනේ ඇතුලට දුම් ගැහුවා. බෙනේ ඇතුලේ හිටිය තලගොයෝ 12ක් විතර එලියට ගත්තා.

94. යාලුවෙකුගේ ගෙදර ලඟින් යන කොට මහා පුදුම කෑම උයන සුවඳක් ආවා. මිනිහාත් ඇතුලට ගියා. ගියාහම කිව්වා කෑම කාලා යන්න ඉන්න කියලා. මිනිහාත් හිටියා තලු මර මර. හිතුවේ කුකුල් මස් කියලා. බැලින්නම් උයලා තියෙන්නේ ඉබි මස්. දැනගත්තට පස්සේ ගෙදර ගිහින් පැය ගානක් වමනේ දැම්මා.

95. දරුවෙක් අයිස්ක්‍රීම් වෙළඳ සැලට පැමිණියා. 'ලොකු අයිස්ක්‍රීම් එකක් කීයද?' 'රු150 යි' වේටර්වරයා කීය. 'ඊළග සයිස් එක කීයද?' '120' යි. මට දෙන්න 120 එකක්. ඔහු බිල ගෙවා අසුනේ වාඩිවී අයිස්ක්‍රීම් එක කෑවා.වේටර් මේසය පිරිසිදු කිරීමට පැමිණි විට දුටුවේ රු 30 ක ටිප් එකක් තබා ගොස් ඇති බවයි.

96. බීපු පුරුෂයෙක් කලුවරේ නිදිමතේ ටොයිලට් ගිහින් වැඩේ නිමකර නැවත ඇවිත් නිදියා ගත්තා. උදේ බැලින්නම් දා ගෙන හිටපු දත් සෙට් එක නැහැ. හොයනකොට තමයි මතක් උනේ රෑ ටොයිලට් එකේදී මොකක්ද ටොක් ගලා වතුරට වැටෙන සද්දයක් ඇහුනා නේද කියලා. ඒක වල වැසිකිලියක් නිසා බොරු දත් කුට්ටම සදා කල්ම වල ඇතුලේ තැන්පත් වී ඇත.

97. ඇත පිටිසර ගමක කිතුල් මදින්නෙක් හේනක් කොටාගෙන කඳු මුදුනක ජීවත් වුනා. එහෙට පිටස්තරයෝ යන්නෙම නැති තරම්. මේ මිනිහා තම බිරිඳව හැම විටම සැක කළා. මේ බව දත් කොල්ලෝ ගමෙන් සිගරට් කොට අහුලාගෙන ඒ ගෙදර මිදුලට හොරෙන්ම දාලා එනවා. අපි පොඩි නිසා ගියාට ගණන් ගන්නේ නෑ. ඒවා දකින මෝඩ මනුස්සයා බිරිඳට ගහනවා බනිනවා. 'ඇත්ත කියපිය මොකාද මන් නැති වෙලාවේ මෙහෙ ඇවිත් සිගරට් බීපු එකා' කියලා. ඉවසන්න බැරිම තැන හොඳට හිටපු ගෑනී වෙන මිනිහෙක් එක්ක පැනලා ගියා.

98. හිසකෙස් ගැළවී වැටීම ගැන දුකින් සිටි අම්මා කෙනෙක් ෆාමසියේ දැන්වීමක් දැක බෙහෙත් මිලදී ගත්තා. නමුත්. බෙහෙත් වලින් කිසිදු ප්‍රතිපලයක් නොලැබීම නිසා බේත් සාප්පුව වෙත පැමිණ බැන වැදුනා. ‘බොරුවට කියනවා හිසකෙස් එනවා කියලා, මම බෙහෙත් බෝතල් 4ක් පාවිච්චි කළා, කිසි ගුණයක් නැහැ, තිබ්බච්ච කෙස් ටිකත් ගියා. ‘වෙන්න බෑ අනිත් ගත්ත හැමෝටම හරි ගියානේ’ කියා ෆාමසිස්ට් කිවා. ඇත්තද, එහෙනම් දෙන්න තව බෝතලයක්, ඒකත් බිලා බලන්නම් කියා ඇය කිවා. අම්මේ මේවා බොන බේත් නොවෙයි, හිසේ ගාන ඒවා කියා ෆාමසිස්ට් කිවා.

99. මේක් අප් වලට පුරුදු වූ ලඳක් කොනේ කඩේට යන්නත් මේක් අප් ඕනා. එයා මේක් අප් වලට වහල් වෙලා. පස්සේ පස්සේ ගෙදර බෙල් එක ගැහුවහම දොර අරින්න යන්නෙත්

මෙක අප් දාගෙන. ලියුම් කාරයා එහෙම බලන් ඉඳලා ඉඳලා ගිහින් තියෙනවා.

100. තඩි මහත මිනිහෙක් සිනමා ශාලාවේ විවේකයේදී සිය බිරිඳ සමඟ බාර් එකට යාම සඳහා එලියට යාමේදී ඔහු ඉඳගෙන සිටි සිට් පේලියේ කෙලර්වරේ සීට් එකේ මිනිහාගේ කකුල තදින් පාගා, ඔහුට 'සොරි' ද නොකියා එලියට ගියා. ඒ කකුල පෑගිච්ච මිනිහාට තරු විසි උනා. නැවතත් විවේකය ඉවරවී කකුල පෑගුව තඩි මහතා මිනිහා ශාලාවේ සිය සිට් එක වෙත සිය බිරිඳ සමඟ ආපසු එනවිට ශාලාව කළුවරයි. මිනිහාට සිය සීට් පේලිය සොයා ගත නොහැකිව, හැම සිට් එකේම වගේ කෙලවරේ වාඩිවී ඉන්න මිනිහාගෙන් අහනවා, ඔයාගේ කකුලද මම පාගන් ගියේ කියා. අන්තිමට පෑගුනු මිනිසාගෙන් ඇහුවහම, ඔහු ඔවු කිවූ පසු එම තඩි මහතා මිනිහා සිය බිරිඳ සමග ගොස් නිවැරදි සිට් එකේ වාදී වුනා. නමුත් ඒ අවස්ථාවේ වත් ඔහු 'සොරි' හෝ 'තැනක් යු' කියා නම් කිවේ නැහැ.

101. කොළඹ ලේඩිස් කොලේජ් හෝල් එකේ විවිධ ප්‍රසංගයකට ගියා. මුළු පැය 2 ½ම මට එහායින් හිටපු මිනිහා සිගරේට් බි බි දුම් පිට කලේ උවමනාවෙන්ම මගේ මූනට. එදා තරම් දුම් වැටි වලින් බැටකෑ තවත් දිනයක් නැහැ. තාත්තාගේ කොම්පැනියේ සම ඩිරෙක්ටර් කෙනෙක් නිසා ඉවසගෙන හිටියා. සිද්ධිය තාත්තත් දැක්කා, නොදන්නවා වගේ හිටියා.

102. දරුවෙක් අපයෝජනය කල වැඩිහිටියෙක් පොලිසියේදී වරද ඒ දරුවා පිට පටවන්න හදලා.

103. දවසක් මම නාරාහේන්පිට මාක්ෆෙඩ් එකේ ඉදන් එද්දී පාරේ සෙල් ෆෝන් එකක් වැටිලා තිබුනා. ඒ එක්කම බයික් එකක් ආපහු ඇවිත් ඒක අරන් ගියා. ඒ සමඟම තවත් බයික් එකක් ඇවිත් ඇහුවා ෆෝන් එකක් වැටිලා තිබුනද කියලා. මම හොඳටම ෆෝන් එක දැක්ක හින්ද මම ඇහුව 'සිල්වර් පාට එකක් නේද, මේ දැන් බයික් එකක එක්කෙනෙක් අරගත්තා ඉක්මනට ගිහින් ඉල්ලගන්න' කියලා . මේ මනුස්සයා කියනවා ඔයා නේද ඒක ගත්තේ කියලා, මගෙන් ෆෝන් එක ඉල්ලනවා. අන්තිමට මාර ප්‍රශ්නයක් ඇතිවෙන්න ගිහින් බේරුනා. පස්සේ ආරංචි උනා හවස බයික් දෙකම ටච්මේ බාර් එකේ ගහලා තිබුනා කියලා.

104. කිරිබොන අත දරුවෙකුට පළඳවා තිබූ රත්රන් මුද්ද මොනවා හරි හේතුවක් නිසා නැති උනා. මාපියෝ ගෙයි අස්සක් මුල්ලක් නෑර සොයා බලා නැති තැන පේන කරුවකුගේ කීම පිට අසල්වාසීන් සමඟ රණ්ඩු කළා මුද්ද හොරකම් කල බවට චෝදනා කරමින්. කලක් ගත වුනා මෙහෙම. හදිසියේම දරුවා අසනීප උනා. වෛද්‍යවරු දරුවාට නියුමෝනියාවට බෙහෙත් කළා. අසනීපය උග්‍ර වුනා. වැඩිදුර පරීක්ෂණ වලදී හොයාගත්තා දරුවාගේ ස්වාසනාලයේ ලෝහමය යමක් හිරවී ඇති බව. එය ඉවත් කිරීමේදී දරුවා මිය ගියා.

105. පොඩි කොමිස් එකක් තියාගෙන විදේශ මුදල් හුවමාරු කරමින් නගරයේ වීදියක උදේ සිට සවස ඇදිරි වැටීගෙන එනතුරු ස්වයං රැකියාවක යෙදෙන මැදිවිය ඉක්මවූ කාන්තවක් පවුම් දහයක් පහළොවක් විතර බර රන් මාලයක් කරේ දාගෙන ඉන්නවා දැකලා, 'බය නැද්ද මාල කඩන හොරුන්ට' කියලා ඇසුවාම පිළිතුරක් දුන්නා. 'මාලේ කවුරු හරි කඩයි කියලා බයට තමයි මාලේ පැළඳගෙන ඉන්නේ' කියලා. එහෙ මෙහෙ යන්න හිතෙන ආශාව යටපත් වී ඉක්මණට නිවස කරා පය ඔසවන්න පොළඹවන එක ඇතිකර ගන්නලු වටිනා රන් මාලේ පැළඳීමේ අරමුණ.

106. කලකට පෙර මඟුල් ගෙදරකදී මගේ බත්පතේ සිගරට් කොටයක් තිබුණා. ඒ මඟුල් උත්සවය මා යටතේ සේවය කළ කෙනෙකුගෙයි. ඔහුගේත් කෑම ඉවූ අයගෙත් නම්බුව තියන්න මම අද වෙනතුරු මේ සිද්ධිය කා එක්කවත් කිව්වේ නැහැ. ඒක දැකපු ගමන්ම කෑම නවත්වලා; 'මට ටිකක් වැඩියි වගේ' කියලා නැගිටලා ගියා.

107. වසර කිහිපයකට පෙර බටහිර යුරෝපයේ මහා නගරයක විසූ මහලු යුවලක් වාහනය එම නගරයේ නැවතුම්පොලෙහි නවත්වා කඩේ ගොස් ආපසු පැමිණ බැලුවිට වාහනය අතුරුදහන් වෙලා. පසුව වාහනය නැතිවූ බවට රක්ෂණ වන්දි ගෙන අලුත් වාහනයක් ලබාගෙන එම වෙළඳ සංකීර්නයටම ගිය විට ඔවුන්ගේ පරණ කාරය දකින්න ලබුනාලු. එවිටයි ඔවුන්ට මතක් වී ඇත්තේ එදා

වාහනය නැවැත්වූ තැන ඔවුන්ට අමතක වීමෙන් සොයාගැනීමට බැරි උනා මිසක් වාහනය කව්රුවත් හොරකම් කරලා නැති බව. මේ පුවතේ විශේෂත්වය නම් පැය දෙකක කාලයකට නැවත්වීමට අවසර ඇති නැවතුමේ මාසයක් නවත්වලා තිබිලත් දඩයක් නොලැබීම කියලයි ඒ රටේ මාධ්‍ය වල පලවුනේ.

108. එකම පුතා මැරිච්ච දවසේ මම ඇන්ඩුවේ නැහැ, දුක පෙන්නුවේ නැහැ. එත් ඒ දරාගන්න බැරි දුක තාම තියෙනවා හැමදාම, මම විතරයි දන්නේ වේදනාව. අනිත් හැමෝටම පුතාව අමතකවෙලා වගේ, කවුරුවත් එයා ගැන කථා කරන්නේ නැහැ.

109. මම දන්නා විදුහල්පති කෙනෙක් හිටියා. නෝනා එක්ක ටවුමට යනවා. ගෙදර ආවහම ළමයි අම්මා කෝ කියලා ඇහුවමලු නෝනාව මතක් වෙන්නේ.

110. ‘කමක් නැහැ මුදලාලි මාමේ. අයින්ස්ටයින් මාමටත් ඔය අමතක වෙන ලෙඩේ තිබුනනේ’.

111. ඉබ්බෝ වලක් හදාගෙන දිනපතා ඉබ්බෝ කාපු මනුසයෙක් හිටියා. අන්තිමේ වයසට යන්න ඉස්සර ලෙඩ වෙලා රෝහල් ගිහින් ප්‍රතිකාර කරන්න ගියාම ඉන්ජෙක්ෂන් ගහන්න බැරි වුණ ඇඟේ මස් තද නිසා.

112. කුරුලෑ මැකිලා ලස්සන වෙන්න කියලා මුහුණේ සිද්ධාලේප ගාපු යාලුවෙක් හිටියා. මුණ දාන්නා අරගෙන අයිස් වතුර බාල්දියක ඔබාගෙන හිටියා පැය ½ ක්.

113. අපි දන්නා අගුටුමිට්ටෙක් ඉන්නවා මිනිහා වැඩ කරන්නේ බිල්ඩිමේ 23 තට්ටුවේ. මිනිහා හැමදාම වැඩට යන්නේ 20 වෙනි තට්ටුවට නැගලා, ඉතුරු ටික තරප්පු පෙළ නැගලා පයින්. යාළුවො හිතලා එක්සර්සයිස් එකට කියල. මොකද කියලා දවසක් නිකමට ඇහුවහම කියනවා මට ලිෆ්ට් එකේ උස තියෙන්නේ 20 වැනි බොත්තම තද කරන්න විතරයි කියලා.

114. වැලේ වනා තිබුණු මගේ මිත්‍රයා ඔහුගේ පිරිමි යට ඇඳුම ඉක්මනට ඇඳගෙන කලිසමත් ඊට උඩින් දාගෙන එළියට බැස්සා.නමුත් මීටර් පනහක් විතර යනකොට ඔහුගේ ඇඟ කන්න පටන් ගත්තා. ඔහු මරු විකලෙන් නැවත ගෙදරටම දිව්වා. බැලුවහම කළු කඩී රැලක් ඇතුලේ.

115. මම මැදපෙරදිග ඉන්න කොට ඉංග්ලිෂ් හොඳට දන්නා මලයාසියා ජාතිකයින් දෙදෙනක් කවදාවත් ඉංග්‍රීසියෙන් කතා කරන්නෙ නැහැ . ඔවුන් මැලේ භාෂාව කතා කරන්නේ. නමුත් සිංහල දෙදෙනක් ඉංග්ලිෂ් කතා කරන කොට ඒගොල්ලෝ අහනවා, ඔය දෙන්නගෙන් කාට හරි සිංහල බැරිද කියලා.

116. මගේ අම්මාට නත්තලට පිටරටින් බඩු පෙට්ටි 2ක් එකම සතිය ඇතුලත එවලා තිබුනා. අක්කා මැද පෙරදිග ඉඳන් එවපු පෙට්ටියී තිබුනේ හාල්, සිනි, කඩල පරිප්පු, කිරිපිටි, සබන් කුඩු, එනසාල්, කරාබු නැටි ආහාරයට් ගන්න තෙල් වර්ග,රට ඉඳි, ගිනිපෙට්ටි,ඉටි පන්දම්, සබන්. මම මෙල්බෝර්න් වල ඉඳන් එවපු පෙට්ටියේ තිබුනේ විවිධ චොකලට්, රසකැවිලි වර්ග, බ්ලැක් බෙරී කෝර්ඩියල්, මුද්දරප්පලම්, ඇපල් ජූස්, ස්කීම් මිල්ක්, චීස් පෙට්ටි, පාස්ටා, ස්පැර්ගටී, ටුනා ටින්, වෙජිමයිට්, පැනඩෝල් සහ පෙන්ලයිට් බැටරි වගේ දේවල්.

117. පොලිසියේ සමහර මහත්තුරු රාජකාරිය අකුරට වැඩිය කරනවා. ඒකනේ ත්‍රී විල් කාරයෝ, මෝටර් ස්යිකල් කාරයෝ, බස් ඩ්‍රයිවර්ලා හැමතිස්සෙම දඩ කොළ ගෙවන්න පෝලිමේ ඉන්නේ. ප්‍රාඩෝ, මොන්ටෙරෝ කාරයෙක් හරි BMW වගේ සල්ලිකාර වාහනයක් හරි, දේශපාලනඥයෙක් දැක්කහම දඩ කොළ කෙසේ වෙතත් දෙකට නැමෙනවා විතරක් නෙවේ, සමහර මන්ත්‍රීලා වගේ අය දැක්කම ඉබේටම සැලියුට් පාරකුත් වගේ ගැහෙනවා.

118. මගේ පියාණන්ට අධික රුධිර පීඩනයට බෙහෙත් ගත්තා. ෆාමසියේ බෙහෙත් දෙන කෙනා මිලි ග්‍රෑම් 50 පෙති දීල. මට එක වරක් දුන්නු ගමන් වැටහුනා බෙහෙත් සැර වැඩියි කියල වහාම ප්‍රතිකාර නවත්වලා බෙහෙත් ටිකත් අරන් වෛද්‍යවරයා හමුවීමට ගියා. එතුමා ලියා තියෙන්නේ

මිලි ග්‍රෑම් 5යි. ෆාමසියෙන් දුන්නේ 50. වාසනාවට ජීවිතේ බේරුනේ. මම ඉක්මනින් ක්‍රියාත්මක වුන නිසා තාත්තාගේ ජීවිතය බේරුනා.

119. එක්තරා රජයේ රෝහලකින් බෙහෙත් අරන් ආවා. බේත් ටික දෙන තාලෙන්ම මට තේරුනා වැරදි බෙහෙත් තමා මෙයා දෙන්නේ කියලා. හිතුවත් වගේ හරියටම හරි චෙක් කරලා බලපුවහාම.

120. අපේ නිවස අසල හිටියා රෙමානිස් කියලා හොඳ මේසන් වැඩ දන්න කෙනෙක්. අපේ අම්මලා රෙමානියා කියලා කිව්වේ. මිනිහා වැඩ වෙලාවට නිතරම කණත් හිසකෙසුත් අතර හිඩැසේ පෑන සහ බිඩියක් රැඳවීම පුරුද්දක් කරගෙන හිටියා, දැන් මිනිහා ලොකු සල්ලිකාරයෙක්. මේ ළඟදි දවසක මංගල උත්සවයකට ගාල්ලේ ලොකු හෝටලයකට ගිහින් තියෙන්නෙත් අර පරණ පුරුද්දට පෑනයි බිඩියයි කනේ ගහගෙනලු.

121. අඹ යාලුවෝ දෙන්නෙක් කාලෙකට හමුවුණාම කරන්න තියෙන අනිත් වැඩ හැමදේම අමතක වෙනවා.

122. දවසක් ඇස් පෙනීම අඩු සීයා කෙනෙක් වීදුරුව වහල තියෙද්දී කෙල ගහල බස්එක ඇතුලේ හිටපු කීප දෙනෙක් නැවිලා ගිහිල්ලා.

123. දැන් අවුරුදු 4 කට ඉස්සර මම සම්මුඛ පරීක්ෂණයක් සඳහා පිලිවෙලකට ඇඳගෙන මෝටර් සයිකලයෙන් යමින් සිටින විට,පනාගොඩ වංගුවේදී නවත්වලා තියපු බස් එකක රියදුරෙක් ගැහුවා බුලත්කෙල පාරක් කෙලින්ම කොටු කොටු ක්‍රීම් ෂර්ට් එකට.

124. දවසක් මමත් පෝය දවසක සෝමාවතී යන්න කියල සුදු ඇඳගෙන නෙළුම් මල් කඩාගෙන පාරට ආවා. පාරේ ගිය බස් එකේ හිටිය මනුස්සයෙක් ගහපු සේම මිශ්‍ර  කෙල වලට මගේ ඇඳුමයි, මල් ටිකයි ඔක්කොම විනාශ උනා.

125. මම අතීතයේ දිනක පලාලි සිට රත්මලාන දක්වා ගුවන් මගින් ඒමට ගුවන් යානයට ගොඩවූ පසු  ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ සෙබල සොයුරන් අතර සිටි පොලිස් සැරයන්වරයෙක් සාක්කුවේ තිබී අතට ගත් පාර්සලයක් දිගහරිමින් ටිකින් ටික හපමින් උජාරුවෙන් සිටියා. යානය ගුවන්ගතවී ටික වෙලාවකින් කටපුරා පිරුනු බුලත් කෙළ ඉවත දැමීමට වටපිට බැලුවත් කෙළ ගැසීමට තැනක් නොවූයෙන් අවසානයේ මහත් අමාරුවෙන් කෙළ ගිලීමෙන් පසු දාඩිය පෙරාගෙන අපහසුතාවයට පත් වූනා. හැබැයි ඉදිරිපස අසුන්වල හිටි අයගේ සානුකම්පිත බැල්මට ඔහු ලක් වුනා.

126. රේන්කෝට් දාගෙන මහා වැස්සේත් දඩ කොළ ලියන පොලිස් නිලධාරියෙක් අපේ වසමේ ඉන්නවා. එලෝ එලෝ ලියන මිනිහාගෙන් අපට විසුමක් නැහැ.

127. සමහර අය ඉන්නවා යමකට අත ගැහුවොත් ඒක අළු ධූවිලි කරලා දානාවා, එවැනි අය සමඟ හවුල් වැඩ හොඳ නැහැ.

128. පොඩි කාලේ අම්මා සමග බස් එකක යද්දී මට වූ දෙයක් තාමත් මතකයි. ඒ වෙලාවේ බස් එක ටිකකට නවත්වලා තිබුනේ. ඉස්සරහ ආසනයේ හිටි කෙනෙක් එකපාරට කෙළ ගැහුවා. මම ඉතින් පොඩිකමට ජනේලෙන් එබිලා බැලුවා පහළ. ඒක එතන හිටි ගෑනු කෙනෙකුගේ ඔලුවටම වැටිලා. මගේ දිහා බලලා ඔරවල නිකන් හිටියා මම පොඩි නිසා. අනේ ඉතින් මට කියාගන්න තේරෙන්නේ නැති නිසා පාඩුවේ හිටියා. හැබැයි, ඒකෙන් මම ඉගෙන ගත්තා පාරට කෙළ ගහන එකේ ආනිසංස.

129. මගේ තාත්තගේ පරණ රතු පාට 2ශ්‍රී ෆොක්ස්වැගන් එක්ක තල්ලු කරලා හරි ස්ටාර්ට් කර ගත්තහම අලුත් ජපන් වාහන කැලේ.

130. තාත්තාට හොඳට මිකැනික් වැඩ පුළුවන්. ඉරිදාට කාර් එක යට රිංග ගෙන ආයුධ වලින් ජාමෙට වැඩ, ඔක්කොම රෙපයාර් එයාම කර ගන්නවා. හැබැයි අම්මා කියන්නේ තාත්තාට මුකුත් බැහැ කියලා.

131. අපේ ගෙදර එන අංකල් කෙනෙක් හිටියා. එයාගේ කළු දුම් දමමින් දුවන දැවැන්ත හම්බර් රියට අප කීවේ භූමිතෙල් කුමාරි කියාලා. මොකද පෙට්‍රල්, භූමිතෙල් කලාවන් කරලා අංකල් කාර් එක දිවුවේ.

132. මගෙ යාලුවෙක් ඉන්නව ගොඩාක් වෙලා දත් මදින කෙනෙක්. දවසක් මිනිහ දත් මැද මද ඉන්නකොට මම පොඩි උදව්වක් ඉල්ලුව. මිනිහ බුරුසුව ජනෙල් පඩිය උඩින් තියල ආව මට උදව් කරන්න. ටිකකින් ආපහු බුරුසුව අරන් මදින්න පටන් ගත්ත. හිටපු ගමන් කැගහලා බුරුසුව විසි කරල කට හෝදන්න දිව්ව. බලනකොට මිනිහ බුරුසුව තිව්ව වෙලේ හූනෙක් ඉඳ ගෙන චූත් පේස්ට් කාලා ජරා කරලා දුවලා, බලන්නෙ නැතිව අපහු මදින කොට අමුතු රසක් එද්දි තමයි බලල තියෙන්නේ.

133. අවේලාවට රෝහලට ඇතුල් වෙන්න නම් ගේට්ටුවේ ටයිටස් අයියට පොඩි සන්තෝසමක් දෙන්නම් ඕනා, රුපියල් 20ක් දුන්නනම් ඇති, ටක් ගාලා ගේට්ටුව අරිනවා. හරි හිත හොඳ මිනිහා. හැමදාම දුවගේ අසනීප තත්ත්වය ගැන ඇහුවා.

134. පොඩි දුව හම්බුවෙච්ච වෙලාවේ හිතේ තිබුණු කරදර කොහේ ගියාද කියලා නැහැ. සති දෙකක් නිවාඩු දාලා පොඩි දුව බලා ගත්තා. වයිෆ් එයාලගේ මහගෙදර ගිහිල්ලා; එයාට දරුවෙක් නැති ගානයි.

135. සුද්දෙක් මොකද්දෝ මල් පැලයක් දැකල කීයද කියලා ඇහුවලු. අයිතිකාරයා රුපියල් දාහයි කියලා. මල් පාත්තියෙන් පැලේ ගලවලා දෙන්න යනකොට නෑ නෑ ඕක නෙමෙයි මේක කියල නිදිකුම්බා ගහක් පෙන්නුවලු. .අයිතිකාරයා දැනගත්තලු සුද්දාව අන්දවන්න පුළුවන් කියලා. ආ ඒකනම් පන්දාහයි කිව්වලු. සුද්දා අරන් ගියාලු. නිදිකුම්බා ගහට අත තියපු ගමන් නින්ද යන නිසා සුද්ද හොල්මන් වෙලා ආසා හිතිලා.

136. අලුත් ඇමතිතුමා වෘත්තිය සමිති හමු උනා – 'රජයේ සේවය හරියට කරනවානම් 1500 නෙමෙයි ඔයාලා ඉල්ලන 12500ම දෙන්නම්. කොහෙද සේවකයෝ එන්නේ 9ට. ලොක්කෝ එන්නේ 10ට. ඊළගට තේ. පත්තර බලනවා, දිවා ආහාරයට පැයක්, ඊට පස්සේ මේසෙට ඔලුව තියාගෙන නිදි. පැය අටෙන් හතකරක්ම අපතේ නේ' එතුමා කිවා. පහුවදා වෘත්තිය සමිති ඔක්කොම ස්ට්‍රයික්ලු ඇත්ත කියපු ඇමතිතුමාව ඉවත් කරන්න කියලා. මාරාන්තික උපවාසයකුත් පටන් ගන්න යනවලු.

137. 'බලන්න මේ තැපැල් කන්තෝරුව , මෙහෙම මිනිස්සුන්ට පෝලිමෙන් පනින්න දෙනවනම් කොහොමද මේක ආසියාවේ ආශ්වර්ය වෙන්නේ. එතන, තැපැල් ස්ථානාධිතුමාට හොඳටම පේනවනේ වයසක ආච්චිලා, සියාලා අමාරුවෙන් හිටගෙන ඉන්න පෝලිමට හැඩි පිරිමි ඇවිල්ලා පෝලිමෙන් පැනලා ඇවිල්ලා තමන්ගේ රාජකාරි කරගෙන යන හැටි'.

138. මගේ අයියා ලංකාවේ ඉන්ජිනියර්, ඕස්ත්‍රේලියාවේ ගිහින් කාර් හෝදනවා පාර අතුගානවා. මගේ අක්කා 8 පාස්, එයා මැද පෙරදිග උයනවා සුල්තාන්ට. මගේ පොඩි අයියා ලංකාවේ දොස්තර, අද කැනඩාවේ කොන් දෙකේම දොස්තර. මම ලංකාවේ 10 පාස් - පොලේ කොස්, කොහිල විකුණනවා, අම්මා උදේට පන් මල්ල අරං ටෙනිසන් වලව්වේ උයන්න යනවා, වැඩිම සතුටින් ඉන්නේ අම්මා, ඊළඟට මම, ඊළඟට අක්කා.

139. ඕස්ත්‍රේලියාවේ මං දන්නා මහත්තයෙක්, ඉංග්‍රීසි විදියට ඉන්නේ. එයාගේ නෝනා කිවුවා මහත්තයා නාන කොට හයයියෙන් ස්තෝත්‍ර කියනවා කියලා, මටත් හරි සතුටු යි. අනේ ලංකාවට එනකොට ස්තෝත්‍ර කෙසේ වෙතත් එයාට සිංහල භාෂාව, සිරිත් විරිත් මුකුත්ම බෑ. සිංහල ගොත ගාගහා කතා කරන්නේ. මිනිහා සැලකීම ලබා ගන්නේ එහෙමලු.

140. පිටිසර කෙනෙකුට කකුල්වල ප්‍රමාණයට ගැළපෙන සෙරෙප්පු දෙකක් කඩයකින් සාදවාගන්නට සිත් වී පා සටහන් කොළයකට ඇදගෙන දෙකට තුනට නවා ඇඳසිටි කමිස සාක්කුවේ දමා ගත්තේය. නගරයට යන දිනයේ වෙනත් කමිසයක් ඇඳ දුරුකතර ගෙවා නගරයට පැමිණ සෙරෙප්පු කඩේ ළඟදි බැලූවිට අමතක වී ආ බව වැටහුනා. ළඟ කඩයකින් තේ එකක් ඉක්මනට බී නැවත ගෙදර ගොස් පා සටහන් ඇඳී කොළයත් රැගෙන නගරයට ආවත් සවස් වී සෙරෙප්පු කඩේ වසා තිබුණ හෙයින් අසළ තේ කඩයට නැවත ගොස් තේ එකක්

බොන්න වාඩිවී ඉන්නා විට එහි සේවකයෙකු 'ඇයි දෙවැනි වරටත් ගිහින් ආවේ' යනුවෙන් කරුනු විමසුවා. 'පා සටහන් කොළය ගෙනෙන්න ගෙදරම යන්න ඕනැද? සෙරෙප්පු කඩෙන් හෝ අපෙන් හෝ කොළයක් පෑනක් ඉල්ලාගෙන පා සටහනක් ඇඳගන්න තිබුනානේ' කියද්දී, ඔහු කියා ඇත්තේ 'ඒ ගත් මිම්ම ෂුවර් නිසා , තව ඒවා අනවශ්‍ය බවයි'.

141. ගේ වටේටම සී.සී.ටී.වී.කැමරා සවිකරගෙන වැරදි වැඩ කරපු කෙනෙක් පොලිසියෙන් අල්ලාගෙන ගිය අයුරු තමන්ටම පසුව බලාගන්න පුළුවන් වුනා අපේ ගෙවල් පැත්තේ.

142. සුපිරි වෙළඳ සලකට රැකියාවට පැමිණි තරුණයාව උණුසුම් ලෙස පිළිගත් කළමනාකරු පලවෙනි රාජකාරියලෙස පොලව අතු ගෑම සදහා කොස්ස අතට දුනි. ඇයි මේ මම උපාධි ධාරියෙක් තරුණයා අමනාපයෙන් පිළිතුරු දුනි . ආ මම දැනගෙන හිටියේ. සමාවෙන්න. කමක් නැහැ, දෙන්න කොස්ස, මම කරන්නම් කියා මැනේජර් කිවා.

143. අපි කම්කරු රස්සා කලත් උගත් බුද්ධිමතුන්. දොස්තරලා, ඉංජිනේරුවන් එක්ක හැප්පිලා දිනන්න පුළුවන්. කොරියාවේදී මම කොරියන් ඉගෙන ගත්තේ මාස 3න්. ලංකාවේ ලෝයර් මහත්තෙක් හිටියා අවුරුදු 3ක් ගිහින් තාම කොරියන් බෑ.

144. මම මගේ දොස්තර හමුවෙන්න ගියා. වෛද්‍යවරයා මගේ හදවතයි මොළයයි, නාඩියි ඔක්කොම බලලා 'හොඳටම

හොඳයි' කියා කිව්වා . එතුමා ඇහුවා වයස හැත්තැවක් වෙලත් මෙහෙම නිරෝගී වීමේ රහස . මම කිව්වා සැමවිටම සතුටින් සිටීම, බනින අයටත් මෛත්‍රී කරුණාව දැක්වීම, ඊර්ශ්‍යා නොකිරීම, ලද දෙයින් සතුටු වීම සහ දිනපතා ව්‍යායාම කිරීම කියලා. එතුමා ඒක ලියාගත්තා. මං ඇහුවා ඇයි ලියුවේ කියලා. එතුමා කිවා මීට පස්සේ මගේ ළඟට එන ලෙඩ්ඩුන්ට 'ප්‍රේස්ක්‍රයිබ්' කරන්න කියලා.

145. කොළඹ ඉහල පෙලේ ත්‍රීවිල් මුදලාලි කෙනෙක් මගේ මාමා, එක දවසේ ත්‍රිවිල් 10ක් ගත්තා වෙන්දේසියෙන්.

146. එක තරුණයෙක් ගේ ඉස්සරහ පිට එයාගේ බයිසිකලේ නවත්තල තිබුනා. පහුවෙනිදා උදේ බලන කොට ඒක එතැන නැහැ. හැමතැනම හෙව්වා හමුවුනේ නැහැ. දවල් වෙනකොට මෙන්න තියෙනවා මිදුලේම. පොඩි ලියුම් කෑල්ලක් තිබුනා ගැටගහලා. ඊ ළඟ ඉරිදා හවස නගරයට ඇවිත් තිබුන අලුත්ම චිත්‍රපටිය බලන්න යන්න ටිකට් දෙකකුයි, 'මගේ දරුවා හදිසියේ රෝහලට රැගෙන යාමට ඔබේ බයිසිකලය අනවසරයෙන් ගෙනි යන්න වුනාට සමාවෙන්න. මේ ඒකට සුළු තෑග්ගක්' කියලා ඒ තුන්ඩු කෑල්ලයි. තරුණයා සමාජයට හොඳ කියා කියා නියමිත දවසේ බිරිඳත් සමග චිත්‍රපටිය බලන්න ගියා. ආපහු ගෙදර එනකොට බය්සිකලේ ඉඳන් මුළු ගේම සුද්දකරලා.

147. තම බිරිඳව සිගරේට් එකෙන් පුච්චන මිනිහෙක් අපේ ගමේ හිටියා. බිරිඳගේ ඇඟ පුරාම පිළිස්සුම් තුවාල. දවසක් ගමේ මිනිස්සු මිනිහාව අල්ලලා ගස් බැඳලා හොඳට පොල්ලකින් ගහලා පොලිසියට භාර දුන්නා . ඒ ලස්සන කාන්තාව එදායින් පසු බියක් නැතිව ජීවත් උනා.

148. ලංකාවේ ප්‍රධානම පෙලේ නුර්ති ශිල්පියෙකුට රාජ්‍ය සම්මාන පිරිනමන උත්සවයකට අපේ තාත්තාටත් ආරාධනා ලැබිලා මාවත් අඩගහගෙන ගියා කොලඹ රාජකියේ නවරඟහලට. මිනිහා රට පමණක් නොව ලොව පිළිගත් නැට්ටුවෙක්. උඩරට පළාතේ අමු ගැමියෙක්. සවස උත්සවය මහා ජයට පැවතුනා, රාජ්‍ය නායක, විදේශ තානාපති මැදිහතින්. උත්සවයෙන් පස්සේ තාත්තා ඒ ළඟ ගෙදරකට ගිහින් රෑ 10ට විතර කාරය තර්ස්ටන් පාරේ පදවාගෙන යනකොට මද වැස්සේ ආර්ය සිංහල ඇඳුම් ඇඳි තඩි මිනිහෙක් දුඹුරු පාට සූට් කේස් එකක් එක අතකින් අරං හයියෙන් හයියෙන් පයින් යනවා මම දැක්කා. ‘තාත්තේ අන්න අර ගුරුන්නාන්සේ’ කියලා මට කියවුනා, තාත්තාත් එකවරම බ්‍රේක් ගහලා කාර් එක සයිඩ් එකෙන් නැවැත්තුවා. ඇත්ත නේන්නම් මේ අර රාජ්‍ය සම්මාන ලබපු ගුරුන්නාන්සේනේ. තාත්තා කාරය නවත්තලා බොහොම ගරු සරු ඇතිව එතුමාට කතා කලාම දැනගත්තේ රෑ බස් නැති නිසා එතුමා පයින්ම ඥාතියෙක්ගේ ගෙදර ගාටන බවත්, පහුවෙදා උදේ පාන්දර බස් එකෙන් නුවර බලා යන බවත්. අර හම්බවෙච්ච සම්මාන සමහරක්; අනේ එක අතක, රාජ්‍ය නායකයා දීපු සමරුවත් ඒ අතේ. අනික්වා සූට්කේස් එකේ දමලා. තාත්තා එතුමාව

කිරුලපනේ ඒ ගෙදරටම ගිහින් ඇරලුවා. බැලුවහම ඥාතියෙක් නොවෙයි බෝඩිමක්, එයා කොළඹ ආවහම ඉන්න. මම හිතන්නේ එදා සම්මාමන උළෙලට ආපු සිය ගණනකින් එය ඉවර වෙලා බස් නැතිව රෑ පයින් ගෙදර ගිය එකම පුද්ගලයා එතුමා පමණයි. ඒ දවස්වල ත්‍රී වීලර්ස් තිබුනේ නැහැ. පස්සේ තාත්තා කියලා කවුද සිද්ධිය දිවයින පත්තරේට ලියලා තිබුනා, සම්පූර්ණ සිද්ධියම නොවේ.

149. මා වැඩකරන ස්ථානයේ ලංකාවේ කෙනෙක් නිවාඩුවට ගොස් නැවත සෞදියට පැමිණියා. මෙහි දවල් කෙම වෙලාව දවල් 11 සිට 1දක්වාය. මේ නිවාඩු ගිහින් ආපු කෙනා 10.30 ට දූව ගෙන යන විට මම ඇහුව කොහෙද දූවන්නේ කියල. ඔහු කිව්වා ‘දෙන වෙලාව’ 1.00යි කියල. එයාගේ ඔරලෝසුවේ තවම ලංකාවේ වෙලාව තිබුනේ. ලංකාවේ 1.00 කියන්නේ සෞදියේ 10.30. එය දූවපු වෙලාවටත් පස්සේ පැ බාගයකින් පිනට දෙන්න පටන් ගන්නේ. කොච්චර කිවුවත් තේරුනේ නැහැ රටවල් දෙකේ වෙලාවල් දෙකක් කියලා.

150. මම දූර පලාතක මහේස්ත්‍රාත් උසාවියක නඩුවක සාක්කි දෙන්න ගිහින් ඉන්න කොට මිනිහෙක් උසාවියේ නඩුව අසද්දී තරප්පුවක් ගෙනවිත් බිත්තියේ ගහලා තිබුන ඔරලෝසුව ගලෝගන ගිහිල්ලා. තරප්පුව අල්ලනත් මිනිහෙක් ඉඳලා. කවුරුවත් ගණන් අරන් නැහැ රෙපයාර් ජොබ් එකක් කියලා. පස්සේ දැන ගන්න ලැබුනේ හොරකමක් කරලා තියෙන්නේ කියලා, නඩුව අහද්දී, උසාවියේ සිය ගණනක් සෙනග.

151. 1950 - 60 ගණන්වල කොළඹ ඉස්කෝල බොහොමයක් ඇරුනේ 230ට. ඉතින් ළමයිට සහ ටීචර්ලාට දවල් කෑම ගෙවල් වලින් හදලා විදුරු පිගන් වල බෙදලා තව විදුරු පිඟානකින් වහලා, පිරිසිඳු සර්වියෙට් එකකින් බැඳලා දෙනවා බයිසිකල් කාරයන්ට ගෙනිහින් භාර දෙන්න. ඒ බයිසිකල් වල ලොකු ලී රැක් හයි කරලා තියෙනවා, කෑම පිඟන් සියයකට වැඩිය උනත් ගෙනි යන්න පුළුවන්. රෝයල් ප්‍රයිමරියේ කෑම බයිසිකල් සේවය පාලනය කලේ අපේ ඥාතියෙක්. එයා රෝයල් එකේ මිස් කෙනෙක්. වෙනම කෑම කාමරයක ලස්සනට ඒ පිගන් අඩුක්කු කරලා තියෙනවා, අයිති කාරයින්ට ඇවිත් ඒවා ගෙනි යන්න. කෑම කාමරේ මහා පුදුම සුවඳක් විහිදුනේ. රස කෑම සුවඳ. ඉස්කෝලේ ලන්ච් බ්‍රේක් එක 1230ට. දවසක් රීඩ්/තර්ස්ටන් පාරේ යුනිවසිටි හන්දිය ගාව ස්යිකල් කාරයෙක්ව වහනයක් හප්පාලා බිදිච්ච කෑම පිඟන් පාර පුරා සී සී කඩ ගිහිල්ලා. ඥාති මිස් අම්මාට කෝල් කරලා කිවුවහම අපි දුවගෙන වගේ ගියා එතනට බලන්න. අපි එතකොට හිටියේ ඒ ළඟ ගෙදරක, හැව්ලෝක් පාරේ.

152. අපේ ඇන්ටි කෙනෙක් 'දුරකථනය නෑ' කියා කියා හැමතැනම ඒක හොයනවා, දවසක් මම එයාගේ ගෙදර යනකොට. බලනකොට ඒක අතේ තියාගෙන. 'මෙන්න ඇන්ටිගේ ෆෝන් එක අතේම තියාගෙන' කිව්වුහම ලැජ්ජාවේ වෙන කතාවක් පටන් ගත්තා. පවු.

153. දවසක් AGA කාර්යාලයට ආපු මහත්තයෙක් තම සේවක මණ්ඩලය ඉදිරියේ AGA මහත්තයාට නොසෑහෙන්න ඉංග්‍රීසියෙන් බැනලා. කිසි වරදක් නොකළ, එහෙත් ඉංග්‍රීසි නොදත් AGA මහත්තයා කටවහගෙන ඉඳලා. ඊළඟ සුමානේ ඉඳන් ඔෆිස් ස්ටාෆ් ඒ පැත්තේ ඉංග්‍රීසි උගන්වන හවස ක්ලාස් වලට බැඳෙන්න පෝලිම් ගැහෙනවාලු.

154. දවසක් නින්දෙන් ඇහැරිලා ටොයිලට් එකට ගිහින් ඉවරවෙලා පැත්තට හැරිලා වතුර එක ෆ්ලෂ් කරා . මගේ කරේ රත්තරන් චේන් එක කොක්කෙන් ගැලවිලා රෑ ඇඳුමේ රැඳිලා ටොයිලට් එක ඇතුලට වැටිලා. ටක් ගලා යමක් වැටෙනවා ඇහුනාමයි දැක්කේ දැක්කේ අනේ උපන්දිනයට මහත්තයා තෑගී කල ,වටිනා දිය මන්තියක් එබූ එස් අකුර ගහපු රත්තරන් චේන් එක. අදටත් ඒක ටෝයිලට් වලේ.

155. සිඩ්නි වල මාටින් ප්ලේස් ෂොපින් සෙන්ටර් එක ළඟට එනවා ඇබරජිනිස් ලා දෙන්නෙක්. ඔවුන් ඇඳ සිටින්නේ ඔබ ඡායාරූප වලින් දැක ඇති කොළ අතුඇඳුමක්, ඇඟේ සුදු තීන්ත ගාගෙ න.මේ ඇබරජිනිස් දෙදෙනා ඔවුන්ට ආවේනික පෞරාණික සංගීත භාණ්ඩ යොදාගෙන ඉතාම මිහිරි කන්කළු සංගීතයක් ඉදිරිපත් කරනවා.මොවුන්ගේ මුහුණෙන් දිස්වන අහිංසක පෙනුම නිසාත් ලයාන්විත සංගීතය නිසාත් ඇතිවන්නේ පුදුම අනුකම්පාවක්. මොවුන් ඇත්තෙන්ම ඇබරජිනිස්ලාද?.මෙතැනින් යන ගොඩක් දෙනෙක් ඩොලරයක් දෙකක් බිමට විසිකරලා යන්නේ.මමත් කීප වතාවක් ඔවුන්ගේ

ලයාන්විත  සංගීතයට සවන්දී ඩොලරයක් දෙකක් විසිකරලා තිබෙනවා. දවසක් මම මේ ගැන පුතාට කිවුවා. පුතා කියනවා 'තාත්තට පිස්සු, උන් මොන ඇබරජිනිස්ලද. උන් දෙන්නා ශ්‍රී ලන්කන් ස්ටුඩන්ට් ලා දෙන්නෙක්. සිඩ්නි වල ඉන්නේ, UTS එකේ ඉගෙන ගන්නේ.  දවසකට හොඳ ගානක් එකතුකරගෙන, ඔය කොළ අතු ඇඳුම් මාරු කරලා ලේටස්ට් මොඩල් බි.එම්.ඩබ්ලිව් එකක නැගලා ආපහු යනවා' කියලා. පොලිසිය දන්නවා අල්ලන්න බැහැ, මොකද කිසිම නීතියක් කඩ කරලා නැහැ.

156. මම පොඩි රැකියාවක් කරමින් හිටපු තැනකදි මහත්තයෙක් කෑම පාර්සලේ තිබූ බැදපු කුකුල් මස් කෑල්ල දරුවට ගෙනියන්න සාක්කුවේ දමාගෙන සිටියදි ලේන්සුව එලියට ගන්න විට බිමට වැටුනා. පසුව වතුරෙන් සෝදා, පිසදා ආපසු කලිසම් සාක්කුවට දමා ගත්තා.

157. පුලුවන් නම් ඉස්කෝලේ පන්තියේ ආදී ශිෂ්‍යයයෝ සියලු දෙනා හොයාගෙන කණ්ඩායමක් පටන් ගන්න, මම එහෙම කරා. 10 දෙනෙක් උනත් කමක් නැහැ හොයාගන්න පුලුවන්නම්. කණ්ඩායම ලොකු වේවි. ඉස්කෝලෙන් අස්වෙලා අවුරුදු 30ක් 40ක් ගියත් මෙවැනි දෙයක් පටන් ගන්න ප්‍රමාද වැඩි නැහැ. උස් පහත්  බේධයක් නැතිව කණ්ඩායම රැස්වෙන හැටි දැක්කහම බලන් ඉන්න අයට පුදුම හිතේවි . කණ්ඩායම නොමැරි තියාගන්න ඕන නම් අවුරුද්දකට වරක් වත් රැස් වෙන්න ඕනා.

158. සුද්දෙක් දැක්කොත්,අපේ සමහර අය, ඉංග්‍රීසි පුහුණුවෙන්න කතා කරනවා, සමහර අය නිකම් ටිකට් එකක් ගෙන්වා ගන්න බලපොරොත්තු වෙනවා, සමහර අය ඒ සුද්දා සමග මොනවහරි වෙළදාමක් පටන් ගන්න මාන බලනවා. කොයි දේටත් ක්‍රම වේදයක්, ඉවසීමක් තියෙන්න ඕන.

159. දවසක් මුස්ලිම් ගැහැනු කෙනෙකුයි දෙමල ගැහැනු කෙනෙකුයි හොදටම රණ්ඩු වෙනවලු, ඒවා මේවා කියමින් බැණ බැණ දෙමලෙන් ගොඩක්ම චරිත ඝාතන. මුස්ලිම් කෙනාට හරියට දෙමල කියාගන්න බැහැ. ඇය බැරිම තැන දෙමළ  ගැහැනුකෙනා බැනලා ඉවර වෙනකම් අත් දෙක බැදන් අහගෙන ඉදලා අන්තිමට කිව්ව්වලු ‘ඒ ඔක්කොම උඹ’... කියලා, යන්න ගියාලු.

160. මං ගේ ඇතුලේ කාන්තා අයිතිවාසිකම් ඉල්ලුවා, නුඹලට විතරද හතරක් පුළුවන් අපිට බැරි ඇයිද කියලා.  අනේ ඒකා මට දොර පෙන්නුවා.

161. ළමයින් වඩා ගෙන ඇවිත් කඩ සාප්පු වලින් භාණ්ඩ , ඇදුම් හොරකම් කරන බවලත් අය ඉන්නවා, cctv වලටවත් අහු වෙන්නේ නැහැ.

162. හැත්තෑ ගණවල දෙහිඹිවිට පැත්තේ කසිප්පු ,කන්සා, ගණිකාවන්, හොරකම් හා සංවිධානාත්මක මංකොල්ලකෑම්

වැනි සියලු දුසිරිත් වලින් බලවත් වූ පවුලක් හිටිය. මේ ගෙදර මයිනෙක් ඇති කළා. ඒ මයිනා පොලිසියෙන් එනකොට අසභ්‍ය වචනයක් කියනවා. ඒ මයිනා කළේ ඔත්තු බැලීම. අද කාලේ කියන පාතාල කණ්ඩායම් කියන වර්ගයේ කණ්ඩායමක් හදාගෙන ප්‍රදේශයම භීතියෙන් යටත් කරගෙන හිටියේ. මහා දවල් කොල්ලකෑම ස්ත්‍රී දූෂණ කළේ බලපත්‍ර අරගෙන වගේ. අන්තිමේදී පොලිසියෙන් කිහිප දෙනෙක්ම වෙඩි තියලා දාලා තමයි ඉවර වුනේ.

163. මම නිව්යෝර්ක් ඉඳලා ලන්ඩන් ආවා පොදු රාජ්‍යය මණ්ඩලයේ මහාලේකම් කාර්යාලයෙන් ලැබුණු ආරාධනාවකට, ඒ ආයතනයේ පැවති උත්සවයකට සහභාගී වෙන්න. සුපුරුදු මුහුණක් දැක, මම කථා කරලා කිව්වා ඔබව හොඳට දැකලා පුරුදුයි කියලා. ඔවු, වෙන්න පුළුවන් මම චාර්ල්ස් කුමරාගේ නංගි කියා ඇය කිව්වා.

164. අපේ ගෙදරට වෙළඳ නියෝජිතයෙක් එනවිට මම උදයට ඉදි ආප්ප කමින් සිටියා. තාත්තත් තේ එකක් අතේ තියාගෙන හිටියා. අපි දෙන්නම උඩුකයට ඇඳුම් නැතිව තාත්තා සරමකුත් මම කොට කලිසමකුත් ඇඳගෙන හිටියා. එයා ඉංගිරිසියෙන් මට සුබ උදෑසනක් කියලා අපගේ ඉඩමේ කරන ඉදිකිරීමක් සම්බන්දයෙන් ඉංගිරිසියෙන් ඇහුවා. ‘කඩුව’ දාලා අපව අල්ලා ගන්න බැලුවේ. මම අත හෝදගෙන එනතුරු තාත්තා සමග කතාකරන්න කියලා ඉංගිරිසියෙන් පිළිතුරු දීලා ගියා. තත්තාට කන ඇහෙනවා අඩු නිසා මේ කව්ද කියල ටිකක් උස් හඬින් ඉංග්‍රීසියෙන්ම තාත්තටත් කියලා දිපුහම මිනිහට තේරුණා වැරදි

ගහට කෙටුවේ කියලා. එතන ඉඳල මිනිහා සුද්ද සිංහලෙන්ම කතාව පටන් ගත්තා.

165. අපේ තාත්තාගේ නෑදෑයින් ගිනිගත්හේනේ කිතුල්ගල පැත්තේ ඉන්නවා. එයාලා ඒ පැත්තේ නෑදෑයන් මැරෙනතුරු බලා ඉන්නවා දේපල කුඹුරු අයිති කරගන්න. පුදුම මිනිස්සු.

166. මම මගේ වෙළඳ ස්ථානයට වතුර ගන්න අදාළ ලිපිය ගන්න ගියවිට මගේ විවාහ සහතිකය ඉල්ලුවා. ඇයි කියලා ඇසුවාම, ඔප්පුවේ සැමියාගේ නම තිබෙන නිසා ,ඔහු පිටරට බැවින් කවදාහරි අපි දික්කසාද වුණොත් ඒ අයට ඒක ප්‍රශ්නයක්ලු. තවම වතුර නැහැ.

167. පොල්පිත්තක් අරන් ඔයාට අර ගැනු කෙනා තඩිබැවේ ඇයි, ‘මන් එයාගේ පුතාට  ඇත්ත තත්වය පෙන්වන්න හැදුවා, ඩිවෝස් වෙනවා කිව්වා’.

168. අරාබියේ සුල්තාන්ලගේ ,ඇමෙරිකන් සහ යුරෝපිය ධන කුවේරයන්ගේ වැඩ බලන්න ප්‍රන්ශයට පහලින් පිහිටි මොනාකෝ වලට හෝ ලක්සන්බර්ග් වලට යන්න. පිස්සු හැදෙනවා.

169. අපේ පවුලටම දෙවැනි අම්මා වුණ ලොකු අක්කාට දැන් වයස  57යි. බඳින්න බැරිවූ ලොකු අක්කාට හිතවත් අය අතර

මුලින්ම ඉන්නේ මමයි. එයාව මම බලා ගන්නා බව එයා දන්නවා මගේ මිසිස් විරුද්ධ උනත්.

170. ෂොප් එකට හොරු පැන්නොත් සිකියුරිටි කොම්පනියටත්,ගෙදරටත් වදින විදියට ඉලෙක්ට්‍රික් බෙල් එකක් දාලා තිබුනා. දවසක් රෑ යාමෙට බෙල් වෙලා හනික, සිකියුරිටි කොම්පැනියෙන් ඇවිල්ලා ,අයිතිකාරයත් ඇවිල්ලා බලනවිට බළලෙක්ලු පැනලා තිබුනේ. හැමෝම හිනහා වෙවී ගියාලු, හැබැයි බිල ආවහම අයිතිකරු තක්බීර් උනාලු.

171. තල්දුවේ දිය ඇල්ලේ ඔයේ වෙඩි දාලා මාළු අල්ලන මනුස්සයෙකුට හොඳ දෙයක් වුනා දැනට අවුරුදු 50 කට විතර කලින්. මිනිහා හොඳටම බීලා ඉදලා තියෙන්නේ. ඔය අයිනේ හොඳ මාළු වලක් තෝරාගෙන, වෙඩිල්ල පත්තු කරලා කෝට් සාක්කුවට දාගෙන ගිනි පෙට්ටිය විසි කළා මාළු වලට.

172. පත්තු කරපු ගිනිකූරුවල ගිනි බෙහෙත් පොඩ්ඩක් හරි ඉතුරුවෙලා තියෙනවනම් ඒවා වේලලා ආපහු පාවිච්චි කරන අම්මා කෙනෙක් ඉන්නවා.

173. මම ඒ කලේ අම්ම වැඩට ගියාම ගෙදර උයනවා. එතකොට මගේ වයස අවුරුදු 10යි. එක දවසක් අම්ම මට දීලා ගියා රු.2 න් බඩු ගෙනත් උයන්න කියලා. මම මගේ වයසේම යාලුවෙක් අක්ක කතා කර කර ලිප පත්තු කරන ගමන් පොල්ලෙලි අඟුරට රු.2 තියල ලිප පත්තු කරලා. හාල්වලට වතුර ලිපේ තියල කඩේට යන්න සල්ලි හෙව්වා. අම්ම ආවට පස්සේ මං

කීවා සල්ලි නැතිවෙලා කියලා. අම්මා පාන් රාත්තලක් ණයට ගෙනත් අපි 8 දෙනාටම කපල දුන්නා අමුවෙන්ම. ඒ එදා. අද අපි අපි සතුටින් ඉන්නවා.

174. ජේ.වී.පී කාලේ, 70 ගණන්වල මුල. අපි රෑවෙනකොට ලොකු අම්මලාගේ ගෙදරට යනවා නිදාගන්න අම්මත් සමග, මැදියම් රෑ, සේරමලා තේ බොන්න කතාඋනා , කවුරුත් බයයි නිවසින් පිට තියන කුස්සියට යන්න. අවසානේ අපේ අම්මා වතුර ලිප තියලා ලොකු අම්මාගේ දුවට කෙතලේට තේ කොළ ටික දාගෙන එන්න කීවිට ඒ අක්කා අත්ලට තේ කුඩුටික අරන් අම්මා කපන හකුරු කැලි ටිකෙන් එකක් අරන් බයේ බයේ කුස්සියට ගිහින් කේතලේ පියන අරිනකොටම අල්ලපු වත්තේ මුර ගේ ටකරම් වහලෙට වේලිච්ච පොල් අත්තක් වැටුනා සරාස් ගාලා. පහලට වැටුනේ වෙඩි වගේ ශබ්දයෙන්. අනේ අර අක්කා හිතුවේ ජීවිපි එකෙන් ඇවිත් අපිට වෙඩි තියනවා තමා කියලා. කම්පනයට කන්න ගත්තු හකුරු කැල්ල මුට්ටියට දාලා තේ කුඩු ටික කටේ දමාගෙන ගේ ඇතුලට දුවගෙන ආවා. කතා කරගන්නත් බැහැ නහයෙන් , කටින් තේ කුඩු පෙරාගෙන. මම ගොඩක් චුටීයි , එදා මම ලාම්පු එලියට ඒ අක්කාව දැක්කේ. එයාට, කව්රුහරි එලියට ගියාට පස්සේ වෙඩි තියල කියලයි හිතලා තියෙන්නේ. අදත් අපිට හිනා ඒ සිදුවීමට.

175. මම පෙම්වතාත් එක්ක මුහුදු වෙරළට ගිහින් ඉදිද්දී අපේ අයියගේ අතටම අහුවුණා. ඒ කොල්ලා අයියගේ යාලුවෙක් හින්දා එදා නම් මම අපේ අයියගෙන් ගුටි නොකා බේරුණා. හැබැයි අයියගේ යාලුවා කියන මගේ පෙම්වතා නම් පහුවෙනිදා

අයියගෙන් ලොකු බැණුමක් ඇහුවා කියලා එයා මට පස්සේ කිව්වා.අයියා බැණලා තියෙන්නේ මගේ නංගි එක්ක යාලුයි කියාලා එයාට  කිව්වෙ නැත්තෙ ඇයි කියලයි.දැන් නම් අයියා මට බණින්නේ නැහැ.මම හැම ඉරිදාටම පෙම්වතා එක්ක මුහුදු වෙරළට යනවා.අයියා අපිව දැක්කත් මුකුත් කියන්නේ නැහැ.

176. කටුනායක එයාපෝට් එකේදී මගේ ඇඳුම් බෑගය මාරු වෙලා, පස්සේ භාර දෙනකොට ඇතුලේ තිබුන චීස්, පෙයාස්, චොක්ලට්, මස්කට්, බූන්දි ඔක්කොටම විදලා; රෙදිටිකයි සපත්තු දෙකයි විතරක් තිබුනා.

177. සෙනරත් මහත්තයා ගෙදර වටේට වලවල් හාරන කොට මම දැන ගත්තා රට කොටු පනින එවුන්ට දෙවියන්ගේම පිහිටයි කියලා. පුදුම මහත්තයෙක්.

178. අපේ ඇන්ටිවෙන කෙනෙක් හිටියා. තමන්ගේ මහත්තයාට කොච්චර ‘ආදරේද’ කියනවනම් අන්කල් චන්දෙ ඉල්ලුවේ ශ්‍රී ලංකා එකෙන්. ඇන්ටි වැඩ කලේ යූ ඇන් පී අපේක්ෂකයාට. ඒ විතරක් නොවේ චන්දෙ ගැහුවෙත් අන්කල්  එක්ක චන්දෙ ඉල්ලපු යූ ඇන් පී අපේක්ෂකයාට. චන්දෙදි අන්කල් පැරදුනා. ඇන්ටිට ෆුල් ‘සැට’.

179. දවසක් ලංකා බැංකුවේ මාණ්ඩලික ප්‍රධානියා තීරණය කළා නිවාඩු දවසක සේවක පිරිස එක් දින චාරිකාවක් සඳහා හක්ගල මල්වත්තට රැගෙන යන්න. ප්‍රධානියා ලේකම්වරියට දැනුම් දුන්නේ එක්දින චාරිකාවේ කාල සටහන සකස්කර

හැමදෙනාටම එහි පිටපතක් ලබාදෙන ලෙසයි. ඉංග්‍රීසියෙන් සැකසූ කාල සටහන අනුව 9ට රැස්වීම සඳහන්ව තිබුණි, චාරිකාව යන දිනය උදාවී මගේ යාළුවා හැර සියලුම සේවකයන් උදෑසන අටට පැමිණ සිටියහ, සියලුම සේවකයන් බස් රථයට ගොඩවී බලා සිටින්නේ ඔහු එනතුරුය. කෙසේ හෝ උදේ 9,45 වෙද්දී යාලුවා සුපුරුදු පාපැදියෙන් නියමිත තැනට ළඟාවිය. ලංකා බැංකුවේ මාණ්ඩලික ප්‍රධානියා කේන්තියෙන් 'අයිසේ අපි තමුසෙට කීයටද එන්න කිව්වේ'? යාලුවා කියා සිටියේ 'සර්, ලේකම් නෝනා දුන්නු කාලසටහන අනුව නම් මම ගෙදරින් එලි බසින්න ඕන උදේ අටට, නමුත් මගදී පැච් එකක් ගියා සර්' කියලා.

180. අපේ වැඩපොළ පැත්තට හරියට වැස්සා, එනකොට පාර ලිස්සනවා. ස්යිකලේ මග දාල පයින් ගෙදර ගියා. කොහොම කොහොම හරි මහා රෑ වෙලා ගෙදර ගියා; මගේ අම්මේ එහේ තදේට ගොරවනවානෙ . මං අම්මාලයි දිහා ගිහින් නිදා ගත්තා, ගෙදර නොගිහින්. හැබැයි මිසිස් රෑ තිස්සේ කෝල් කරනවා තරහින්.

181. වයිෆ් මට කියනවා - 'අනේ පාරේ තෙමුනානම් හොඳයි මිට වඩා, අනුන්ගේ ගෙවල් අස්සේ ප්‍රශ්න වලට මැදි වෙන්නේ නැතුව'. මොකද වැස්සට නතරවෙච්ච ඉඳපු ගෙදර නොනාගෙයි මහත්තයාගෙයි ආරවුල් මම බේරන්න ගිය හින්දා.

182. අපේ නිවාස ලග බෝඩිමේ ඇන්ටි ගමේ යන දවසට හැමෝටම සංග්‍රහ කරලා 4 දෙනාම වෙන වෙනම හමුවෙලා

කියනව, බන්දු ළමයෝ මට ඔයා විතරයි විශ්වාස මම ගමේ ගිහින් එනකන් ගේ හොදට බලා ගන්න, අනිත් ළමයි ගැන විශ්වාසයක් නැහැ කියලා. මේ කතාවම අනිත් ළමයින් 3 දෙනාටත් වෙන වෙනම කියනවා. ඇන්ටි ගමේ ගිහින් එනකන් තැඹිලි පොල් වෙනකල් හැමෝම ගේ හොදට බලාගන්නවා ඇන්ටිගෙන් ලකුණු දාගන්න.

183. අපේ තාත්තා රජයේ ටෙක්නිකල් කොලේජ් එකක විදුහල්ති කෙනෙක්. අම්මා ගුරුවරියක්. අපේ තාත්තා ඇන්ටි කෙනෙක් (ටීචර්) එක්ක අනියම් සම්බන්ධයක් තියනවා. ඒ ඇන්ටි තාත්තගේ පරණ යාලුවෙක්ගේ නෝනා. අපේ තාත්තට විදුහල්පති වෙන්න උදවු කලෙත් ඒ මාමා. අපේ අම්මාත් අපිත් මේ දේ දන්නවා. තාත්තා හැමදාම ඒ ඇන්ටිත් එක්ක ගතකරලා ගෙදර එන්නේ හොදටම බීලා. ඇවිත් අම්මට ගහනවා. අපිටත් ගහනවා. හොදටම බනිනවා. අපට ගහ ගහා ෆෝන් එකෙන් ඒවා තාත්තගේ යාලු ඇන්ටිට අහන්න සලස්සනවා. කීප දවසකම මහ රෑ අපට ගහලා ගෙදරින් එළියට දාලා තියනවා. එදාට නංගීත් මමත් මල්ලීත් අම්මාත් ගෙයි එළියට වෙලා එලිවෙන කම් අඩ අඩා ඉන්නවා. අපට කන්න, ඉගෙනගන්න වියදම් කරන්නේ අපේ අම්මා. ඇය මේ ලෝකේ උතුම්ම මවක්. අපට දුකක් වෙන්න දෙන්නැතිව ආදරෙන් බලාගන්නවා. අපිට උගන්වන්න අම්මා අපා දුකක් විදින්නේ. අම්මා තාත්තට විරුද්ධව පොලිසි යන්නෙත් නැහැ. අපට ලැජ්ජා වෙයි කියලා . තාත්තගේ නපුරු පහරදීම් වලින් අපේ අම්මාත් වෙලාවක මැරෙයි කියලා හරි බයක් අපට තියෙන්නේ. මේ ලෝකේ ඉන්න නපුරුම කෙනා අපේ තාත්තා කියලයි මට හිතෙන්නේ.

තාත්තා අපෙන් අයින් වෙලා අර ඇන්ටිත් එක්කම ඉන්නවා නම් අපි හැමෝම කැමතියි. ඒත් එයා එහෙම කරන්නෙත් නැහැ.

184. ඔන්න අපි කොළඹ ඉඳලා කාර්යාල චාරිකාවක් ගියා බුලත්කොහුපිටිය පැත්තේ. මේ දුෂ්කර ගම්වල පහසුකම් අඩුයිනේ. ඉතින් අපේ සහෝදරී කෙනෙකුට කිසියම් අවශ්‍යතාවයක් වෙලා, ඊට සුදුසු තැනක් හෙවුවා. අපේ නඩේ ගුරා මේ පළාතේ කෙනෙක්. එයත් අපේ කාර්යාලයේම කෙනෙක්. එයා ඒක, බොහොම සුලුදෙයක්නේ නංගි කියලා ගෙවල් නැති රබර් වත්තක පාලු වංගුවක වාහනේ නවත්තන්න කිවුවා. එතන බැහැලා ඇයට උපදෙස් දුන්නා පොඩි ගස් පඳුරු කිහිපයක් අතරින් එහාට යන්න. ඔන්න අපේ සහෝදරිත් ගියා කියමුකෝ. තප්පර ගණනක් ගියේ නැහැ, ඒ ළමයා යටිගිරියෙන් කෑගහගෙන එළියට දුවනවා. අපි ඔක්කොම බයවුණා. මොකද සර්පයෙක් වත් දෂ්ට කරලාද දන්නේ නැහැනේ. එළියට දුවගෙන ආපු ගමන් ඒ ළමයා කකුල් පොළවේ හප්පා හප්පා උඩ පැන පැන අත්දෙක ගසමින් ඊ ඊ ඊ .... ගාලා යටිගිරියෙන් කෑගහන්න ගත්තා. දැන් නම් අපි ඔක්කොම හොඳටම බය වෙලා. හැමෝම ළඟට දිවුවා. මොකද සර්පයෙක් වත් කැවද කියා අහගෙන. නෑ මේ මේ කකුල් දෙකේම ඊයා.... අනේ මට බෑ මට බෑ.. කියලා කකුල් පොළොවේ හප්පනවා. බොහොම අමාරුවෙන් අල්ලලා මොකද කියලා බැලුවමයි තේරුනේ. කකුල් දෙකේම කූඩැල්ලෝ නැගලා. අපිටවත් අරන් දාන්න විදියක් නැහැ. කකුල් ගස්සන නිසා. අමාරුවෙන් කියලා අල්ලාගෙන උන්

කිහිපදෙනෙක්ම ඇදලා දැම්ම. ඊට පස්සේ මුළු ගමනම ඇය බස් එකෙන් බැස්සේ නැහැ. අදත් අපි ආයේ බුලත්කොහුපිටි යමු කිවුවහම එයා බණිනවා.

185. මගේ නැන්දා (90 ) බත් කනකොට මාළු කටු කැල්ලක් උගුරේ හිරවෙලා. ලොකු නැනා (57) නංගිට කතා කරලා ඇහුවලු මොකද කරන්නේ කියලා. ඉදුණු කෙසෙල් ගෙඩියක් කන්න දෙන්න කටුව ඒකේ ඇනිලා යයි කිව්වලු. ටෙලිෆෝනයෙන් ඇහෙනවා 'අනේ දුවේ මාව මැරේවි එකපාරට ඔහොම කෙසෙල් උගුරේ එබුවම'. අක්කා අම්මගේ කට ඇරලා කටුව මේ හරියේද අම්මේ අසමින් කෙසෙල් ගෙඩියම කටේ ඔබලා, නැන්දා බේරුනා.

186. මගේ ලොකු දුවව මම හැදුවේ ඇස් දෙක වගේ. කොටින්ම නැවුවේ වෙනිවැල්ගැට වතුරෙන්. පැරඩෝල්, කොඩ්ලිවර් ඔයිල්, සේරිලැක්, කැප්ටන්ස් ඕට්ස්, කේලොග්ස් කෝන් ෆ්ලෙක්ස්, ඉස්තරම්ම ක්‍රාෆ්ට් චීස්, ඇන්කර් කිරි වර්ග, මැලිබන්/මන්චී බිස්කට්, නව සීලන්ත කිවී ෆ්රුට්, බහරේන් සුල්තානා, ඇමරිකන් පීනට් බටර්, ඕස්ත්‍රේලියන් වෙජිමයිට්. - ලෝබ නැතුව කඩෙන් අරගෙනයි හැදුවේ. පුළුවන් කමටම නොවෙයි, ඒත් ඒ දවස්වල් මහත්තයායි මමයි දෙන්නම හම්බු කළා, ඒ හින්දා අපේ අතේ සල්ලි ගැවසුනා. පොඩි දෙන්නාට ඒ මොකුත් වැඩිය දෙන්න හම්බුනේ නැහැ. පොඩි දුව තාම මාත් එක්ක ආඩාපාලි කියන්නේ ඒකයි.

187. පන්තියේ යාලුවෙක් හිටියා ඉගෙනුමට අන්තිම අකමැති සහ කම්මැලි. මිනිහා දුප්පත්, ආවේ සමාජයේ ‘පහළ’ යයි සම්මත පවුලකින්. හැබැයි මැන් ආශ්‍රය කලේ ඉස්කෝලේ හිටපු ඉස්තරම්ම සිසුන්ව, බොහෝවිට ඉහල පන්තිවල ඉංග්‍රීසියෙන් කථා කරන අය, ඇමතිලගේ පුත්තු, ප්‍රිෆෙක්ට්ලා වගේ අය . ඒ දවස්වල රටේ රාජ්‍ය නායකයගේ ඉඳලා RMV එකේ පියං දක්වා ඕන වැඩක් කරගන්න නම් මිනිහට භාර දෙන්න ඕන, හරියටම කරලා දෙනවා. හැබැයි ගාන කපලයි වැඩේ කරලා දෙන්නේ. දැනුත් මිනිහා බරම  අතුවල වාඩි වෙලා ඉන්නවා කියලයි ආරංචි.

188. තද වැස්සේ ඉතාලියේ ෆෝන් බොක්ස් එකකට ගියේ හදිසි කෝල් එකක් ගන්න ලංකාවට. ඉතාලි ජාතිකයෙක් ඇතුලේ ඉන්නවා, සැරෙන් සැරේ  දොර ඇර ඇර බලනවා.  වැස්සේ තෙමෙන මගේ දිහාත් බලනවා.  විනාඩි තිහකට විතර පස්සේ එලියට බැස්සා. ඇවිල්ලා අත දික් කරලා බලනවා, තාම වහිනවද කියලා. බැලින්නම් මිනිහා  ඇතුලට වෙලා ඉඳලා තියෙන්නේ වැස්ස පායනකම්. වැඩේ   කියන්නේ මිනිහගේ අනිත් අතේ තිබ්බේ දිග,  නවපු කුඩයක්.

189. තාප්පෙට උඩින් හැමදාම වගේ ප්ලාස්ටික් කුණු පිරුණු ගැට ගහපු බෑග් කවුද විසි කරනවා. කරන කෙනා අල්ලන්න දවසක් බෑග් එක ලිහා බැලුවා. කුණු ගැව්ච්ච ලියුම් කවරයක් තිබුනා නමයි  ඇඩ්රස් එකයි ලියපු. අපිට ගෙවල් 3ක් විතර ඉස්සරහ ගෙදරක (අපේ පැත්තේ කුණු ලොරියක් යන්නේ නැහැ, වලවල්

කපලා වත්තේම දාගන්නවා). ලියුම් කවරේ ගිහිල්ලා ගෙයි පඩිය උඩින් තියලා ආවා. එදායින් පසු අපේ ගෙදරට කුණු බෑග් වැටුනේ නැහැ.

190. ලංකාවේ රාජ්‍ය බැංකුවක ලොකු නෝනා කෙනෙක් මගේ රුපියල් පන් දාහක් වැඩියෙන් අරගෙන ලැබුනේ නැහැමයි කියලා මාත් එක්ක රණ්ඩුවෙලා කොහොමහරි කටින් ගහලා එයා දිනුවා. මම ගෙදරින් එනකොට නෝනාගෙන් ඉල්ලලා ගැනලා හරියට ගෙනාවේ. ඒත් බැංකුවට සල්ලි දුන්නහම අඩුවෙලා. මොනවා කරන්නද?

191. පොත් ප්‍රදර්ශනයකදී පොත් අරගෙන රු 5000 කොලේ දුන්නා, කියනවා දුන්නේ රු 1000 කොලේලු.

192. අපේ කාර්යාලයේ කෙනෙක් තව කෙනෙක්ගේ බෑග් එකට හිස් අරක්කු බෝතලයක් දැම්මා. එයා දන්නේ නැතුව ගෙදර ගියාම වයිෆ් ඒක් දැකලා ලොකු අවුලක් වුණා. කොච්චර කිව්වත් විශ්වාස කරලා නැහැ.

193. 'ඕනාවට වැඩිය කට ගහන්න ආවොත් මාළු ගෙනියන පකිස් පෙට්ටියක බැදලා අරගෙන ගිහින්, අර අලි වැටෙන් එහාටම දමලා එන්න ඇත්නම්' කියලා ලොකු අක්කා කියනවා.

194. පොඩි කාලේ දඟ කලාම ලොකු අක්කා මාව එක අතකින් ඇදලා අරගෙන රවුමට රවුමට එකතැන හයියෙන් කරකවනවා.

මේ ලඟදි (වසර 40ට පමණ පසු) මට එයා කථා කරලා කියනවා 'අනේ මල්ලි මට සොරි, ඔයාට කොච්චර බය හිතෙන්න ඇද්ද' කියා, එතකොටයි මට ඒ සිද්ධි මතක් වුනේ.

195. මම දන්නා කෙනෙක් ට්‍රිප් එකක් යන ගමන් කොල්ලෝ කෙල්ලන්ට දෙන්න ටෙලිපොන් නොම්මර කොලකෑලි කෙල්ලන්ට දෙන්න ටෙලිපොන් නොම්මර කොලකෑලි වල ලියන් ගිහින් එක තැනකදී කලබලේට වාහනේ යන ගමන් කොළ කෑල්ල කියල අතේ තිබ්බ සල්ලිටික විසිකරලා.

196. මේ සිද්ධිය උනේ සුදු වතු පාලකයින් ඉන්න කාලේ ලබුගම පැත්තේ රබර් වත්තක. මේ ඉංග්‍රීසි ජාතික වතු පාලකයා බංගලාවේ පාටියක් දවසක මහ රෑ වෙනත් කාන්තාවක් සමඟ කාමරයක ඉඳලා ( මේ වතු බංගලාව කාමර බොහෝ ගණනක් ඇති රමණීය කඳු මුදුනක පිහිටි සංචාරක නිකේතනයක්. සුදු ජාතික බිරිඳට මේක දැනිලා. ලැකර් තීන්ත බෙලෙක්කයක් අරන් ගිහින් දෙන්නම නාවලා.

197. දවසක් මම බස් එකේ යද්දී ගෑනු කෙනෙක් මගේ උරේ හිස තියාගෙන නිදා ගත්තා. මම කිසිවක් කිවුවේ නැහැ.බහින තැනදී (ගමනනාන්තයේදී) කතා කරලා නැගිට්ටුවා. ඒ කාන්තාව මගෙන් සමාව ඉල්ලුවා. එයා දන්නේ නැතුවම නින්ද ගියා කියලා. සමහර අයට බස් වලදී වාහන වල ගමන් කරන කොට නින්ද යනවා. නමුත් මේ සිද්ධිය කොහොම එකක්ද කියලා මට නම් තේරෙන්නේ නැහැ.

198. මට මේ ගිය සතියේ දකින්න ලැබුණු දෙයක් කියන්නම් .මම ගියා ෆෝන් බොක්ස් එකකට කෝල් එකක් ගන්න ලංකාවේ යාලුවෙකුට.නේපාල ජාතිකයෙක් රිසීවරය අල්ලාගෙන කනේ තියාගෙන විනාඩි විස්සක් විතර වචනයක් වත් කතාකරන්නේ නැහැ. මම බැරිම තැන ඇහුවා ඔයා කතා කරන්නේ නැහැනේ, මට කතා කරන්න දෙන්න කියලා .මිනිහ කිව්වා එයා වයිෆ් එක්කලු කතා කරන්නේ කියලා.මට මිනිහ ගැන මහා අනුකම්පාවක් ඇතිවුනා.ලංකාවෙත් මෙහෙම ගෑනු ඉන්නවා.

199. අලුතෙන් ඉදිකරන මහල් නිවාසේ අපද්‍රව්‍ය බැහැර කිරීම කල්පනා කල ගෘහ නිර්මාණ සැලසුම් ශිල්පියා විසින් කම්කරුවන් ලවා අඩි හයක් ගැඹුරු වළක් හාරා කල් යාමේදී වෙනත් විකල්පයකට සිත යොමු වී නැවත එම වල පස් දමා වසන්නට අණ කළේය. පස් පිරවූ පසු තව අඩි දෙකක් පමණ උසට පස් ගොඩ උඩට මතුවී ඇති අයුරු සේවකයන් ඉංජිනේරුවරයා දැනුවත් කලා. එසේ අඩි දෙකක් උසට පස් තිබෙන්න හේතුව වල හොරට අඩි හතරක් පමණක් කැපු නිසාවෙන්, නැවතත් හරියට අඩි හයේ ගැඹුරුට වල කපා, ඉන් පසු ඒ පස් නැවත ඇතුලට දමා, වැඩේ හරියට කරන ලෙස ගෘහ නිර්මාණ සැලසුම් ශිල්පියා කීය.

200. මට පාසල් සමයේදි වූ සිදුවීමක් මතක්වුණා. බම්බලපිටිය - පානදුර බසයේ ඇඟිල්ලක් ගැසීමට ඉඩක් නැත. ටියුෂන් පන්තියට යන තවත් සිසුවියක්, ඉදිරියෙන් පැමිණි තල්ලුවක් නිසා මගේ ඇඟට හේත්තු විය. ඇය ලජ්ජා, බය ඇති, අහිංසක

සිසුවියකි. සැනෙකින් ඇය පොත් බෑගය ළයට තුරුළු කර ගත්තාය. අවසානය දක්වාම ගියේ හිස පහත් කරගෙනයි.

201. මම කොළඹ ඉඳලා පාන්දර 5 බස් එකෙන් නුවර යනවා. නිට්ටඹුවෙන් අම්මා කෙනෙක් සහ දූව බස් එකට ගොඩවෙලා මට ඉස්සරහ සීට් එකේ ඉඳ ගත්තා. කැගල්ල පැන්නට පස්සේ දූව පිටිපස්ස හැරී හැරී මගේ දිහා බලනවා. මට හරි මොකද්ද වගේ. පස්සේ අම්මාත් බලන්න ගත්තා. කඩුගන්නාව හරියේදී ඒ අම්මා නැගිටලා පිටුපස්ස හැරිලා වටාස් ගාලා මට කම්මුල් පාරවල් දෙකක් ගැහුවා. 'බස් එකක කෙල්ලෙකුටවත් යන්න දෙන්නේ නැහැ, වනචරයා ' කියලා. මට කියවුනා 'මම මුකුත් කලේ නැහැ' කියලා. පේරාදෙණිය හරියේදී මිනිහෙක් බහින්න හදන කොට කෑ ගහලා කියනවා 'මගේ කකුළු බෑග් එක කපාගෙන කුළුවෝ සේරම වගේ එලියට ඇවිල්ලා' කියලා. මිනිහා බස් එක පුරාම සක්මන් කරපු හිටපු කකුළුවෝ එකතු කරන්න පටන් ගත්තා. බලනකොට එක කකුළුවෙක් ඒ කෙල්ලගේ කකුල හපලා. නුවරදී අම්මයි දූවයි ඉක්මනට බස් එකෙන් බැහැලා ගියා මගේ දිහා නෙවෙයි බැලුවෙත්. මම නුවර මැද තියෙන මුස්ලිම් හෝටලේට ගිහින් බිත්තර ගෝදම්බ රොටියක් කාලා (ප්ලේන් රොටිත් එක්ක), ටින්කිරි තේ එකක් බිලා පොලිටෙක්නික් හොස්ටල් එකට ගියා. කාටවත් කිවුවේ නැහැ මේ කථාව.

202. අපි මහියංගනේ කැලේ ඇවිදින්න ගිය වෙලේ (නිල්ගල) අපේ කණ්ඩායමේ හිටපු නංගියෙක් ලස්සනයි කියලා නියගලා

මලක් කඩලා ඔලුවේ ගහගෙන, පස්සේ එය කටේ දමාගන. බිබිලේ ඉස්පිරිතාලෙට ගෙනියන කම්ම වාහනයේදී (ත්‍රීවීල් එකේ) මාරුවෙන් මාරුවට වතුරයි, පොල්කිරියි පොව පොවා කාපුවා එලියට ඇද්දෙව්වා.

203. මගේ මිතුරියක් සති අන්තයේ ගමේ යනවිට නගරාන්තර බස් රියක ආසන වලට උඩින් තිබෙන රැක් එකේ ඇඳුම් බෑග් එක තියලා. ගෙදර ගිහින් ඇරලා බලන විට කමිස සරම් ගඳ ගහන කිලිටි ඇඳුම් තුවා ආදිය පිරි ගමන් මල්ලකට ඇගේ බෑග් එක මාරු වෙලා බව පෙනිලා. හොඳ වෙලාවට ඇගේ ඇඳුම් මල්ලේ තිබුන නොම්මර ලියූ දින පොතක තිබුන දුරකථන නොම්මරයක් ඔස්සේ ගොසින් අර අනිත් බෑග් අයිතිකාරයා කොහොම හරි ඇයව සොයාගෙන. වසර 4 කට පෙර සිදුවූ මේ බෑග් හුවමාරුව අන්තිමට කෙලවර වුනේ ඔන්න ගිය මාසයේ ඒ දෙදෙනා අතර පැවති විවාහ මංගල්‍යයෙන්.

204. කොළඹින් රෑ බදුලු කෝච්චියෙන් පේරාදෙණියට ඇවිත් පේරාදෙණිය බස් ස්ටෑන්ඩ් එකේ ගහලා තියෙන බස් එකක ඔලුව ගහගෙන නිදාගෙන, මුලින්ම තියෙන බස් එකෙන් (පාන්දර 5) හිඳගල මගේ බෝඩිමට එන්න පුරුද්දක් කරගෙන තිබුනා. දවසක් විඩාව වැඩි කමට බස් එකේ පස්ස සීට් එකේ බෑග් එකට ඔලුව තියාගෙන නිදා ගත්තා. හොඳට නින්ද ගියා. 5ට යන්න බස් එක ස්ටාර්ට් කරන කොට කොන්දොස්තර කථා කළා. ටිකට් ගන්න පර්ස් එක බැලුවා. දෙයයියනේ ඇඳන් හිටපු ඩෙනිම් කලිසමේ පිටුපස්ස සාක්කුව රේසර් පිහියකින් කපලා මගේ පර්ස් එක අරං. ටිකට් ගන්න සල්ලි නැති හින්දා

කොන්දොස්තරට කතාව කිවුවහම මිනිහා කියනවා, 'ඔයාගේ වාසනාවට පිටිපස්ස කැපුනේ නැත්තේ, ඔය රේසර් පිහි හරි මුවහත්' කියලා; මට නිකන් යන්න සැලැස්වූවා.

205. තරුණියක්, වයස 19යි. කොලඹ උසස් අධයාපනය ලබනවා. සති අන්තයේ ගෙදර එනවා නුවර, සමහර දිනවලට කොලඹ රැකියාව කරන එක් කුස උපන් අයියත් සමග එකට එනවා. එදත් එවැනි දවසක්. නමුත් දෙදෙනාට ලැබුනේ දෙපොලක ආසන දෙකක්. බසය කොළඹ - නුවර නගරාන්තයක්. තරුණිය ලග හිටිය කාගේ හරි පුතෙක් කඩවතට එනකොටම ඇයගේ කකුලට තට්ටු දාන්න අරගෙන. ටිකක් බලපුවම වැරදීමක් නොවන බවට ඇයට වැටහුනාලු. ඒ අතරම ඇය අතක් ඔහුගේ කකුල උඩින් තියලා කතාකරන්න පටන් ගත්තලු. නුවරට එනවිට සියලුම පවුලේ තොර තුරු ගෙදර සහ ජංගම දූරකථන අංක සියල්ල තරුණිය ලග (කඩුගන්නාවෙන් බහින්න ඕන මිනිහා නුවරට එනකම් ඇවිල්ලා). තරුණිය නුවර රේල් ගේට්ටුව පසුවෙද්දී ඉදිරි අසුනේ ඉන්න අයියාව පෙන්නලා කිව්වලු ඒ ඉන්නේ මගේ අයියා, මන් දුන් ඔය දුරකථන අංකයත් එයාගේ. මින් පස්සේ බස් එකේදී ගැහැනු ළමයින්ගේ කකුල් අතගාන්න එපා, අම්මාට කියල ඉක්මනට කසාදයක් බැදගන්න. ඔයාට බැරිනම් දූරකතනයෙන් මම ඔයාගේ අම්මට කියන්නම් කියලා. අර ළමයා දහස් වරක් සමාව ඉල්ලලා ගියාලු.

206. මම නයිනමඩමේ ඉඳිද්දී මගේ වීල් එකට ඇවිත් සුදු ජෝඩුවක් ඇහුවා කාමරයක් හොයාගන්න. මම දන්නා ගාන

අඩු තැනකට එක්ක ගියා, උදව් ගොඩාක් මම කළා. මට කිව්වා හෙට උදේ හතට ලොකු හයර් එකක් යන්න එන්න කියලා කන්තලේ දක්වා. මම උදේම ගියා ගෙදරටත් කියලා. දෙන්නා උදේම යන්න ගිහින්. මට ෆුල් කනුව.

207. උඹ මොකද බං ජීවිතාන්තය දක්වා හිරේ වැටුනේ කියලා හිරකාමරේ අනිත් හිරකරුවා ඇහුවා. මොර සුරණ වැස්සේ මම නියර දිහා බලා ඉඳිදිද්දී පවුල ඇහුවා මොකද ඔයා ඔහොම බලාගෙන ඉන්නේ කියලා. මං මඟ හැරලා ඉන්න බැලුවා, ඒකී මට මට ඉන්න දුන්නේම නැහැ, පන්න පන්නම ඇහුවා. පස්සේ මම කතාව මෙහෙම කිවුවා: උඹට මතකද මේ ගමේ හිටපු බබානිස්. ඔවු ඔවු ඌ එකපාරටම අතුරුදහන් වුනා නේ ඇය ඇහුවා. එදා අද වගේ මොරසුරණ වැස්ස. වැස්සේ මම දැක්කා බබානිස් නියරට එහායින් මගේ මායිම අල්ලා ගන්නවා. මමත් එතනට දුවගෙන ගියා. අපි දෙන්නා වාද උනා. පස්සේ මම උස්සල අතේ තිබ්බ උදැල්ලෙන් උගේ ඔලුවට කෙටුවා. ඌ වැටුනා. උගේ සිරුර මම කුඹුරට යට කලා. ලේ බුබුළු උඩට ආවා හරියට අද මේ වතුරු බුබුළු ඒ කුඹුරෙන්ම උඩට එන විදියට. මං මේ කුඹුර දිහා බලා හිටියේ ඒකයි. උඹ කාත් එක්කවත් මේ කථාව කියන්න එපා කියා මං මගේ ගෑනීට කීවා. කියන්නේ නෑ කියලා ඒකී දිවුරුවා. ඊට අවුරුදු 2ට පස්සේ ගෑනියි මමයි රන්ඩු වෙලා මම ගෑනිට ගහනකොට මෙන්න බබානිස් මරුවා වගේ මාවත් මරනවෝ කියාලා ගෑනී මුළු ගමටම ඇහෙන්න කෑගහන්න පටන් ගත්තා.ඕකෙන් තමයි මම මේ හිර කුඩුවෙන් කෙලවර උනේ. හිරකුඩුවේ යාලුවා

එතකොට කිවා 'තව කෙනෙකුට රහසක් කියනවද මෝඩයෝ කියලා'.

208. කුඹුරක් කොටා ගෙන දුක් මහන්සියෙන් දිවි සරිකර ගත් ගොවි පියෙක් අස්ථාන චෝදනාවකට වසර දෙකකට උසාවියෙන් අච්චු කරලා හිරේ විලංගුවේ වැටිලා සිර බත් කද්දී බිරින්දෑ බත් මුලකුත් බැද පොඩි ලියුන් කඩ දහියක ලියලා යල් කන්නයේ කුඹුර කොටා වී ටික වපුරා ගන්න විදියක් නැති කමෙන් වෙන පාඩුව කියලා පොඩි කොලුවා අත යවලා හිරේ ඉන්න පියාට ගිහින් දෙන්න කියලා.ලිපිය කියවූ පියා කොලේ පිටුපස අනේ එහෙනම් මම එනකම් හාමිනේ කුඹුරේ අඩියක් යටින් වලදාලා හංගලා තියෙන රත්තරන් ටිකෙන් කොටහක් අරගෙන මුදල් කර ජීවත් වෙන්න කියල ලියලා යවලා. මේක බලපු ජේලර් කෙනෙක් යාළුවො එක්ක ගිහින් මුළු කුඹුරම කොටලා හොයලා බලලා රත්තරන් හංගපුවා ටික ඒගොල්ලන්ට පාදා ගත්තා. ටික දවසකින් අයෙත් ලිපියක් එවලා දුක දන්න ජේලර් මහත්වරු ටිකක් ඇවිත් කුඹුර කොටලා දීලා ගියා, දැන් වපුරන්න විතරයි තියෙන්නේ කියලා. එහෙනම් ඉතින් වපුරා ගනින් කියලා පිලිතුරුකුත් යවලා පෙර විදියටම. රහසක් රැකෙන්නේ උපරිමවම දෙන්නෙක් අතර විතරයි.

209. දවසක් හාමුදුරුවරු දෙන්නෙක් ගඟකින් එගොඩ වෙන්න විදිහක් කල්පනා කළා.රෑ බෝවීගෙනත් එනවා.පස්සේ ටිකක් එහායින් තරුණ ලස්සන කාන්තාවක් අඬනවා, අනේ හාමුදුරුවනේ මාවත් අරන් යන්න, මගේ ළමයි බඩගින්නේ තනියම. මෙතන මං තනි වුණොත් සත්තු කාවි.අනේ මාවත්

එගොඩ කරන්න කියලා. හාමුදුරුවරු දෙන්නට දුකයි. මොනවා කරන්නද? දාලා යන්නත් බැහැ. අරගෙන යන්නත් බැහැ. ඒ පාර ලොකු හාමුදුරුවෝ කිව්වා පොඩි හාමුදුරුවනේ, මේ සිවුර ඔබ වහන්සේ ගන්න. මම අදනකඩය පිටින් මේ කාන්තාව එගොඩ කරනවා. කියලා. පොඩි අමුදුරුවෝ අන්දුන් කුන්දුන් වුණා. ලොකු හාමුදුරුවෝ අර කාන්තාව උරහිසට අරගෙන ගඟෙන් එගොඩට පීනලා ගිහින් දැම්මා. අර කාන්තාව පින්දුන්නා. හාමුදුරුවෝ කිව්වා සුවපත් වේවා කියලා. පස්සේ හාමුදුරුවරු පන්සලට වැඩියා, කතා නැතුවම. ඊට පහුවදා ඉඳලා පොඩි හාමුදුරුවෝ ලොකු හාමුදුරුවන්ට වැඩිය ගරු කරන්නේ නැහැ.දවස් කීපයක් ගියාට පස්සේ ලොකු හාමුදුරුවෝ ඇහුවා මොකද වෙලා තියෙන්නේ කියලා. එතකොට පොඩි හාමුදුරුවෝ කියනවා ඔබ වහන්සේ එදා රූ නාඳුනන කාන්තාවක් කරේ තියාගෙන ආවා. ඉන්පස්සේ ඔබවහන්සේ පාරජිකයි කියලා. ඒ නිසා මම ඔබ වහන්සේට ගරු කරන්නේ නැහැ කියලා. ඒ පාර ලොකු හාමුදුරුවෝ කියනවා, අනේ පොඩි හාමුදුරුවනේ, මම ඒ කාන්තාවට පිහිටක් වුණා වෙලාවේ හැටියට. දැන් ඒ ගැන හිතන්න වෙලාවක් නැහැ. ඒක ඒ වෙලාවේම මගේ හිතෙන් බැහැර කළා. ඔබවහන්සේ තවමත් ඒ කාන්තාව කරේ තියාගෙන නේද මට මේ කරදර කරන්න එන්නේ. එහෙම නම් ඔබවහන්සේ භාවනා කරන සිත මගේ ක්‍රියාවටත් වඩා පලුදු කරගෙනනේ කියලා. පොඩි හාමුදුරුවෝ වැඳලා සමාව ගත්තා.

210. මේ ගෙදර තිබුනේ ගාල්ල ඇල්පිටිය ප්‍රධාන පාර අයිනේම; පොඩි කඩයකුත් තිබුනා. ගෙදර ඉස්සරහ කැල්ලේ දවල්ට

ඉන්නේ අම්මා විතරයි. මයිනා ඉන්නේ කඬේ කැල්ලේ එල්ලපු කුඩුවේ කඬේ ඇරලා මේ අම්මා කුස්සියේ වැඩ කරන වෙලාවට කඬේට කවුරු හරි අවොත්, මයිනා කෑ ගහනවා 'අම්මේ කඬේට ආවෝ'. දවසක් මේ මයිනාව මාතර කෙනෙක් (ඒ ගමේ නෑ ගෙදරක ආපු ගමන් ) හොරෙන් අරන් ගිහින්. දවස් තුනකට පස්සේ මයිනා ඇවිත් 'අම්මේ මං ආවෝ' කිව්වලු. මේ අම්මට හරි සතුටෙන් උන්නා. කාලයක් ගිහින් මයිනා මැරුණම මේ අම්මා ඇඬුවේ තමන්ගේ දරුවෙක් මලා වගේ පාංශුකූලෙත් දුන්නා. තුන් මාසේ දානෙත් දුන්නා.

211. පාසැල් නිවාඩුවේ තාත්තා අපව අනුරාධපුර, පොළොන්නරුව බලන්න එක්කන් ගිහින් සවස පොලොන්නරුව තානායමට වාහනය පැදවුයේ එහි රාත්‍රී නවාතැන ගත කිරීමටයි. කාමර පිළිබඳව අසන විටදී කළමනාකරු තාත්තාට කිවා 'සර්, මහා රැජින නාවාතැන් ගත්ත කාමරය තියෙනවා පරාක්‍රම සමුද්‍රයට මුහුණ දාපු ලොකු කාමරේ, සර්ට ඕන නම් ඒ කාමරය දෙන්නම්, ඕනා නම් මහා රැජින නිදා ගත්ත ඇඳත් දාලා දුන්නැකි, හැබැයි එහෙනම් අමතර ගෙවන්න වෙනවා'. තාත්තා 'හා' කිවා. කාමරේ සකස් කරලා දුන්නට පස්සේ මිනිහා හිනාවෙලා කියනවා 'සර් ඔන්න ඒ ඇඳ දාලා, කාමරේ දැන් ලැස්තියි, පස්සේ දවසක කිව්වට කමක් නැහැ මහා රැජින නිදා ගත් ඇඳේ නිදා ගත්තා කියලා, හැබැයි මහා රැජිනත් එක්ක නිදා ගත්තා කියලා කියන්න නම් එපා' කියලා.

# ● වෛද්‍ය සේවය

212. 1960 මුල් භාගයේ ලංකාවේ ප්‍රමුඛ පෙලේ පවුලක දුවක ඔපරේෂන් එකට බඳුන් උනා කොළඹ 7 ප්‍රධාන පුද්ගලික ඉස්පිරිතාලයක (දැන් වෙන තැනකට ගෙනිහිල්ලා). ලංකාවේ එවකට සිටි නොම්මර එකේ ශල්‍ය වෛද්‍යවරයා. අපේ ආතාත් ඇඩ්මිට් කරලා තිබුනේ ඒ ඉස්පිරිතාලේම. දුවගේ ශල්‍ය කර්මය හිතුවට වඩා වෙලා යනකොට ඒ මහා ධානපතියා වහලේ උළු ගලෝලා ශල්‍ය කර්මය කරනවා වහල උඩින් බලන්න කියලා විධානේ දීලා. අනේ ඒත් දුව මිය ගිහින් – ඇපන්ඩිසයිටිස් වලින්. එයාගේ නමින් හදපු පුස්ථකාලයක් අදත් තියෙනවා.

213. එකම වැඩේට දෙපාරක් එන්නේ මොකද කියල ඉවසල ඉවසලා බැරිම තැන දෙවැනි එන්නතින් පසුව වෛද්‍යවරයා ලඟට ගිහිල්ලා කිව්වා මේ වගේ කැත වැඩ තවත් වෙන්න දෙන්න එපා, මට මේ හෙදියගේ දත් කුට්ටම ගලවන්න හිතෙන්න ඉස්සෙල්ල මගේ දත ගලවන්න කිව්වා. ඉතින් ඔහු සමාවෙන්න කියල හිනා වේවී දත ගල්ලෙව්වා.

214. සතියට බොහෝ දිනක් රෝහලට පැමිණි ඒ වගේම තාප්පය අයිනේ විට කෙල ගැසීම නිසා, නිතිපතාම රෝහලේ ගේට්ටු මුරකරුගේ දෝෂ දර්ශනයට මෙන්ම වාග් ප්‍රහාරවලට ලක්වුනත් , දැඩි රෝගී බැවින් පෙළුණු වයෝවෘද සීයා හැමවිටම මුරකරු දෙස බැලුවේ සිනා පිරි මුහුණෙනි. දිනක් එම සීයා මුරකරු අත කඩදාසි කැබැල්ලක් තබා යන්නට

ගියේය.' දරුවා, ඔන්න මගෙන් ඔය දරුවා නිදහස්, මීට වඩා මට බෙහෙත් වලින් වැඩක් නැතිලු. ඉතින් මෙහෙන් විතරක් නෙවෙයි, මුළු ලෝකෙන්ම මම ඉක්මනටම යනවා. ඒත් මට දුක ඔය දරුවා ගැන. මම වගේ අය හින්ද තරහෙන් පුපුර පුපුර තව ගොඩක් කල් ඔය ළමය ඔතන ඉන්න එපායැ.' නයාට අඳුකොල මෙන් සිටි ඔහු වෙනුවෙන් මුරකරුගේ නෙතින් කඳුලක් වැටුනේ ඇයි දැයි ඔහුම දන්නේ නැත.

215. දත් දොස්තර මහත්තයා අපේ ලොකු අයියගේ රිදෙන දත තියෙද්දී හොඳ දතක් ගැලෙව්වා වැරදීමකින්. ඊට පස්සේ 'සොරි' කියලා රිදෙන දත ගැලෙව්වා. හොඳ වෙලාවට ලොකු අයියාගේ වයසට දත් වැටෙන කාලේ මේ සිද්ධිය උනේ. ඇමරිකාවේදී එහෙම ඕක උනානම් එයා දත් ගලෝලා ඉවරයි කියලා ඇමරිකාවේ ජීවත්වෙන අයියා හිනාවෙලා කිවුවා.

216. මිට කාලෙකට ඉස්සෙල්ලා පටන් ගත්ත අලුත්ම සෙල්ලම දන්නවද? දොස්තර මහත්තයාව කලින් චැනල් කරලා එනවා නම් 1500යි. ඊටපස්සේ චැනල් එකක් ගන්න ගියාම කියනවා අද දොස්තර මහත්තයා බලන්නේ 25 යි, 26 වෙනියා බලනවා නම් 2000 යි කියලා. ඉතින් තට්ටු හතරක් ගෙදරට දාගන්න එක දොස්තර මහතාට සුළු දෙයක් නේ (හැබැයි ගොඩක් තැන්වල මේ වැඩේ දැන් නවත්තලා කියලයි කියන්නේ).

217. චැනල් ක්‍රමය නිසා සමහර විශේෂඥය වෛද්‍යවරු වෛද්‍ය මුදලාලිලා වෙලා. වැඩිදුර උගෙනීමට, තම දැනුම දියුණු කර

ගැනීමට වෛද්‍ය පොත් පත්/ සඟරා කියවන්න ඒ අයට කාලය තියෙනවද?

218. මේ විශේෂඥය වෛද්‍යවරු චැනල් සේවය සඳහා කාලය ගත කරන විදියට ඒ අයට පොත් කියවලා දැනුම් ගන්න නෙවෙයි කන්න බොන්න, පවුලේ දරුවන් ගැන සොයා බලන්න තියා නිදා ගන්නවත් වෙලාව තියෙනවද කියලා සැකයි. සල්ලිම හම්බු කරන්න ගිහිල්ලා අන්තිමට ලෙඩ වෙන්නේ මේ රටක් වටිනා වෛද්‍යවරු.

219. දතේ චූටි සිදුරක් තිබ්ලා වැඩි හොඳට කියල පුරවගන්න ගියා. දෙතුන් පාරක් දත් දොස්තර ගාවට යන්නත් උනා. අන්තිමේදී දත ගලවලයි නැවතුනේ. දත් දොස්තර ගාවට නොගිහින් හිටියා නම් තාම මගේ දත තියෙනවා. සමහර දත් දොස්තරලගේ වැඩ ඔහොමයි.

220. කොළඹ පුද්ගලික රෝහලක ඉල්ලක්කම් හයක සල්ලි අරගෙන බයිපාස් එකක් කරලා නමුත් ඕන කැල්ල නොවෙයි කපල තිබුනේ. ඊට පස්සේ රජයේ රෝහලකින් තමයි හරි විදිහට ආයෙත් බයිපාස් එක නොමිලේ කරගෙන තියෙන්නේ.

221. රජයේ රෝහල් වල ජීවකලා ඉන්නවා, වැඩිමනත් තරුණ වෛද්‍යවරු. කඩියෝ වගේ වැඩ කරන්නේ. ලෙඩ්ඩුන්ට ආදරයෙන්, හරි කරුණාවෙන් කථා කරනවා. අනේ වසනා!

222. සමහර දොස්තරලා අද වෙදකමට වඩා සල්ලි සොයන මැෂින්වෙලා. රෑ 11ට ඕෆ් වෙලා ආයි පාන්දර 7ට පටන් ගන්න දොස්තර කෙනෙක් කොළඹ අවට ඉන්නවා.

223. මීට අවුරුදු 12ට පෙර මම නුවර තැනකට ගියා දතක් ගළවාගන්න. බොහෝ වෙලාවකට පස්සේ හිරිවැටෙන්න එන්නතක් විද්දා. එතන වැඩකළ හෙදිය එයා හඳුනන රෝගීන් වරින්වර ඇතුළට ගත්තා. මමත් පැයක් පමණ වාඩිවෙලා හිටියා. දැන් මගේ කටේ හිරිය නැතිවෙලා ගිහින්.මේ ගැන හෙදියට කිවුවම තවත් එන්නතක් විදිමු කිවුවා.හෙදිය ඇතුළට යනකන් ඉදලා මම ගෙදර ආවා. ඒ දත තවම තිබෙනවා.

# • හෝටල්

224. දවසක් මීගමු වෙරල පැත්තේ ගියා පවුලේ අයත් එක්ක. එතන තියනවා කොත්තු හදන තැනක්. අපි හැමෝම කොත්තු කෑවා. වැඩිපුර කොත්තු පිඟානෙම ඉතුරු කරලා හැමෝම වතුර පාගන්න පහලට ගියා. මම කොත්තු ගහන හැටි බලන් හිටියා. අර අපි කාලා ඉතුරු කරපු කොත්තු ටික කලවම් කරනවා මම දැක්කා තවත් හදන කොත්තුවකට. ඒ කියන්නේ අපිත් කන්න ඇත්තේ කවුරුහරි කාපු කොත්තු වෙන්න ඇති.

225. බොහෝ හෝටල්වල මේසයේ කාලා දීසී වල ඉතුරුවන ආහාර ආපසු බෙදූ භාජනවලටම දානවා ඒවා නැවත විකුනනවා. එක වැරද්දක් බව දන දැනත් ලාබය පිණිස එය කරනවා.

226. නුගේගොඩ හයිලෙවල් පාරේ හෝටලයක මේසයට තබන කෑම, ඉතුරු වුනොත් කෑම කාපු අයටම ගෙනියන්න පාර්සල් කර දෙනවා. නැත්නම් විසිකරනවා. ඒක හොඳ වැඩක්.

227. ගෙදර හදන ආප්ප මිශ්‍රණයෙන් කවදාවත් ආප්ප පිපෙන්නේ නැහැ, ගලවන්නත් අමාරුයි. දවසක් මම ගේ ළඟ හෝටලේ ආප්ප බාස් ගෙන් ඇහුවා, මිනිහා දුන්නා මිනිහාගේ මිශ්‍රණයෙන් චුට්ටක්. දාලා කලවම් කරන්න කියා කීවා. ආප්ප නියමෙට පිපුනා/ගැලවුනා. ඇහුවහම මිනිහා කියනවා වයින් වගේලු

ආප්ප මිශ්‍රණයත්. පරණ වෙන්න වෙන්නමලු හොඳ. මම මගේ පිපෙන්නේ නැති, ගැලවෙන්නේ නැති ආප්ප මිශ්‍රණයටම ගියා.

228. අති ප්‍රසිද්ධ ආහාර ජාලයක අවන් හලකින් චිප්ස් සමඟ බර්ගර් එකක් සැලඩ් බඳුනක්ද සමඟ මිලදී ගත්තා. සැලඩ් එකේ ලෙටුස් කොලේ යට පොඩි සුදුපාට පණුවෙක් දඟලමින් සිටියා. වේටර්ට කිවුවා. මිනිහා වහාම ඒක අරං ගිහින් කසළ බඳුනට දැම්මා. පස්සේ මැනේජර් එක්ක මොනවද කියා මුණු මුණු ගෑවා. මැනේජර් කීප වරක් මා දිහා බැලුවේ අවිශ්වාසෙන් වගේ. පස්සේ අලුත් සැලඩ් බඳුනක් ගෙනවිත් මගෙන් ඒකට රුපියල් 85ක් නැවත ඉල්ලුවා. මම ගෙවා දමා කෑවා. මා ඉස්සරහ හිටපු උගත් මහතා කිවුවා 'පුතා, ඔයාට ඕක ලන්ඩන් වලදී උනා නම් ඒ රටේ තියෙන මේ ආහාර ජාලයෙන් මාසෙකට කෑම ඔයාට හැමදාම ගෙදරට නිකන් එවයි' කියා. එයා එංගලන්තේ වෙසෙන ලාංකිකයෙක් නිවාඩුවකට ඇවිල්ලා.

229. මම ගිය සතියේ ගියා සය්ප්‍රස් වල 'පීඩ්සා එක්ස්ප්‍රස්' එකට, ඇනවුම් කරලා සැහෙන වෙලා ගියා අපේ ඇනවුම ලැබෙන්න. කන්න බලනකොට සැහෙන නිවිලා. නමුත් අලුත් එකක් ගෙන්න කිව්වොත් තවත් වෙලා යන නිසා අපි ඒකම කනවා කියල හිතුවා අමාරුවෙන් හරි. බිල ගෙවන්න ගියහම කළමනාකරු ඇහුවා කොහොමද පීඩ්සා එක ගැන සතුටුද කියල. මම අඩුපාඩුව පෙන්නලා දුන්නම බොහොම බගැපත්ව සමාව ඉල්ලලා මුදල් අයකරන්නෙත් නැතුව ඊළඟ සැරේටත් නොමිලේ පීඩ්සා ගන්න කුපනයක් දුන්නා.

230. මගේ නංගි වැඩ කරන්නේ මෙල්බර්න් අවන්හලක. කොයි වෙලෙත් බිත්තර බටර් ගාලා සැන්ඩ්වි පාන් හදනවා; හොඳ සල්ලි – පැයට ඩොලර් 24 යි.

231. රස්සාවක් තිබ්බෙම නැති කාලේ ටවුන් හෝල් පැත්තේ හෝටලේක ටී මේකර් වැඩකට ගියා පත්තරේ දැන්වීමකට. හැබැයි දුන්නේ දවල් බුෆේ එක හදන්න. ජීවිතේට උයලා තිබුනේ නැහැ. බතුයි මාළු 5කුයි උයලා, බුෆේ ට්‍රේ වලටත් දාන්න ඕන. අම්මේ කෙනෙක් හිටියා අත් උදව්වට, එයා තමයි පහේ වර්ග මට දාන හැටි කියලා දුන්නේ. පඩිය හොඳ හිංදා මාස 3ක් ඉඳලා, හෝටලේට ආව මුස්ලිම් මහත්තයෙක්ගේ මාර්ගයෙන් මිඩ්ල් ඊස්ට් පැන ගත්තා. දැන් මම ඉන්නේ ඩුබායි වල ලොකු හෝටලේක. එක්ස්පර්ට් බුෆේ කුක් කෙනෙක්. මාසෙකට ලක්ෂෙකට එහා පැත්තේ හොයනවා.

232. අරාබි ජාතිකයින් තුන් දෙනෙක් ලැට්වියා රටේ හෝටලේකට ගියා. තුන් දෙනාට කෑම ගෙන්නුවා. ඒත් එයින් අඩක් වත් ඉවර කලේ නෑ. ඉතිරි කරලා නැගිටලා යන්න හදනකොට ඊළඟ මේසේ හිටපු වයෝ වෘද්ධ කාන්තාවක් ඔවුන්ට කිවා කන්න බැරිනම් ඒවා අරන් යන්න කියලා. ඔවුන් කිව්වා අපට ඕනේ නෑ කියලා. කාන්තාව කිව්වා එහෙම කෑම අහක දන්නා බෑ මේවා හදන්න ලෝකේ සම්පත් ගොඩක් වැය වෙනවා කියලා. ඔවුන් කිව්වා අපි ඒවාට සල්ලි ගෙවලා තියෙන්නේ කියලා. අන්තිමට කාන්තාව පොලිසියට කතා කළා. ඔවුන් ඇවිත් කිව්වා ඔයාලට සල්ලි ඕනේ තරම් ඇති ඒක

අපට අදාළ නෑ. එත් මිලදී ගත යුත්තේ තමන්ට කෑමට හැකි ප්‍රමාණය පමණයි. ආහාර ඉවත දමන්න බෑ. කරුණා කරලා අරගෙන යන්න කියලා. බොහොම ලජ්ජාවෙන් ඔවුන් අරන් ගියා.

233. කොළඹ හෝටලයක පිටි අනන පළපුරුදු බක්කරේ කෙනෙක් දවසක් මුදලාලි එක්ක පඩියට රන්ඩු වෙලා අනපු පිටි වලින්ම මුදලාලිගේ මුණ තවරලා එලියට බැස්සා. මිනිහා කියනවා හැම මාසෙම රුපියල් 2000ක් විතර අඩුවෙන්ලු ගෙවලා තියෙන්නේ.

234. දවස් 3, 4 ක් හෝ ඊට වඩා කල් ඉකුත්වූ මස් මාළු හොදි කොත්තු වලට සමහර කඩවල කලවම් කරනවා කියලා මට කිව්වුවේ හෝටලේක කොත්තු ගහන කොල්ලෙක්.

235. හෝටලයේ හොඳටම බිවු විධායක නිලධාරියෙක් රුපියල් 990ක්වූ සිය බිල ගෙවුවේ රුපියල් 1000 නොට්ටුවකින්. තරුණ වේටර් ඉතිරි රුපියල් 10 නොගෙන ආ නිසා ඔහුගෙන් ඒ ගැන විමසුවා. තරුණ වේටර් කැෂියර්ගෙන් ඉතුරු සල්ලි ලබා ගෙන තිබුනෙවත් නැහැ. තමන්ට ටිප් එකක් නොලැබෙන් බව දත් තරුණ වේටර් සමච්චලයට මෙන් තමන්ගේ අතිනුත් රුපියල් 10ක් දමා රුපියල් 20ක් විධායක නිලධාරිඉදිරියට දමා ගැසුවා. මෙවෙලේ විධායක නිලධාරියා අතේ වෙනම රුපියල් 100ක් නමා තියාගෙන ගෙන සිටියේ සැමදාම වේටර්ට දෙන රුපියල් 100 ටිප් එක එය නිසායි. විධායක නිලධාරියා ටිප් එක

නොගෙවා, තමාට හිමි රුපියල් 10ද ගෙන, වැඩිපුර දුන් රුපියල් 10 මේසය මතම  තබා, තරුණ වේටර්ට ආචාර කර යනවා දුටු හෙඩ් වේටර්ගෙන් තරුණ වේටර්ට එදා හම්බ උනේ හොඳ දොස් මුරයක්.

236. කරාපිටියේ හෝටලයකින් දවල්ට බත් ඕඩර් කළා. බත් ඉදිලා මදි. හාල් විකෙනවා. අපි මුදලාලිට කිව්වා 'හාල් ටික පාර්සල් කරලා දෙන්න, අපි ගෙදර ගිහිල්ල උයා ගන්නම්' කියලා.

237. සමහරු හෝටලේ කාල ඉතුරු වෙච්ච ටික පාර්සල් කරල අරගෙන යන්නෙ ඩොගියට කියලා. ඩොගිය ඒවා දකින්නෙවත් නැහැ.

238. ආපන ශාලාවක, වේටර්වරයෙකු විකිණීමට තිබෙන බැදපු කුකුල් මස්  හොරෙන් කනවා අයිතිකාරයා දැක්කා. එදායින් පස්සේ හැමදාම වැඩ ඇරිලා යනකොට ඉතිරි වෙච්ච බැදපු කුකුල් මස් පාර්සල් කරලා වේටර්ට දෙනවා ගෙදර ගෙනියන්න. දවස් පහකට පස්සේ වේටර් අස් වෙලා ගියාම අයිතිකාරයාගේ මුවඟට චපල සිනහවක් නැගුනා.

239. දවසක් මිතුරෝ දෙන්නෙක් එක්ක කොළඹින් එපිට ප්‍රසිද්ධ රජයේ තානයමකින් දවල්ට හොඳට කෑවා. වේටර් කිට්ටු කරලා මට කියනවා - 'සර් තුන්දෙනාගේ කෑමට බිලක් දැම්මොත් ලොකු ගානක් වෙනවා, මම දෙන්නෙකුට විතරක් දාන්නම්; සර්

මට මිලෙන් 2/3 විතරක් දීලා යන්න. 1/3 මට අනිත් 1/3 මැනේජර්ට' කියලා.

240. දවසක් වැඩ නිමවී ගෙදර යන යාලුවෝ දෙන්නෙක් හෝටලයකින් කෑම කද්දී මැරුණු කැරපොත්තෙක් බත් එකේ ඉදලා. ඒ ගැන පැමිණිලි කරන්න කඩේ අයිති මුදලාලි කෝ කියලා සේවකයකුන් ඇසූ විට පොඩ්ඩකට බැහැරකට ගිහින් බව දැනගන්න ලැබුණි. පැයක් විතර බලා ඉදලා ආයෙත් අහලා කොහෙද ගියේ ඉක්මනට එයිද කියලත් අහලා. එවිට දැනගන්න ලැබුනේ මුදලාලි දවල් කෑම කන්නේ වෙනත් හෝටලයකින්ලු. එසැනින් යාලුවෝ දෙන්නා කිසිත් නොකියා නැගිට යන්න ගියේලු.

241. මවක් පියා හා දරුවන් දෙදෙනකු අසල වූ මේසයෙහි කෑම කමින් සිටි අතර දරුවෝ කට්ලට් හා රෝල්ස් කීපයක් ගෙන මදක් කා 'ඌයියා මිරිස්' කියා ඒවා පසෙක තබා තවත් කෑම වර්ග ගැනීමට අත දැමූහ. ඔවුන් ගිය පසු වේටර් ඒ කෑම පිඟාන අලුතින් කෑමට ආ යුවලකට ගෙනත් තිබ්බා.

242. මම නාඋල හෝටලේක වැඩ කරද්දී නිතරම වෙන දෙයක්: ඔය වන්දනාවේ වගේ බස් වල එන අයට මෙසේ උඩට කෑම බන්දේසි දාලා තිබුනහම සමහර මේසවලට වාඩිවෙන අය ඒවා අරගෙන කාලා ගෙවන්නේ නැතුව හිමිහිට මාරු වෙනවා. මේක නඩයේ තුන් හතර දෙනෙක් කථා වෙලා කරන වැඩක්, අල්ලන්න හරි අමාරුයි. මොකද හෝටලේ එක පාරටම සෙනගින් පිරෙනවා, අපිට මේස කිහිපයක් එක සැරේ බලන්න

අමාරුයි. අනික ඒ අය සුක්ෂම හොරු. බසයේ ඒ අයත් එක්ක ගමන යන අනිත් මිනිස්සුත් දන්නේ නැහැ ඔවුන් අතර මේ හොරු ගමන් කරනවා කියා. අන්තිමට මුදලාලිට තෙරුනාහම බනින්නේ අප සියළු දෙනාටම.

243. මං වැඩකරපු හෝටලේ සමහරු වැඩියෙන් කාලා මෙසේ උඩ බන්දේසියෙන් ගත්තේ  මොනවාද කිව්වාම අඩුවෙන් දේවල් කියනවා.

244. දවස් ගාණකින් කුසට අහරක් නොලැබුන අසරණයෙක් සයිවර් කඩේකට ගිහින් බඩ පිරෙන්නම කෑම කැවාලු. ගෙවන්න මුදල් නැහැ කීවාම හෝටලේ මුළුතැන් ගෙට ඇරලා, කාපු කෑමවල වටිනාකමට තියෙන වැඩක් පළක් කරලා යන්න කීවාලු. වැඩ ඉවර කරලා දීලා හෝටලෙන් එළියට එනකොට මුලදී තිබ්බ බඩගින්න දෙගුණ,තෙගුණ වෙලා තිබ්බාලු, හැබැයි ආයි  කන්න දීලා නැහැල්ලූ.

245. මම වැඩකරපු ඊ කොත්තු කඩේ කප්පම් කොත්තු කියලා ජාතියක් තියනවා. ඒක හදන්නේ මෙහෙමයි - කාලා ඉතුරුවෙන කොත්තු වෙනම අරන් තියනවා. රැට කප්පම් එකතු කරන්න එන හෝටලයට ගොඩවෙන  එවුන්ට දෙන්න. මුදලාලි සමහර වෙලාවට කියනවා කෙල ගහලා දීපන් කියලා (අපි එහෙම කලේ නැහැ).  ඇයි, උන් කන කොත්තු වලට සල්ලි දෙන්නේ නැහැනේ.

246. මම වෙන්නපුවේ හෝටලේක වැඩ කරන කාලේ - හෝටලේ  නිතරම වෙන දෙයක්: සොසේජස් බන්ස් මේසෙට

තියෙන කෑම තැටියෙන් අරගෙන සොසේජ් එක කාලා බනිස් එක අනිත් පැත්ත හරවලා තියෙනවා. හිලව්වට බොරුවට තැටියේ තියෙන වඩේ එකක් කනවා.

247. මම වැඩ කරපු කඩේ සමහරු (බස් වල එන නඩ එහෙම) වැඩියෙන් කාලා ගත්තෙ මොනවාද කිව්වාම අඩුවෙන් දේවල් කියනවා.

248. මාතර –අනුරාධපුර බසයේ මාගේ අසුන ළඟින් වාඩිවී ගිය තරුණිය බසය තේ බොන්න නැවැත්වූ වෙලේ සිසිල් බීම බෝතලයක් පමණක් අරගෙන මා සිටින මේසයේම වාඩි විය. මාද සිසිල් බීම බෝතලයක් පමණක් බොන බව දුටු ඇය කථා කරමින්, ‘මමත් අයියේ කවදාවත් මේ හෝටලෙන් කන්නෙ නැහැ. කාටද පුළුවන් මේ කෑම කන්න. තිබහා යන්න ඔය කූල් එකක් බීලා ආයේ බස් එකේ නගිනවා; නිකන් මොනවටද ජරාව කාලා ලෙඩ හදා ගන්නේ. මං සතියකට සැරයක් මේ පාරේ යනවා’, කියා කිවා.

249. මා එම හෝටලයේ මුලුතැන් ගෙය මැදින් පිලිකන්නට ගියේ වැසිකිලියට යාමට. හෝටලේ කෝකියා හෝ ඔහුගේ ගෝලයෙක් යයි සිතිය හැකි කොන්ඩය සහ රැවුල අපිලිවෙලට වවා ගත් නිරුවත් උඩුකයෙන් සහ කිළිටි සරං කඩමාල්ලක් ඉණට දවටාගෙන, දාඩියෙන් මුළු ගතම වෙලාගත් අයෙක් මට මෙසේ කෑගසන්නට විය – ‘හා හා, මේ පැත්තෙන් නෙමෙයි එළියෙන් යන්න, ඔහේලා ඔක්කොම මේ කුස්සිය මැදින් ගිහිං බිම ජරා කරාම?’ කියා මා දෙස ඔරවා බැලුවා. ඇත්තටම ඒ

මුළුතැන්ගෙයි මැදින් ගියාට එහි අලුතින් ජරා වෙන්නට දෙයක් තිබුනේ නැත. කැඩුණු කළු පැහැ ගැන්වුනු සිමෙන්ති පොළවම වතුර හැලී මඩ වී තිබු අතර තැන් තැන් වල අපිළිවෙලට කපා දාමා ඇති එලවලු වර්ගය. මේසය මත එකෙක් කිළටි දැතින් කොත්තු සඳහා රොටි කපයි. තවකෙක් බිම දපාගෙන කුකුල්ලු හත් අට දෙනෙක් කුට්ටි කරමින් සිටී. ඔහු වටේ පූසෙක් සහ බල්ලෙක් කැරකුන අතර ඈතින් කාක්කන් කරෝ කරෝ ගා බොකු බඩවැල් තරහෙට ඉල්ලමින් සිටියා. තවත්, කාන්තාවක් පිළිකන්නේ හිඳගෙන කූඩයකට කුණු වෙච්ච එනු, හොඳ එනු වලින් තෝරමින් කුනුවෙච්චා ඒවා මිදුලට විසි කරමින් සිටියා. මගීන්/සේවකයන් සඳහා වෙන්වුනු වැසිකිලියෙන් හමන දුගඳ නැතිකරන්නට හෝ ගාලා ඇවිලෙන රබර් දර ලිපෙන් සහ තේ වතුර බොයිලේරුවෙන් හමන දුම් ගඳට නම් කිසිසේත්ම නොහැකි විය. මා 'වැසිකිලි යාම කල් දමමි' යයි මටම කියා බසය තුලට ගොඩ වැදුනෙමි.

250. කතරගම/කොළඹ - ත්‍රිකුණාමල බස් රූට් එකේ කෑම කන්න නවත්වන සමහර හෝටලවල වැසිකිලි නැත. ඇති ඒවායේ ඇත්තේ යාමට නොහැකි තත්ත්වයකි. එක් තේ බොන්න/කෑම කන්න නවත්වන මහා හෝටලයක වැසිකිලියට යන මාර්ගය එක දිගටම මඩ, පස් සහ මුත්‍රා වලින් පිරී තිබුනා. එහි බොහෝ විට සමහර වැසිකිලි වල අසුචි කර, එසේම තියෙන්නට හැර මගීහු පිටව ගොස් තිබුනේ වතුර නැති කම නිසායි. මෙම වැසිකිලි වලින් හමන දුගඳ සෘජුවම කෑම කන අයටද බලපායි. වැසිකිලිවලින් පියඹා එන මැස්සෝ/නිල මැස්සෝ පසුව අවුත් කෑමට වහති. බොහෝ දෙනෙක් බත්

මුලක්, පාන් බාගයක් හෝ රොටියක්, පැටිසක් කන්නේ සිත් සතුටෙන් නොවේ, හුදු බඩගින්න නිවා ගැනීමට පමණි.

251. කතරගම/කොළඹ - ත්‍රිකුණාමල බස් රූට් එකේ තේ බොන්න, බත් කන්න අතරමග නවත්වන සමහර කඩවල තවත් ‘අමුතු වැඩ’ සිදුවෙන බව බස් මගියෙක් පවසා තිබුනා. ඒ අතර මගීන් සඳහා වැඩි මිලට මත්පැන් සැපයීම සහ වෙනත් දේ සඳහා කාමර පහසුකම් සොයා දීම වෙනවලු. මත්පැන් අලෙවියට ඔවුන්ට නීත්‍යානුකූල අවසර නැතත් හොර රහසේ ඒවා විකුණනවාලු. එක් ස්ථානයක ‘මත්පැන් පානය කිරීම තහනම්’ කියා පඩිපෙල අසල මේසය ගාව උඩට නගින ඊතලයක් සහිත බෝර්ඩ් ලෑල්ලක් ගසා තිබුනාලු, නමුත්, එයින් ඉඟි කර ඇත්තේ එහි අරක්කු ඇති බවත්, ඒවා අවශ්‍ය අය උඩු මහලට යා යුතු බවත්ය.

252. හම්බන්තොට පළාතේ එක් හෝටලයක මුව මස් ගෝන මස්, මොණර මස්, කැස්බෑ මස්, ඉබි මස් වැනි දේද, ගංජා, හෙරොයින්, මත් හතු වැනි මත්ද්‍රව්‍යද රහසේ අලෙවි වන බව විශ්වාසදායි කෙනෙක් කියා තිබුනා. ඔහු කියනවා ඔවුන් එහි ඇත්තටම කන්න දෙන්නේ ඇත්තම මුව මස්ද, ගෝන මස්ද, මොණර මස්ද කියා කිව හැක්කේ මුදලාලිට සහ මස් සපයන්නාට පමණක්ලු.

253. ප්‍රයිවට් ගමන් යන බස් නඩ එනවා. තරුණ කොල්ලෝ ඉන්න සමහර බස් ප්ලෑන් කරලා එන්නේ, හෝටලේ ෆ්ලඩ්

කරලා හොරෙන් කාලා පනින්න. සල්ලි ගෙවලා කන අවංක කොටසක් ඉන්නවා, බසයේ ආ වැඩිහිටියෝ, කාන්තාවෝ වගේ අය. ඒ අයට මුවාවී අර තරුණ කැල  කාලා කවුන්ටරේ ළඟ සෙනග පොදී ගැහෙන කොට, සල්ලි නොදී බස් එකට නගිනවා. මුදලාලි කොච්චර ඇහැ ගහගෙන හිටියත් සමහර අයව අල්ලන්න බැහැ.

# • සුන්දර අතීතය

254. පාසල් යන කාලයේ මගේ පෙම්වතියට (දැන් බිරිඳ ) පාරේ යන එනකොට වදයක් වුණ වෙනත් පාසලක සිසුවෙකුට මම බිම දමාගෙන ගැහුවා. මේක ආරංචිවුණ මගේ අප්පච්චි මගේ කණ හරහා පාරක් දීලා ඒ සිසුවාගේ ගෙදරට ගිහින් සමාදාන කෙරෙව්වා. ඒ සිසුවා මගේ පියා ගැන කොපමණ පැහැදුනාද කිව්වොත් ගහගත්තේ කෙල්ලක් නිසා කියලාවත් කිව්වේ නැහැ.

255. අපේ අන්කල් කෙනෙක් මම පොඩිකාලේ රතිඤ්ඤා පත්තුකරනකොට ඇවිල්ලා රතිඤ්ඤා එකක් ඉල්ලුවා. සිගරට් එකෙන් රතිඤ්ඤා එක පත්තුකරලා සිගරට් එක විසිකරලා රතිඤ්ඤාව කටේ ගහගත්තා.රතිඤ්ඤේ පිපුරුවා. මුහුණ විනාශයි. තොල්දෙක ඉදිමිලා ඉක්මනට ඉස්පිරිතාලෙට ගෙනිච්චා. වාසනාවට හොඳ වුණා.

256. සාගර පලන්සූරියගේ (කේයස්) සුදෝ සුදු කවි පෙළ කියවන්න; ලියලා තියෙන්නේ එයාගේ ගම ගැන, හැබැයි හැම සිංහල ගමක්ම එහෙමයි.

257. අපේ මුත්තා ඇස් කන්නාඩිය ඔලුවේ රඳවාගෙන ගේ දෙවනත් කර කර ඇස් කන්නාඩි දෙක හොයනාවා; හරි ජොලි.

258. රෑ ‘බට්ටා පනින්න’ ගිහින් කොන්ද කඩාගෙන ආවා. දවස් හතක් එක දිගට තැලුම් තෙල් ගෑවා.

259. මම පුංචි කාලේ උණ වෙඩි ගැහුවා.කුස්සි කැල්ලේ ආච්චි ගොම ගානවා මට අද වගේ මතකයි.අම්මගේ අලුත්ම මල් චීත්ත තමයි ජනෙල් වලට දැම්මේ.හිස් සිගරට් පැකට් අරගෙන ඇවිල්ලා තුනට කපලා ජනෙල් රෙද්දේ මැද්දට දාලා නෙරිය හදනවා.

260. ඒ දවස්වල් අපේ තාත්තා හැමදාම හවසට මස් ගෙනාවා, හරක් මසුත් ගෙනාවා. අපේ අයියා මස් කන්න රුසියා, මස් කාලා මස් කටුත් සුප්පු කරනවා. මම එයාට මස් කට්ටා කියලා දුවනවා. එයා මා පස්සේ පන්නනවා.

261. පාඩම් කරන්න කියලා මැද මේසෙට දැම්මමහම අයියයි මමයි මල්ලියි හොරෙන් කකුල් පාගා ගන්නවා. තාත්තාට අහු උනාම කොටුවක් අරගෙන එනවා අපට ගහන්න, පාඩම් කරපල්ලා කියනවා. එතකොට අපි එක එක බොරු කියලා ලිස්සනවා. බඩගිනියි කියනවා, බඩ රිදෙනවා කියනවා, දවසක් බොරුවට කන රිදෙනවා කියලා ඇන්ඩුවා. තාත්තා මාව දොස්තර ළඟට අරන් ගියා. පොත් පාඩම් කිරීම අපට වහ කදුරු වගෙයි, සෙල්ලමටමයි හිත ගියේ - පෙට්‍රෝ මැක්ස් එළියෙන් රෑටත් ගෙයි පිළිකන්නේ බෝල ගහනවා, අය්යයි මල්ලියි එක්ක, නංගි පොඩි වැඩියි ගන්න. දවල්ට තව කෙල්ලෝ දෙන්නෙක් එක්ක පුළුවන් තරම් එක එක සෙල්ලම් කළා. O’L එකපාරක් කරලා අධ්‍යාපනය නවතා දැමුවා. දැන් තමයි ඒවායේ

පල විපාක තේරෙන්නේ. අපි අම්මාට නම් බය නැහැ, හැබැයි තාත්තාගේ කෝටුවට නම් හරි බයයි. දැන් ඒ දෙන්නම මිය පරලොව ගිහිං.

262. ලස්සන මාමා කෙනෙක් හිටියා - අම්මගේ මල්ලි. 'දූවේ කකුල් මිරිකපන්; කියලා හොඳට හාන්සි පුටුවේ වාඩිවෙලා කකුල මිරිකා ගන්නවා. ළඟක් වෙනකම්ම ඒ හොඳ මාමා හිටියා.

263. ගල් ඔය අලි සිනි ෆැක්ටරිය නැරඹුවා ගෙදර අයත් එක්ක. ට්‍රැක්ටර් වල දාගෙන එන උක් ගස් ෆැක්ටරිය නරබන්න එන අය ඇදලා හොරකම් කරනවා. ෆැක්ටරියේ අයට ගානක් නැහැ, ඒ තරමට උක් ගස්.

264. ගල් ඔය අලි බලන්න කථා වෙලා ගෙදර කාන්ඩේ ඉස්කෝල නිවාඩුවේ ගල්ඔය ගියා. එදා රෑ නැවතුනේ ඉඟිනිමිටිය රෙස්ට් හවුස් එකේ. වැව් 'බන්ඩ්' එක උඩ හරි ලස්සන තැන. සවස රෑ කැලේ ගියා අලි බලන්න, ගයිඩ් කෙනෙක් හිටියෙත් නැහැ. ඔන්න අපි කැලේ වැව් 'බන්ඩ්' එක ළඟ ඉඳගෙන ඉන්නකොට ඇත අලි කෑ ගහනවා ඇහුනා. අම්මා හොඳටම බයවෙලා තාත්තාට කිවුවා 'අපි ළමයි අරන් යමු' කියලා (හැබැයි අපි ගියේ අලි බලන්න!). තාත්තා කාර් එක ස්ටාට් කරලා පවනට බඳු වේගයෙන් නැවත තානායමට ආවා. දුවන වෙලාවේ ඔක්කොම බඩු ටික දාගාත්තා, නමුත් රෑට කන්න ගෙනිච්ච කෑමපාර්සල් ටික ගන්න බැරි උනා. එතැනම දාලා ආවා. කාර් එකේදී මම හොඳටම අඩනවා - අලි

නොදැක්කට නොවෙයි, කරෝල දාපු කෑම පාර්සලේ නැතිවීම ගැන. කාලයක් යනකම් ගෙදර අය මට හිනා උනා කරෝල බබා කියලා.

265. පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රය නරම්ඹන් ඉන්න කොට කුළු හරකෙක් දුවගෙන ආවා තව එකෙක් පස්සේ. ඌ මාව දැකලා අනිකාට යන්න ඇරලා පුංචි මා පස්සේ පැන්නුවා. මට අනින්න පැන්නා. වැඩට හිටියා මැණිකා කෑ ගැහුවා. තාත්තා මැද්දට පැනලා මාව උස්සගෙන අවා. ගෙදර අය හොඳටම බය වෙලා, මට ගානක් වත් නැහැ. පවුලේ කවුද ඕක්කොම ෆොටෝ ගහලා, තාම ස්ලයිඩ් බලනවා ගෙදර කට්ටියම එක්ක සමහර දවස්වල රෑට. සිද්ධිය වෙලා නම් දැන් අවුරුදු 60ත් වැඩියි.

266. මම පුංචිම කාලේ, 1942 විතර, අපිට අයිති පොල්වත්තක් තිබුනා දුන්කාල්පිටියේ. ඒ දවස්වල ඔය දැන් තියෙන තාර පාර නෙවේ තිබුනේ යන්තමින් කරත්ත පාරක්, අඩි පාරක් වගේ, මීගමුවට. අපේ වත්ත පිටිපස්ස කෙලවර වූනේ සුසාන භූමියෙන්. ඊට එහායින් මුහුදු වෙරල. අද වගේ නෙවයි වෙරළ ඛාධනය වෙලා තිබුනේ නැහැ, විශාල පළල ලස්සණ වෙරළ. පොල් ගස් එහෙම බොහොම තිබුනා වෙරළේ, අද ඒ ප්‍රදේශය ගැඹුරු මුහුද. සයිමන් කියලා වත්තේ උයන කෝකියෙක් හිටියා. රෑට මිනිහයි මමයි සොහොනේ කොත් උඩ ඉඳගෙන වල් පල් කථා කරනවා. වලාකුළු නැති දවසක, අහසේ රිදී සීනු වගේ තරුවලින් පිරි රෑක මම ඇහුවා ‘සයිමන් මේ හඳයි,

තාරකායි කියන්නේ මොනවද' කියලා. මිනිහා කිවූවා 'ඕවා දිව්‍යලෝකේ එළි පොඩි බේබි' කියලා.

267. අපේ ස්කූල් බස් එකට (164 මාර්ගයේ) ටික්කෝ පැනලා මගේ යාලුවා, ගාමිණීව අල්ලාගෙන ගියා. මම බස් එකේ ජනේලෙන් පැනලා දිවුවා. මම හින්දි පික්චර් එකක් බලලා හවස්වෙලා ගෙදර එනකොට ටික්කොත් එක්ක ගාමිණී අපේ ගෙදර. මිනිහාට ගෙදර යන්න බැරිව අපේ අම්මට පින්සේන්දු වෙලා දඬේ ගෙවන්න කියලා. ටික්කෝ මාව දැක්කට පස්සේ අම්මට කතාව කිවුවා මමත් නිකං ගියේ කියා. ටික්කො එපා කියද්දී අම්මා දඩ දෙකක් ගෙවුවා. ගාමිණී අම්මාව දැක්කම තාම කියනවා (අවුරුදු 40ට පස්සේ) 'ඇන්ටි, දඩ මුදල ගෙනත් දෙන්නම්' කියලා.

268. සුගත්ලා, දම්මිලා පෙම්කරන්න පටන් ගත්තේ වෙරළු ගෙඩිය සුවඳ ලේන්සුවේ ඔතලා දීලා, ගම්පෙරළියේ පියල් මුල් ලියුම දුන්නේ ඉංග්‍රීසි නවකථා පොත අස්සේ හංගලා;. අද sms කෙටි පණිවිඩ, ඊ මේල්, මුහුනුපොත්, අයිපෑඩ්, ඉන්ස්ටග්‍රාම්. හෙට ....

269. 'උඹ නිසා දුවේ මං' පොත ලියපු ගරු කතෘ මහත්තයා ඉස්ඉස්සෙලාම පොතේ කොපියක් මගේ තාත්තාටත් ගෙනත් දුන්නා. මගේ තාත්තා ඒක එයාගේ පොත් අල්මාරියේ දැම්මා. මට ඒ පොත අරං කියවන්න ගියේ වරුවයි. ඒ දුව, අද දිරිය මවක්, රටට වැඩදායක කාන්තා රත්නයක්.

270. 60 ගණන් වල අපට ගණන් වලට ආවේ සුබද්‍රා මොල්ලිගොඩ කියලා නෝනා කෙනෙක්. පන්තියේ කෙල්ලන්ට තරහ ගියාම එතුමියට බනින්නේ 'මෙයාට එක මොල්ලියක් තිබුණා නම් මෙහෙම අපිට ගහන්නේ නෑ, මොල්ලි ගොඩක් හින්දයි මේ ඔක්කොම' කියලා.

271. පිටකොටුවෙන් පටන් ගත්තු ට්‍රෑම් කාර් එක නැවතුනේ බොරැල්ල හන්දියේන්. එතන ෆාමසියට 'ටර්මිනස් ෆාමසි' නම ආවේ එහෙමයි. 1963දී විතර ආණ්ඩුව ට්‍රෑම් කාර් නතර කළා. යට වෙච්ච ට්‍රෑම් රේල් පිලී සමහර තැන්වල තාම කලාතුරකින් සමහර තැන්වලින් උඩට මතු වෙනවා. පිටකොටුවේ මැනින් මාර්කට් එකේ ඒවාත් හොඳට පෑදීලා තියෙනවා.

272. අපි පොඩිකාලේ (1968) බුලර්ස් පාරේ ඉඳලා බම්බලපිටියට 104 බස් එකේ බාග ටිකට් එක ශත 5යි, අම්මට සත 10 යි. බම්බලපිටියේ ඉඳන් කොල්ලුපිටියට බාගේ ටිකට් එක ශත 3යි. අද රුපියල් 10ක් සහ 5ක් වත් ඇති.

273. 1972 විතර මුළු ලංකාවේම කඩදාසි හිඟයක් තිබුනා. අපේ (ඉස්කෝල හාමිනේ) අම්මා පහුගිය වාර පරීක්ෂණ වල ළමයින්ගේ උත්තර පත්තර වල නොලියපු පිටු ඔක්කොම ගලවාගෙන මට ගෙනත් දෙනවා කටු සටහන් කරන්න. අම්මයි තාත්තයි දවල්ට රෑට මඤ්ඤොක්කා තම්බලා කාලා එයාලගේ මුළු පඩියම මගෙයි අයියලාගෙයි හොස්ටල් ගාස්තු වලට වියදම්

කළා. ඒ හන්දා අපි ඔක්කොම අධ්‍යාපනයේ ඉහලම උපාධි ගත්තා. මොන අම්මාත් කියන්නේ කරන්නේ ඒ වගේ උතුම් දේවල්.

274. ප්‍රසිද්ධ සමාගමක කළමනාකාරිත්ව ආධුනික ඇබර්තු 10කට 5000ට වැඩිය තරුණයින් ඇප්ලයි කරලා තිබුනා. ඉන්ටර්විව් බෝඩ් එකේදී  හැම තරුනයෙක්ගෙන්ම වගේ මම අහපු ප්‍රශ්නයක් තමයි ‘ඔබව අප දැන් බඳවා ගත්තොත් තව අවුරුදු 10කින් ඔබ මේ ආයතනයේ මොන වගේ තැනක සිටීවිද’ කියායි. බොහෝ දෙනා දුන්නේ විකාර උත්තර. කේම්බ්‍රිජ් වලින් මාස්ටර්ස් උපාධියක් දරා ‘උණු උණුවේ’ ලංකාවට ඇවිත් හිටපු, රටේ ‘උසස්ම යයි’ සම්මත පවුලක ඒ තරුණයා කිවේ ‘අවුරුදු 10ක් මට යන එකක් නැහැ මේ ආයතනයේ කලමනාකාර අධ්‍යක්ෂක වෙන්න’ කියා. මා කොම්පැනියේ වෙයාමන් සුද්දාගේ මුහුණ බැලුවා. මිනිහා ඔලුව වැනුවා. තරුණයාට රස්සාව දුන්නා.

275. කිව්වාත් වගේ ඒ තරුණයා විධායක තනතුරු වල ඉහලටම නැග ගෙන ගියා. පස්සේ සුදු ජාතික අද්යක්ෂක කෙනෙක් එක්ක ගැටී (තරුණයා උදේට වැඩට එන, සිය රියදුරු විසින් පදවාගෙන එන ‘රෝල්ස් රෝය්ස්’  වාහනයෙන් බිමට බසුන තුරු බොහෝ දිනවල සුදු ජාතික, වයසක අද්යක්ෂකතුමා ඔහුගේ ‘රෝල්ස් රෝය්ස්’ රථයටවී බලා සිටිය යුතුයි). ඉතා දිගු කථාවක් කෙටි කරනවා නම්, තරුණයාව රැකියාවට ගත් මමත් පසු කාලයකදී ඔහුගේ නන් වැදෑරුම් සමාගම් වල අධ්‍යක්ෂක

හා සමාන වූ උසස් තනතුරුවල සේවය කළා. දහස් ගණනකට රැකියා සැපයූ, ඉතා ගුණ ගරුක, ලෝක ආදරයට පත්, කලගුණ දන්නා ඒ මහතා හදිසි අනතුරකින් මිය යනතුරුම මාව ආමන්ත්‍රණය කලේ 'සර්' කියායි. මා අඩනවා මගේ දරුවන් සහ බිරිඳ විසින් දැක ඇති එකම දවස නම් එතුමා අතුරුදහන් වූ දිනයයි.

276. අපේ බාප්පා වස පානය කර දවස් 3ක් විතර ඉස්පිරිතාලේ නොවෙනා දුක් විඳලා මැරුණා, ඇන්ටි පිටට පෙන්න ඇඬුවත් ඇත්තටම එයාට ගානක් තිබුනේ නැහැ. බාප්පාගේ හැම සතයක්ම හොයලා එයාගේ එකඅවුන්ට් එකට දා ගත්තා.

277. අපේ බෝඩිමේ පොඩි අයට කරදර කරන මදාවි කොල්ලෙක් හිටියා. අපි වැසිකිළියට ගියහම එයා දොර ළග පුටුවක් තියලා උඩට නැගලා ඇතුළට එබෙනවා. දවසක් අපි සැළසුම් කළා එහෙම එබෙනකොට අමතක නොවන වැඩක් කරන්න. වැසිකිළි පෝච්චිය සුද්ධ කරන බුරුසුව වැසිකිළි වලට දාලා අරගෙන එබෙනකොටම මූන පුරා ඇතිල්ලුවා. කතාව බෝඩිමේ විතරක් නෙමෙයි මුළු පාසල පුරාම පැතිරුනා. ඊට පස්සෙ අපිට කිසි කරදරයක් තිබුනෙ නැහැ.

278. ගමේ කෝපි කඩේ කෝපිත් රහයි, කතාත් රහයි. නවත්තන්නෙත් නැහැ.

279. ගාමන්ට් එකේ වැඩ කරපු කාලේ මහලා ඉවරවෙලා මහපු ඇඳුමක් බොරුවට අරගෙන ෆැකටරිය ඇතුලේ වටේට රවුමේ

යනවා කෙල්ලන්ට කථා කරන්න. ඒ ගොල්ලත් මහන ගමන් මාත් එක්ක කථාව. මුළු ෆැක්ටරියේම ඉතා ජනප්‍රිය උනා. කෙල්ලෝ වැඩ ඇරිලා අපේ ගෙදරත් එනවා. දවසක් උඩ ඉඳලා බලන් ඉන්න සුපවයිසර් ලොක්කා ආදරෙන් කථා කරලා ඇහුවා 'මොකද හැම තිස්සෙම රවූමේ යන්නේ' කියලා. මම කිවුවා 'ඩමේජ් පෙන්නන්න ගියා' කියාලා. එයා කිවුවා' ඔයාගේ කොටා එක මදි වැඩි කරන්න ඕන' කියලා වැඩි කළා. ඒත් මම කලින් වැඩ ඉවර කරලා ෆැකටරිය ඇතුලේ වටේම රවුමේ යනවා. ෆැකටරියේ හොඳටම මහන්න පුළුවන් සේවිකාවත් මම නිසා සුපවයිසර්ලා මට ආදරෙයි. අමාරුම මැහීම් වැඩ තමා මට පවරන්නේ. අයිතිකාර සුද්දා කථා කරලා රන් පවුමක් මට පවා දුන්නා. පුතාට කෑම හදලා ගෙදර ඔක්කොම වැඩ කරලා තමා මම ෆැක්ටරියේ වැඩට යන්නේ, ආයි ගෙදර ඇවිත් රෑට උයනවා. අද මම ආච්චි කෙනෙක්. මගේ ජීවිතේ සුන්දරම කාලේයි ඒ.

280. සුපවයිසර්ලා පාට් දානකොට 'අද සෙමින් වැඩ' කියලා චිට් එකක් ලියාලා පිටිපස්සේ කෙල්ලට විසිකරනවා පාස් කර කර යවන්න කියලා. 1500 විතර මහන කෙල්ලෝ ඉන්න මුළු ෆැක්ටරිය පුරාම මගේ චිට් එක ගමන් කරනවා. කෙල්ලෝ එකෙක්වත් කෝටා එකට මහන්නේ නැහැ. සුපවයිසර්ලා ඔළුව කහ කහ බලනවා මොකද උනේ කියලා. අපිට ඔවර්ටයිම් දීලා කොටා එක සම්පූර්ණ කරවනවා. මම ඉන්න කාලේ සේවිකාවන්ව රජ කෙරෙව්වා.

281. ඇත්තටම ඔවැනි වැඩ කල මට කොයි තරම් පෞරුෂයක්, ආත්ම විශ්වාසයක් තියෙනවද. ඒත් මම අද (හොඳ ගෙදරක) කුස්සියේ මෙහෙකාරිනියක්.

282. පොඩි කාලේ අඹ යහළුවෝ නවකතාව කියවනවා තාම මතකයි. සුනිල් අප්පෝ තැලුණු අඹ ගෙඩිය දීපු තම සම වයසේ නිමල්ට කකුලෙන් ගහපු හැටි. තව, මඩොල් දූවේ උපාලි ගිනිවල්ලේ සහ ජින්නාගේ රසවත්, ත්‍රාසජනක අත්දැකීම්; එතකොට වනසරණේ තිසාහාමි, සුදු වැද්දාහි හැන්ස්, ගම් පෙරළියේ නන්දා, විරාගයේ අරවින්ද, කරුමක්කාරයෝහි සෝමදාස, සාරභූමිහි වංලුන්, ගොළු හදවතේ සුගත් සහ දම්මි; සෙවනැලි ඇද මිනිස්සුහි ජස්ටින්, ආත්ම තූනක කථාවක්හි සන්ධ්‍යා මිස්, පිරුණු හඳක්හි කුසුම් සහ නිමල්; අප මේ චරිත තුලින් නේද උඩට ආවේ?

283. ලෝකයේ උසස්ම බහු ජාතික සමාගමක ජ්‍යෙෂ්ට සේවක විධායක තනතුරක්, දශක දෙකක් දැරීමේ මහඟු වාසනාව මා සතු වුනා (ලංකාවේ ප්‍රථම පිරිස් කළමනාකරු මමයි; 'පිරිස් කළමනාකරණයේ පියා හැටියට මාව හැඳින්වෙනවා). නිතර පිටරට යාමේ භාග්‍යය මේ රැකියාව නිසා මට ලැබුනා. 1964දී සමාගම විසින් මාව ඇරියා ඔවුන්ගේ ස්කොට්ලන්තේ පිහිටි 'පෝට් සන්ලයිට්' සබන් කර්මාන්තශාලාවට; මාස 6ක උසස් ගණයේ කලමනාකාරිත්ව පුහුණුවකට. පස්සේ සති හයක් පඩි සහිත නිවාඩු. වයිෆ් ආවා ලන්ඩන් වලට, අපේ ලමයි එයාගේ නංගි ගාව නවත්තලා. අපි හිටියේ ලන්ඩනයේ 'බකිංහැම්

හෝටලේ'. හෝටලෙන් චෙක් අවුට් වෙලා ලිෆ්ට් එක අරං පාරට අවාහම තේරුණේ අපේ බඩු පටවපු ටැක්සිය අපිව දාලා බඩුත් අරං ගිහිං. පැය භාගයක් විතර බලන් හිටියා ටැක්සිය ආවේ නැහැ. වයිෆ් අරහෙන් අඬනවා; කරපු ඔක්කොම ෂොපින් නැතිවුනා පමණක් නොවෙයි අඳින්න ඇඳුමක්වත් ඉතුරු වුනේ නැහැ කියලා. ටයි කෝට් දාපු ටැක්සි ඩ්‍රයිවර් හති ලමින් අපි ලඟට ඇවිත් කියනවා, වැරදිලා එයා බඩු අරං කෙලින්ම වෝටර්ලූ ස්ටේෂමට ගියා කියලා. හිතලා තියෙන්න අපි එම ස්ටේෂමේ එයා බඩු අරං එනකම් බලා ඉන්නවා කියලා. මිනිහා හෝටලේ පෝටර් පිට වරද පටවනවා. ඩ්‍රයිවර්ට අත දිග හැරලා දෙකක් ගහන්න හොඳටම ඕන කම තිබුනත් අත නොයිස්සුවේ මිනිහා හැඩි දැඩි, අඩි 6ට වඩා උස සද්දන්තයෙක් හින්දාත්, මගේ සමාගමෙන් මගේ ගමනට අනුග්‍රාහකත්වය ලබා දී තිබුණු නිසාත්. අප දෙදෙනාව දමාගෙන, වෝටර්ලූ ස්ටේෂමට පවනට බඳු වේගයෙන් ටැක්සිය පැදවූ ඔහු ස්ටේෂමේදී අපව බස්සලා, බඩුත් සේරම බාලා දීලා, මම සල්ලි දෙන්න හදනකොට, සැලියුට් වගේ පාරකුත් ගහලා කියනවා 'ස්තූතියි; ගාස්තුව එපා, සන්තෝෂමුත් එපා; පැරිසියේදී ඔබ දෙපලට සුභ නිවාඩුවක්' කියලා. කෝච්චියේදී වයිෆ් මගේ අතින් අල්ලලා කියනවා 'ඕන්න බලන්න ලන්ඩන් ටැක්සි කාරයින්ගෙයි, අපේ අයගෙයි වෙනස' කියලා.

284. මම රෝයල් කොලිජියේ උගන්නන කාලේ හවසට කොටුවේ ප්‍රෙස් ක්ලබ් ගිහින් කැම්පස් ඉන්න කාලේ ඉඳන්ම මගේ හිටපු හොඳම යාළුවො දෙන්නෙක් එක්ක ඩ්‍රින්ක් එක

දානවා.  මේ දෙන්නාගේ රසවත් කථා අහාලා මටත් මාධ්‍යවේදියෙක් වෙන්න ඇත්නම් කියන ආසාව බොහෝම ඇතිවුනා. පිගේරා කියන දිනපතා ඉංග්‍රීසි පත්තරේට පොලිටිකල් කෝලම් ලියපු මගේ හොඳ යාලුවා ඩ්‍රින්ක් එක දාන ගමන් මට ක්‍රමවේදයක් කියලා දුන්නා. 'ඔයා හොඳට ඇප්ලිකේෂන් එකක් හදා ගෙන යන්න දවල් 130ට විතර අපේ බොසා හම්බවෙන්න. මිනිහා දවල්ට කාලා, ටොපියක් එහෙම කටේ දාගෙන, සුප්පු කර කර, ෆෑන් එක දාගෙන යට ඉන්න වෙලාව. මෑන්ගේ හොඳම මූඩ් එක තියෙන්නේ ඒ වෙලාවේ'. කිව්ව විදියටම  මම කලා. ශ්‍රී ලංකාවේ  'ජනමාධ්‍යයේ පියා' යන විරුදාවලියෙන් සමහරු හඳුන්වනු ලැබූ එතුමාගේ, ප්‍රතාපවත් දේහය දැක්කහම  මට ඇතිවුනේ බියක් නොව සතුටක්. ආර්ය සිංහළ ඇඳුමෙන් හෙබි ඒ සද්දන්ත රත්තරං පාට සිරුර. ගොඩාක් වෙලා මා එක්ක කථා කල ඔහු එක්වරම ඉංග්‍රීසියෙන් කථා කළා – 'වයි ඩූ යූ වෝන්ට් ටු ගිව් අප් සච් අ ෆයින් ජොබ් ඇන්ඩ් කම් හියර්'? කියලා ඇහුවා.  මමත් ඒ වේගයෙන්ම කිව්වුවා 'සර් අයැම් ෆෙඩ් අප් විත් මයි  ජොබ් ඇන්ඩ් වෝන්ට් ටු බී අ පොලිටිකල් කොලම්ස්ට්' කියලා.  මගේ උත්තරය කිරි ගහට ඇන්නා වගේ; මෑන් කැමති වෙලා මට ඒ අති ප්‍රසිද්ධ පත්තර කන්තෝරුවේ  මාධ්‍යවේදී රස්සාවක් දුන්නා. මුලින්ම රස්සාව දුන්නේ පාර්ලිමේන්තුවේ කථා රිපෝර්ට් කරන්න. පසුකලකදී මේ රටේ නම් දරාපු මාධ්‍යවේදියෙක්, ගත් කතුවරයෙක් වූ මගේ මුල් ආරම්භය එහෙමයි.

285. ලීවර් සමාගම විසින් පල කල ලීවර් පවුල සඟරාවේ සහාය කතුවරයා වශයෙන් කටයුතු කරන්න අවස්ථා ලැබුනා. එවකට (1960 ගණන් වල) ලිවර් පවුල මේ රටේ තිබුන හොඳම, ප්‍රියජනක සඟරාවක්. ලීවර් සමාගමින් පිටත අයත් එය ඉතා ආශාවෙන් කියවූවා. 'පෙරහැර එනවා' කියා නුවර පෙරහැර ගැන එහි සංස්කාරකවරයා ලිවූ ඉතා කදිම කවි පන්තිය (ඔහු ඔහුගේ වැඩිමහල් දියණියට ධාතු කරඬුව රැගෙන ප්‍රතාපවත් ගමනින් ඉදිරියට එන 'රාජා' හස්තිරාජයා පිළිබඳව කරන විග්‍රහය), මගේ නමින් අන්තිම පිටේ පල කිරීමට තරම් එතුමා කාරුණික වුනා.

286. අපේ ගෙදර ලොකු රඹුටන් ගස් තිබුනා. රෑට මේ ගස්වල ගෙඩි කන්න එන වවුල්ලු එලවන්න අපි නිදි නැතිව රඹුටන් කාකා ගහේ අතුවල ටක බැඳලා ගහනවා. හරි ජොලි.

287. 1973 නිට්ටඹුවේ අපි දන්නා, අපිට එහා වත්තේ, මනුස්සයෙක් මඤ්ඤොක්කා විස වෙලා මලා.

288. 70 දශකයේ මුල් කාලයේදී කෑම හරි දුලබයි. පාන් ගන්නේ කාඩ් එකට පෝලිමෙ ගිහින් සමුපකාරෙන්. මිරිස් බැග් චෙක් පොයින්ට් දාලා චෙක් කරනවා. අඟහරුවාදා සහ සිකුරාදා හෝටල් වල බත් දීම තහනම්. ඔපෙක් සංවිධානය තෙල් මිල තුන් ගුණයකින් විතර වැඩි කළා, එක පාරටම. හැබැයි කොහොමහරි අන්තිමට රට සැහෙන දුරට ආහාරවලින් ස්වයංපෝෂිත උනා. මම හිතන්නේ සෑම දේම අපේ රටේ වගා

කළා, කෑම ජාති මුකුත්ම පිටරටින් ගෙන්වුවේ නැහැ. වැඩියෙන්ම සතුටින් සිටියේ මහන්සියෙන් වැඩ කරන උතුරේ ගොවි මහත්තුරු - මිරිස්, ළූණු, අර්තාපල් වගේ වවපු අය. එවකට රටේ විදේශ ණය 0යි.

289. 70 දශකයේ මුල් භාගයේදී දූෂණ, අක්‍රමිකතා හරි අඩුයි. දැන් වගේ නොවෙයි දේශපාලනය නිසා දේශපාලනඥයෝ දුප්පත් වෙච්ච කාලයක්.

290. 'ඩබල් ඩොක්ටරේට්' එකක් තිබුන ලංකාවේ මහාම මහා මොළ කාරයෙක් එක්ක කාලයක් හවස කොළඹ NCC පිටියේ ටෙනිස් සෙල්ලම් කළා - 1977 අග භාගයේ වගේ. එයා මට වැඩිය දශක 2කින් පමණ වයසයි , නමුත් වේගයෙන් දුව පැන පන්දුවට පහර දුන්නා. දැන් අය වගේ නෙවයි තමන්ගේ පරණ 'හම්බර්' වගේ කාර් එකක් තමන්ම එළවන් එනවා. අපි සමහරදාට හවස ක්ලබ් එකෙන් විස්කි ෂොට් දෙකක් එහෙම දාලයි ආපසු ගෙදර යන්නේ. සත 5ක් වත් වංචා නොකළ රත්තරන් මොළ කාරයෙක් වූ එතුමා කියූ සමහර පරණ කථා ඇසුනහම ඇස් දෙකට කඳුළු ආවා.

291. 1970දී 'සුදුස්සාට සුදුසු තැන දෙන' සංකල්පය මත, කවදාවත් දේශපාලනය නොකළ අපේ තාත්තාට සංස්ථා සභාපති කමක් ලැබුනා. පාඩුවට තිබු සංස්ථාව අවුරුද්දකින් වගේ ලාභ ලබන ආයතනයක් බවට පත් කළා. පෞද්ගලික පාවිච්චිය සඳහා දී තිබුණු සංස්ථා වාහනේ පාවිච්චි කලේ ගෙදර

ඉදලා හෝර්ටන් ප්ලේස් වල තිබුණු සංස්ථා කාර්යාලයට යන්න පමනය්. තුල්හිරිය, වේයන්ගොඩ, පූගොඩ (එවකට තනා නිමකළනොකළ) වැනි කම්හල් වලට තාත්තා නිතරම ගියා - සති අන්තයේ පවා. ඒ ගියේ, පෞද්ගලික පාවිච්චිය සඳහා දී තිබුණු සංස්ථා වාහනේ හෝර්ටන් ප්ලේස් කාර්යාලයේ දාලා, ඩබල් කැබ් එකකින්. ගමනට අවශ්‍ය කරන කොළඹ ප්‍රධාන කාර්යාලයේ කළමනාකරුවන්, ගනබාධිකාරීන්, ක්ලාක්ලා ඔක්කොකම එකේ දාගෙන යනවා සංස්ථාවට පෙට්‍රල් ඉතුරු කරලා දෙන්න.

292. වරක් තාත්තාට විදේශ රජයක තානාපති කාර්යාලයකින් වටිනා විස්කි ඇතුළු නොයෙක් රට මත්පැන් සහිත තෑගී පෙට්ටි කිහිපයක් තෑගී ලැබුනා හිතවත්කමට. ඒක සංස්ථාවට කපු නූල් සපයන රටක්. තාත්තා වහාම සිද්ධිය අදාළ ඇමතිවරයාට වාර්තා කරලා තෑගි භාණ්ඩ සංස්ථාවේ තුල්හිරියේ ‘අමුත්තන්ගේ නිවාසයට’ භාර දුන්නා, ඉන්වෙන්ට්‍රියක් එහෙම හරියට හදලා.

293. වස පානය සිය දිවි නසා ගත් අපේ මාමාගේ මරණයෙන් අවුරුදු 3ට විතර පස්සේ ඇන්ටිව හම්බුනා ඉස්පිරිතාලයකදී, අපි දෙන්නම එකම ලෙඩා බලන්න ඇවිල්ල්ලා. ලෙඩා බලලා ඉවරවෙලා එලියට ඇවිදගෙන එනකොට කීප වරක් ආදරණීය මාමා ගැන කථා කරන්න හැදුවා. එයා ඉඩ දුන්නෙම නැනේ, කොහොමහරි කතාව අනිත්පැත්ත හරෝනවා.

294. තාත්තා කිරි කන්න ගිහින් පැණි බෝතලේ අරගෙන,'කවුද දරුවනේ මේ පැණි බෝතලේ ඉවර කළේ' කියලා ඇහුවා. අපේ චුටි නංගි අපි කාටත් කලින් දුවලා තාත්තා ළගට ගිහින් කියනවාලු, 'මං නම් පැණි කෑවේ නෑ තාත්තේ' කියලා. කියලා තියෙන්නේ ගවුමෙන් කට පිහදමමින්.

295. මම ගැටයා කාලේ (ඒ කියන්නේ මීට අවුරුදු 35ට විතර එපිට) මම බඩල්කුඹුරේ පන්සලකට අයිති හේන් ඉඩමක ගොවිතැන් වැඩ කළා. රෑට සතා සීපාවා එලවන්න කෑ ගහලා සී පද කියනවා. දවසක් රෑ ගහ උඩ පැලේ ඉන්නකොට කුනකටුවෙක් කකුල හපලාල මම බිම ඇද වැටිලා කෑ ගහනවා. ලොකු හාමුදුරුවෝ කිව්වා මෙයාව මොණරාගල රෝහලටම ගෙනි යන්න කියලා. බකමූන රෝහලේ ඇම්බියුලන්ස් එකෙන් මාව මොණරාගල රෝහලට ගෙනාවේ. ඒ ඩ්‍රයිවර් ඇම්බියුලන්ස් එක එලෙව්වා නොවෙයි ඉගිලෙව්වා. ඇත්තම කියනවා නම් එතුමා හින්දායි මගේ ජීවිතය බේරුනේ. ගහට ගහක් මොරටුවේදී හම්බවෙනවා කිවාක් මෙන්, ඊට අවුරුදු 14ට පස්සේ මට එතුමාව හම්බවුනා බිබිලේ හොටලයකදී - මිනිහා එතකොට පෙන්ෂන් ගිහිල්ලා. මම එතකොට එතන ප්‍රධාන කොත්තු බාස්. ආසාවේ වැඩි කමට මම කොත්තු කොටන හැන්දෙන් කොත්තු දෙකක්ම දාලා දුන්නා, පාර්සල් කරලා ගෙනියන්න.

296. අපි එක පාරක් නිවාඩුවකට දියතලාවේ ගිය වෙලාවේ පොඩි නංගිගේ බර්ත්ඩේ පාටි එක එහේ නිවාඩු නිකේතනයක ගත්තා, මවුන්ටන් රෙස්ට් කියන සුඛෝපභෝගී තැනක්.

තරඟයක් සූදානම් කරලා. නොයෙක් අසාමාන්‍ය කෑම ජාති කන්න ඕනා, තියලා තිබුනා. වැඩිම එවැනි කෑම යුගල් සම්පූර්ණයෙන්ම කාපු කෙනාට තෑග්ගක් ලැබුනා. මට මතක් විදියට දාලා තියලා තිබ්බ පිස්සු කෑම ජාති සමහරක්: යෝගට් එක්ක වට්ටක්කා, උළුඳු වඩේ සමඟ සවු, මයියොක්කා සමඟ වැලිතලප, උණු උණු පරාටා එක්ක අයිස් ක්‍රීම්, ඉදුණු කෙසෙල් ගෙඩි සමඟ ලුණු මිරිස්, ගොටුකොල සමඟ කේක්, දෙහි යුෂ සමඟ කිරි අල, තැම්බුන් හොදි එක්ක තල ගුලි, ෆැන්ටා සමඟ තොසේ, සමෝසා එක්ක කතුරුමුරුංගා මැල්ලුම්.

297. ඒ දවස්වල ඉරිදාට අපි බ්‍රවින්ස් බීච් යනවා බුෆේ කන්න, මුළු පවුලත් එක්කම. දෙමව්පියෝ යන්නේ ඒ ගොල්ලන්ගේ යාලුවන්ටත් එන්න කියලා ෆෝන් එකෙන් කතා කරලා. කාර් එක පාක් කරන්න තරම් වත් ඉඩ නෑ, ඒ තරමට කොළඹින් එන වාහන මීගමුව මුහුදු වෙරළට. අපි මුදේ නාලා, හෝටලේ පූල් එකේ පිනාලා හවසට තමා එන්නේ.

298. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, පළමු සේවය සහ වෙළඳ සේවය අපි ඒ දවස්වල හරිම ආසාවෙන් අහන්නේ. පලවෙනි සේවයේ ශාස්ත්‍රීය වැඩ සටහන් ඉහල ගුනාත්මයකින් යුතුයි. ප්‍රයිවෙට් FM නාලිකා තිබුනේ නැහැ, ඔලුව කැක්කුම හැදෙන රැප්, කර්ණ කටුක හෙවි මෙටල් සංගීත, ඉංග්‍රීසියෙන් කොපි කල සිංහල ගීත එකල තිබුනෙත් නැහැ.

299. දවසක් වඳුරෙක් අපේ ගෙදර කාමරයක් ඇතුලටම ඇවිත් අම්මාගේ මුහුණ බලන කණ්ණාඩිය අරගෙන මුහුණ බල බලා කොස් ගහක් උඩට නැග්ගා. ඌ හරියට මිනිහෙක් වගේ වාඩිවෙලා කණ්ණාඩියෙන් මුහුණ බල බලා හිටියා. අපි ගහ මුලට වී ගහ උඩ වඳුරා කරන කෝලම් බල බල ඉන්නකොට ඌ කන්නාඩිය දාලා දිවුවා, කන්නාඩිය සී සී කඩ ගියා.

300. 1960 මුල ගණන් වල මම ඉස්කෝලේ යන ගමන් කැඩී කෙනෙක් හැටියට මොඩල් ෆාම් පාරේ 'රෝයල් කලම්බෝ ගොල්ෆ් ක්ලබ්'හි ගොල්ෆ් බෑග් උස්සං යාම, ගොල්ෆ් බෝල එකතු කිරීමේ රක්ෂාව කළා. චන්දෙන් පැරදිච්ච හිටපු අගමැති තුමෙක් ගොල්ෆ් ගහන්න ඇවිත් එයාගේ සුපුරුදු කැඩී නැති හන්දා දවසක් මට කථා කළා. මම දවසම වගේ එතුමාට සේවය කළා. එදා එතුමා ගාව මට ගෙවන්න මුදල් තිබුනේ නැහැ, පර්ස් එක ගෙන්න අමතක වීම නිසා. එතුමා කොච්චර හොඳ ද කියනවානම් දවසක් ගොල්ෆ් ගහලා ඉවරවෙලා මාව හොයාගෙන වනාතමුල්ලේ මගේ ගෙදර ඇවිල්ලා, අම්මාට නෝට් එකක් දීලා ගිහිල්ලා මට ස්තුති කරලා, රුපියල් 50කුත් එක්ක.

301. 70 ජීවන ක්‍රමය අදත් තිබුනා නම් අපි ඔය ලැප්ටොප් තියාගෙන කොට කොට ඉන්ඩ හම්බ වෙන්නේ නෑ.එහෙනම් තාමත් රෑ අට වෙද්දී අල්ලපු ගෙදරට ගිහින් මුවන්පැලස්ස අහල ගෙදර ගිහින් රොටියක් පුච්චලා කාල කුප්පි ලාම්පුව නිමලා, නිදා ගන්නවා. ඉරිදා රෑ 8ට මොනරතැන්න අහනවා. පොඩි

මල්ලි පොකට් රේඩියෝ එක කනටම තියාගෙන ඇපාසිංහ මහත්තයාගේ 'ක්‍රිස්ටල් ක්‍රීඩා තොරතුරු' අහනවා.

302. 'සිනමාවේ සක්විති' නැමැත්තා ගොඩාක් ජනප්‍රිය වෙන්න ඉස්සර තරුණ කොල්ලා කාලේ 'මාර්කටින් රෙප්' ජොබ් එකකට ජනප්‍රිය බහුජාතික සමාගමේ ඉන්ටර්විව් එකකට ආවා. ඉන්ටර්විව් එකේදී මම කිවා 'ඔයාට ජොබ් එක දෙන්නම්, ඒත්, තව ටිකක් කල්පනා කරලා බලන්න. ඔයාට රඟපෑමෙන් කවදාහරි උඩටම එන්න පුළුවන් කියලා'. මිනිහා ගෙදර ගිහින් මට ටෙලිෆෝන් කරලා කියනවා 'සර්, සර් කියන එක හරි, මම ඔබ සමාගමේ රැකියාව ගන්නේ නැහැ, දිගටම ඇක්ටිං වලට යනවා' කියලා. වසර ගණනාවකට පසු මම කාණ්ඩයක් එක්ක අබේපුස්ස තානායමේ ඉන්න කොට මෙයා ඇවිල්ලා මාව දැකලා එයාගේ කරේ දමා තිබූ මල්මාලේ ගලවලා මගේ කරේ දාලා එතන හිටපු පිරිසට ඇහෙන්න කියනවා 'මෙතුමා නැත්නම් මට අද රගපෑමෙන් මේවගේ තැනකට එන්න බැහැ' කියලා.

303. ඒ 70 දශකයේදී, හැම ඉරිදාම රෑ 10 ට රවිනාත විමලධර්ම මහත්තයා 1වැනි සේවයෙන් ප්‍රචාරය කල කර්ණ රසාලිප්ත හින්දි/උර්දු සින්දු පැය අහලමයි නිදාගන්නේ, පසුදා, සඳුදා, උදේම වැඩට යන්න බලාගෙන.

304. හැමදාම රෑ 730 ට ටොම් පෙරේරා මහතා 'ක්‍රිස්ටල් ස්පෝර්ට්ස් නිව්ස්' කියා ඉංග්‍රීසි සේවයෙන් කදිම ක්‍රීඩා තොරතුරු සංග්‍රහයක් කළා, ඒක නොවැරදීම දිනපතාම ඇහුවා (ඉරිදා හැර), කාලයක් මුළුල්ලේ. එක් වරම එය නැවතුනා.

පස්සේ හොයා බැලුවහම දැනගන්න ලැබුනා එතුමා වැඩට ගුවන් විදුලි සංස්ථාවට එන කොට ස්කූටරය වාහන අනතුරකට ලක් වෙලා එතුමා මැරිලා කියලා. එතුමාගේ දයාබර බිරිඳද එකල දක්ෂ ගුවන් විදුලි නිවේදිකාවක්. හැබැයි මාධ්‍ය වලින් එතුමාගේ මරණය ගැන එතරම් ප්‍රචාරයක් දුන්නේ නැහැ.

305. 1990 මැද විතර අන්තිම අමාරු කාලයක් අපට. රටේ යුද්ධෙ තදටම යනවා. ඉන්නම තැනක් නැති කොට බම්බලපිටියේ විසාකා පාරේ ගාලු පාරට හැරෙන හන්දියේ ලැලි මඩුවක කුලියට හිටියා වයිෆුයි, පොඩි අත දරුවයි එක්ක. රෑට කුප්පි ලාම්පුව ඕෆ් කරලා, ලතා මංගේෂ්කාර්ගේ කැසට් එක (බැටරි) දාගෙන නිදා ගන්නේ. 'වය්ශ්නාව ජනතෝ' සිංදුව ඉවර වුනාහම කවුද දොරට ගහනවා 'දොර අරින්න, දොර අරින්න' කියලා. එළියේ හොඳටම වැස්ස. බැලුවහම රෑ ඩියුටි යන රාලාහාමිලා දෙන්නෙක්. 'අනේ තරහ නැතුව අර සිංදුව ආයි දාන්නකෝ හරිම රසාලිප්තයි', කියලා කිවුවා. පස්සේ ඒ අය මුළු කැසට් එකම අහලයි ගියේ. වයිෆ් කහට තේ හදලා හකුරු එක්ක දුන්නා.

306. ඉස්සර අපේ ගෙට අල්ලපු වත්තේ සියා කෙනෙකුගේ පැණි දොඩම් ගහේ ගෙඩි ඉදිලා අතු බිමට බරවෙලා. මේක දැක්කම චුටි නංගියි මමයි ඒ වත්තට පැනල පැණි දොඩම් ගෙඩි කඩාගන්නවා. මේක දැක්ක ඒ සියා අපිව ගේ ඇතුලට එක්ක ගෙනිහින් පැණි දොඩම් ගෙඩිය හතරට කපලා ලුණු, ගම්මිරිස්

දාලා හැන්දෙන් කන්න කිව්වා. ආයි ඕනෑම වෙලාවක ඇවිල්ලා ගෙඩි දෙක  දෙක දෙන්නාට කඩා ගන්න කිව්වා.

307.  ඔය 70 දශකයේදී මම  කොළඹ ප්‍රාථමික පන්තියේ ඉගෙන ගන්න සිසුවෙක්. ඒකාලේ ගෙදරට ඇවිත් ආපයින් ආපසු ටියුෂන් යන්නේ නැහැ.  ශිෂ්‍යත්ව විභාගෙට ලිවුවේ ඉස්කෝලේ නෝට්ස් වලින්. හවසට ඉස්කෝලේ ස්විමින් පූල් එකට ගිහින් පිනනවා - වෝටර් පෝලෝ වැනි ජල ක්‍රීඩා, යාළුවො එක්ක මාර්බල්ස් ගහනවා ඇතිවෙන්න, නැත්නම් රෑ කළුවර වැටෙනකම් ක්‍රිකට්. සෙනසුරාදා උදේ ස්කවුටින්, පස්වරුවේ  බේරේ වැවේ බෝට්ටු පුහුණුව. මගේ දරුවන්ට මේ සුන්දර  ජීවිතය දෙන්න බැරිවීම මට දුකක්.

308.  මමයි අයියල දෙන්නයි අක්කයි  මහව අපේ ගමේ ඉස්කෝලේ ඇරිලා, සැතපුම් එක හමාරක් විතර පයින් එන්නේ. ගස්වලට පොලු ගගහ තමයි එන්නේ. ඒ ආපුවාම ගොඩක් දවස් වලට තියෙන්නේ මඤ්ඤොක්කා තම්බලා තමා තියෙන්නේ. මට ඒකාලේ (මඤ්ඤොක්කා යුගයේ ) මඤ්ඤොක්කා පේන්ඩ බෑ.මම කන්ඩ බෑ කියල අඬනකොට අම්මා  කරන්නේ නැන්දලගේ ගෙදර ගිහින් එහෙ තියෙන දෙයක් ගෙනත් දෙනවා. බොහෝ වෙලාවට ඒ ගෙදර තියන්නෙත් අපේ ගෙදර දේමයි. එතකොට කරන්නේ කඬේට ගිහින් පාන් කාලක් ගෙනත් දෙනවා. පාන් ගෙඩියම සත 34යි.

309. මම අදත් හරි කෙට්ටුයි. මගේ මහත්තයා කියනවා 'ඔයාට මම අවසර දෙනවා, මොකද ඔයා මඥ්ඥොක්කා යුගයේ ළමයෙක් නේ කියලා' (මම උපන්නේ 1973 නේ).

310. මාමා කෙනෙක් හිටියා රට. ඒකාලේ රට හිටියේ එසේ මෙසේ කෙනෙක් නොවේ. ඔය මාමා රට ඉදන් එනකොට අපේ ගෙදර ටත් ඇපැල් ගෙඩි 2ක් ලැබුනා. මම පළමු වතාවටයි ඇපැල් ගෙඩියක් දැක්කේ. ඕක 6 ට කපල කෑවා. ඒක හරියට අමුර්තේ වගේ. ඕක කාලා මම කිව්වා සිතුවා 'කවද හරි මාත් දවසක රට ගිහින් ඇපැල් ගෙඩියක් තනියම කනවා' කියලා. ඔය කතාව ගෙදර සියලු දෙනා එකතු වූ විට මැතක් වනතුරු මාව බයිට් කිරීමට යොදාගත්තා.

311. අපි දන්නා මොලේ සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයෙක් හිටියා අපිට ගෙවල් 3ක් පමණ එහායින් . අපේ තාත්තගේ ගජ යාලුවා, දෙන්න එකට බ්‍රිජ්/චෙස් ක්‍රිඩා සෙල්ලම් කරනවා. 71 ජේවීපී කලබල කාලේ මොලේ ඔපරේෂන් එකක් කරලා මිනිහා ගෙදර එනකොට රෑ 12ට චෙක් පොයින්ට් එකකින් නවත්තලා. බර්ගර් මහත්තයෙක් වූ උන්නැහේ අත් දෙක උස්සගෙන චෙක් පොයින්ට් එකට ගිහිල්ලා කර්ෆිව් පාස් එක පෙන්වූවාහම සැරෙන් අහලා තියෙනවා මේ රෑ කොහෙද ගියේ, ජොබ් එක මොකක්ද කියාලා. මම නියුරෝ සර්ජන් කියලා මිනිහා කියලා. හමුදාවත් හරි බයෙන් ඒ කාලේ හිටියේ මොකද ජේ.වී.පී එකෙන් චෙක් පොයින්ට් වලට ගහන තත්වයක් තිබුනා. සර්ජන්ව හමුදා භාරයට ගත්තා. එයාට ඇහිලා

තියෙන්නේ 'නිව් ඉන්සර්ජන්ට්' කිව්ව හැටියට. උසස් හමුදා නිලධාරියෙක් ඇවිත් එතුමාව නිදහස් කළා.

312. මේ ළඟදි ලන්ඩන්හි අපේ ගෙදරට ෂොපින් යනකොට මම ඇපල් ගැනීම නැවැත්වුවා, වයිෆ් ඇහුවා ඇයි කියලා; මං කිවා මට ඒ තරමට දැන් ඇපල් එපා වෙලා කියලා. එයා කියනවා මතකද අපි 1990 ගණන් වල මාලඹේ කුලී ගෙදර ඉන්නකොට ඇපල් ගෙඩිය 4 ට කපලා, අපි හතර දෙනා කාපු හැටි කියලා. ඒ දවස්වල ඇපල් හරි ගණන්, ගෙඩියක් මං හිතන්නේ රුපියල් 50 විතර උනා.

313. තාත්තාට ලිවර් සහෝදර සමාගමේ සාමානාායාධිකාරී වගේ ලෙස ලොකුම උසස්වීමක් ලැබුනා. අපේ පවුලට අළුත් වටිනා ගෙයක්, වටිනා කාර් එකක් එහෙම ගත්තේ ඔය කාලේ. තාත්තා කතරගම දෙවියන්ට වෙච්ච භාර භාර ඔප්පු කරන්න ලොකු පිරිතක් කිව්වා. ධාතු කරඬුව වැඩම්මව්වේ මගේ හිස පිට, දැවැන්ත පෙරහැරකින්. කොටා පාරෙන් භාගයක් පොලිසිය ඇවිල්ලා වැහුවා. පුංචි මට ලොකු වගකීමක්. අයියාට දුන්නේ හාමුදුරුවරුන්ගේ දෙපා හෝදන එක, ඒ දවස්වලම හිටන් මැන්ට ඊරිසියාව, කේන්ති ගිහින් මහා පිරිතෙන් පස්සේ නිදා ගත්තා. පොඩි අයියානම් ආසාවෙන් තුවාවලින් හාමුදුරුවරුන්ගේ කකුල් පිහි දැම්මා. අපි කට්ටිය මුළු රෑම නිදි මැරුවා කිරි කොපි බිබී. හාමුදුරුවරු බස්සලා අළුත් හාමුදුරුවරු වාහනවලින් වඩම්මනවා, හරි ජොලි. පහුවදා දානෙන් පස්සේ පන්සලේ කළමනා ගිහිල්ලා භාර දුන් වෙලේ ලොකු

හාමුදුරුවෝ ඔලුව අත ගාලා 'හරි හොඳ ළමයා' කිව්වා. එදා උන් වහන්සේගේ දකුණුපසින් සිටි පොඩි හාමුදුරුවෝ අද පන්සලේ විහාරාධිපති. හම්බුනහම ආ ගිය දේවල් කථා කරනවා.

314. 'තාත්තේ මරණය සමග සෙල්ලම් කිරීමට ආස නිසාද අර පුද්ගලයා පාපුවරුවේ යන්නේ? ඒක එයාට විනෝදයක් ගෙන දෙන්නක්ද'? මම දුවට කියනවා 'දුවේ, 1970 මුල් කාලයේ මමත් ඕන හැටියේ ලංකාවේ බස් වල ෆුට් බෝර්ඩ් එකේ ගියා. එක ඇඟිල්ලකින් එල්ලිලා. එක කකුලක් ෆුට් බෝර්ඩ් එකේ අනික එළියේ. ත්‍රාසජනක ක්‍රීඩාවකට තියෙන ආසාවට නෙමෙයි දුවේ, කොහොම හරි වැඩ ඇරිලා ගෙදර යා ගන්න ඕනේ නිසා'.

315. ගැටවර වයසේ ඇවිදලා, ඇවිදලා සමහර දාක රෑ වෙලා, 7 - 8ට විතර, ගෙදර එන්නේ. කළුවරේ කඩුල්ල ළඟ කෙනෙක් බලන් ඉඳලා මම ගෙදරට හැරෙන පාරට ඇතුල් වෙනවත් එක්කම ඇතුලට යන ඡායාවක් මට යන්තමට ඈතට පේනවා. ඒ අම්මා. හිතේ මම දැක්කේ නැහැ කියලා. හැබැයි, ගෙදර ආවහම වචනයක් වත් කියලා බනින්නේ නැහැ.

316. දවසක් 103 අංක දරන තට්ටු දෙකේ බස් එකක පාපුවරුව කඩා වැටිලා මං ඉස්සරහම පාපුවරුවේ එල්ලිලා ගිය කලිසම් කාර මිනිහක් වැටිලා මලා; උනේ මරදානේ ඇට්ලස් හෝල් බිල්ඩිම (පරණ) ඉස්සරහ, 1974 දී විතර. ඒ මිනිහාගේ මුහුණ වහන්න සුදු රෙද්දක් සැපයුවේ ඒ අසළ තිබු මුස්ලිම් කඩයක හිමියෙක්.

317. සොහොන් කොත් වල අර්ථවත් වදන් ලියලා තියනවා, ඉස්සර ගිහින් බලනවා. ආගමේ සොහොන් කොත් වඩාත් රසවත්. කොත් දැක්කහම රට හොල්ලපු මිනිස්සු දැන් ඔක්කොම ඉන්නේ බොරැල්ලේ කනත්තේ නේද කියලා හිතෙනවා.

318. අනේ ඉතින් අපි ඔක්කොමලා ඉවර වෙන්නේ කොහේ හරි කනත්තකනේ.

319. බොරැල්ල කනත්තේ නාඳුනන මළමිනි වළලන තැන්වල ඉඳලා තියෙනවා මැරිච්ච කෙනාව දන්නවා වගේ ඉන්නවා. ඕකට මටම හරියන යාලුවෙක් හිටියා සේපාල කියලා. මිනියේ කටයුතු සියල්ල කරන අයුරු බලන් ඉන්නවා, මිනිස්සු, වැඩියෙන්ම තරුණ ගෑනු ළමයි මැරිච්ච අම්මගේ වල පල්ලේ විලාප දෙන විදිය දැක්කම, අඬන හැටි දැක්කම, මටත් ඇඬෙනවා. ඊට පස්සේ තවත් වළලන මිනියක් බලන්න යනවා. ගෙදර යනකොට රෑ වෙලා.

320. 1980 විතර කොළඹ 2 බ්‍රෙබ්රූක් ප්ලේස් එකේ ශාලාවක හවසක මුස්ලිම් මඟුල් ගෙයක් තිබුනා. මහා විශාල මඟුලක්, විශාල සෙනගක්. එම්පයර් එකේ ෆිල්ම් එක ඉවර වෙලා ගෙදර යන ගමන් යාළුවයි මායි ඇතුල්වෙලා මඟුලට ආවා වගේ ඉඳගෙන හොඳට දුන්තෙල් බතුයි කුකුල්, එළු මසුයි ආදිය දමලා ඇරියා. ඩෙසර්ට් එකට තිබුනේ වටලප්පන්. ඒ මුස්ලිම් මිනිස්සු

අපිට හොඳට සැලකුවා . අදහස යාලුවාගේ, මොකද මට තනියම එවැනි දෙයක් කරන්න හිතක් නැහැ, ගටක් නැහැ.

321. මම ක්‍රිකට් ගහන්න යන්නෙත් හොඳට මූණ හෝදලා ටැල්කම් පව්ඩර් දාලා. මොකද අපි සෙල්ලම් කරන ගමන් මම බලනවා ගැණු ළමයි ඉන්නවද මැච් එක  බලන කියලා. දවසක් අතටම ආපු කැච් එකක් මිස් වෙලා ගියා. කෙල්ලෝ ටික කැකිරි පැලෙන්න හිනා උනා, එක්කෙනෙක් ඇරෙන්න.

322. මා පාසල් යන කාලයේ රුපියල් 1.20 ක් හා බෑග් එකක් ද රැගෙන බසයෙන් ජාතික පොළට ගොස් (එතකොට තිබුනේ බුලර්ස් රෝඩ් එකේ) එළවලු තුනක් රැගෙන, කඩල ගොට්ටක් ද කා බසයෙන්ම ආපසු ගෙදර ආවේ, සත 32 කුත් ඉතිරි කරගෙන.

323. පොඩිකාලේ අලුතින් හාරන මිනි වලවල් බලන්න අපි කනත්තට යනවා, මොකද එතකොට අවුරුදු ගානකට කලින් වලලපු මිනි ඇට කටු හමු වෙනනිසා. ඒවා හොරෙන් එකතු කරගෙන සරමේ කැහපට දාගෙන ඇවිල්ලා ගෙදර බෝඩ් වෙලා හිටපු මෙඩිකල් කොලේජ් එකේ අයියාට දෙනවා.

324. මෙඩිකල් කොලේජ් එකේ අයියාට කනත්තේ මිනි ඔලු ඇහිදින්න ගිහින් අම්මා ගම්මුන්ගෙන් ඒ ගැන දැනගෙන අපිට ගුටි දීපු හැටි තාම මතකයි.

325. පොල්තෙල් බෝතලයකට සැවැන්දරා මුල් දමා, වර්ණ ගන්වා ඒවා මසාජ් ඔයිල් කියා පෙන්වා, එක මසාජ් එකට සුද්දන්ගෙන් රුපියල් 3000 ගත් අපේ මාමා මාසජ් එකට පැමිණි එක් සුද්දියක් සමඟ යහළුවී ඇය සමඟ දීර්ග කාලයක් එකට වාසය කළා. සුද්දී ලෙඩක් හැදී මැරුණු පසු අධික දුකට පත්වූ මාමා බිමට ඇබ්බැහි වී මිය ගියේ හිතේ දුකට කෑම නොගැනීම නිසා බව මරණ පරීක්ෂණ වාර්තාවේ සඳහන් වුනා.

326. අපේ ගෙදර රෑට අම්මා කෑම දුන්නා අන්කල් කෙනෙකුට ෆර්නැන්ඩෝ කියලා. රස්සාව කරපු එක්කෙනෙක්. කාලවර්ණයි. මාසේ අන්තිමට බිල ගෙවනවා. හරි නිශ්ශබ්ධව කෑම ටික කාලා යනවා. දවසක් හැබැයි කට ඇරලා කිවුවා ‘ලොරිස් පාරේ ලයට් කණුවක මිනිහෙක් එල්ලිලා මැරිලා’ කියලා. අපි උදේ ගිහින් බලනකොට මුකුත් නැහැ. රෑම මිනිය ගෙනියන්න ඇති.

327. මම විශ්ව විද්‍යාලේ යන්න පටන් ගත්තට පස්සේ කැම්පස් හොස්ටල් එකේදී පුරුදු වුනා නානකොට ෂවර් එකේ ඉඳන් සින්දු කියන්න. නිවාඩුවට ගෙදර ඇවිත් පුරුද්දට සින්දු පටන් ගත්තාහම තාත්තා අම්මාට කියලා ‘බලන්න අර ළමයට බඩේ අමාරුවක්ද දන්නේ නැහැ, කෙඳිරි ගාන සද්දයක් එනවා කියලා’.

328. ඉස්සර අපි සම මෘදු වෙන්න නිවියා ක්‍රීම් ගාලා, කුරුලෑ වැහෙන්න මුහුණට පොන්ඩ්ස් වැනිෂින් ක්‍රීම් ගාලා, හිසකේ ගල් වගේ තියා ගන්න සහ දිලිසෙන්න යාර්ඩ්ලි බ්‍රිල් ක්‍රීම් ගානවා.

මව්ලානා එකෙන් රුපියල් 7.75ට ගත් හෙන්ටලී අත් කොට කමිසය ඇඳන් එයට කැපෙන දුඹුරු පාට හීනී ලෙදර් ටයි එක බැඳ ගන්නවා. සෙනසුරාදා හවසට අම්මාගේ ඩෝෆින් රෙනෝල්ට් එක ඉල්ලගෙන මම ඩ්‍රයිව් කරන් යන්නේ මගේ පෙම්වතිය එක්ක ඩාන්ස් කරන්න, මවුන්ට් ලැවිනියා බීච් හොටෙල් එකේ ලිට්ල් හට් එකට. එතැනදී ගහන ගෲප් එක ජෙට්ලයිනර්ස්. ප්‍රධාන ගායකයා ඇල්ස්ටන් කොච්, ගායිකාව, මිනෝන් රත්නම්.

329. අපි හැම අවුරුද්දෙම වගේ පවුලේ චායාරූපයක් ගත්තා. ඒ ගන්න යන්නේ ඩොනල්ඩ්ස් නැත්නම් ප්ලාටේ එකට.

330. ඉස්සර මේ වගේ ටියුෂන් නැහැ. 1965 දී විතර, පාසැල ඇරිලා (විසාකා) ගෙදර ඇවිත් බත් කාලා ඉංග්‍රීසි නවකතාවක් කියවනවා. 3නේ ඉඳන් 4 වෙනකම් 'වැනල්' පියානෝ එක වාදනය කරවා. ගොඩාක්ම ගහන්නේ සුනිල් ශාන්ත/CT ප්‍රනාන්දුගේ 'ඕලු පීපිලා', 'මා බාල කාලේ' වැනි සින්දු. තේ එහෙම බිලා ගෙදරින් යනවා -5 ඉඳල 6 වෙනකම් වෙන්ඩි වොට්මෝර් ඇකඩමියේ එලකියුෂන්.සෙනසුරාදා උදේ අම්මා එයාගේ කාර් එකෙන්ම මාව ගිහිල්ලා බස්සනවා ග්‍රීන් පාත් එකේ ටෙනිස් පුහුණුව. ඊට පස්සේ උදේ 10ට විතර කොල්ලුපිටියේ චිත්‍රසේන/වජිරා කළායතනයට. උඩරට නැටුම්, ලී කෙලි නැටුම් එහෙම පුරුදු වුනා. දවල් 12ට අම්මා ඇවිත් අර ගන්නවා. කොල්ලුපිටිය හන්දියේ පෙරේරා ඇන්ඩ් සන්ස් එකෙන් පේස්ට්‍රි රෝල්ස්/චයිනීස් රෝල්ස්, චොකලට් කේක් වගේ රස ආහාර අම්මා අරං දීලා, කොල්ලුපිටියේ ක්‍රීම් හවුස්

එකෙන් (දැන් අබාන්ස් බිල්ඩිම), අම්මා මට වැනිලා අයිස් ක්‍රීම් කෝන් එකක් අරං දෙනවා එතන ඉඳගෙනම කන්න. පස්සේ හවස වරුවේ SSC පූල් එකට ගිහිං පීනලා, පී නට්ස් පැකට්ස් අරගෙන නෑ ගෙවල් වල (වැඩියෙනම් බාප්පාගේ) යනවා. එහෙන් කන්නේ නැති දවස්වල සවස ආපහු ගෙදර යන්නේ බම්බලපිටියේ සරස්වතී ලොජ් හෝ ග්‍රීන්ලන්ඩ්ස් එකෙන් උණු උණු තොසේ, උළුඳු වඩේ, මසල වඩේ, හොදි, සම්බෝල ආදිය අරං, පාර්සල් කර, රෑට ගෙදරදී කන්න. පහේ දාපු රසම රස ලොකු මුරුක්කු පැකට් එකක් ගන්න මා අමතක කරන්නේ නැහැ. තොසේ පාර්සල් හදන කම් අම්මා සත 10ක් කහ පැහැති 'ඒවරි' බර කිරණ මැෂිමට දාලා එයාගෙයි මගෙයි බර බලා ගන්නවා.

331. ඒ දවස්වල හැම සිකුරාදාම වගේ රෑට අපි පිටින් කන්නේ. තාත්තා අපිව අරං යන්නේ ඒ දවස්වල තිබ්බ හොඳම හෝටලේකට - හයිඩ් පාරක් කෝනර් එකේ පාර්ක් විව් හොටේල්, කෙයිසර් ස්ට්‍රීට් එකේ පිලාවුස්, කොම්පඤ්ඤවීදියේ ෆවුන්ටන් කැෆේ/නිපෝන්, කොල්ලුපිටියේ ලෝටස්, බම්බලපිටියේ ග්‍රීන් කැබින්, හැව්ලොක් පාරේ ජේඩ් ගාර්ඩන්ස්, කොලඹ 7තේ ෆ්ලවර් ඩ්‍රම්, ඩුප්ලිකේෂන් පාරේ කරි බෝල් වගේ තැන් වලට. කාලා ඉවර වෙලා, යුනියන් ප්ලේස් එකේ එලිෆන්ට් හවුස් ෆෞව්න්ටන් කැෆේ එකට යනවා. සමහර දාට ගෝල්ෆේස් ගිහින් ඇලරික්ස් අයිස් ක්‍රීම් වෑන් එකෙන් අයිස් ක්‍රීම් අපට අරං දෙනවා.

332. එදා තිබුනා කදිම පානයක් වොටර්බරිස් කම්පෞන්ඩ් කියලා. එය කෙනෙකුව උද්‍යෝගමත්ව සහ නිරෝගිමත් ව තබනවා.

333. කළාවට ලැදි කවුරුත් එදා අශාවෙන් කියවපු, උසස්ම සඟරාවක් වුයේ තරංගනී මාසික ගුවන් විදුලි සඟරාව. 1956 දී වසරක දායකත්වය වූනේ රුපියල් 6.50යි.

334. මම සෞදියේ වැඩ කරන කාලේ (1980 අග) හිටියේ අල් සයානි කියලා කෝටිපතියෙක් ගාව. මම ගෙදර බෝයි හැබැයි, අපි ආශ්‍රය කලේ යාළුවෝ හැටියට, ඒ තරම් හිතවත්. ලංකාවේ ගර්ල් කෙනෙක් වැඩ කළා සෞදි රථ වාහන අමතර කොටස් විකුණන ෂොප් එකක. මම සයානිගේ බෙන්ස් එකෙන් යනවා එයාව බලන්න. ඒ ගර්ල් ආපහු ලංකාවට ගිය වහාම මම සයානි ගාවින් අයින් වෙලා ලංකාවට ගිහින් ඒ ගර්ල් වල බැන්දා. අපිට අද පුතෙක් සහ දුවක් ඉන්නවා. පුතා වෛද්‍යවරයෙක්, දුව මේ පාර AL කරනවා. සෞදි අතීතය මතක් කරනවට වය්ෆ් කැමති නැහැ.

# • හොඳ තේරවිලි

335. ගසට නමකි ගස මැරුණුම වෙන නමකී - ගෙඩියට නමකි ගෙඩියේ පොත්තට නමකී - මදයට නමකි මද කනකොට වෙන නමකී - මෙතුන් පදේ තෝරලා කියන් සකී
ගස = ගොයම් .., ගස මැරුණුම =පිදුරු..., ගෙඩිය = වී ඇටේ .., පොත්ත = දහයියා.., මදය = සහල්..., මද කනකොට = බත්

336. එක තැනමයි හිටං ඉන්නේ, එක එකමයි කන්න දෙන්නේ, පෝය දාට බඩ පිරෙන්නේ, සිලිං සිලිං නද ඇහෙන්නේ = පිං පෙට්ටිය

337. උල් කටු මිටියක් මගේ පිටේ තියෙනවා, යන යන තැන එය මා අරගෙන යනවා, කරදර කලොත් තරහක් මට එනවා, පුජ්පා කටු පාරක් ඔන්න මම විදිනවා = ඉත්තෑවා

338. අත්තක් උඩ බුම්මාගෙන - කටු අත්තක් පොරවාගෙන = බකමුනා

339. පුංචි ලිඳේ වතුර රසයි - තැඹිලි

340. නැට්ට නැති ගෙඩිය = බිත්තරය

341. රවුම් මුහුණ මම තමයි, ටික් ටික් මගේ හඬ තමයි, හැම තිස්සෙම වැඩ තමයි, හපනෙක් නම් මගේ නම කියයි = එලාර්ම් ඔර්ලෝසුව

342. බෙල්ලෙන් අල්ලලා මුල්ලෙන් තියනවා = හිරමනය

343. ගහක් උඩ ගෙඩියක්; ගෙඩියක් උඩ ගහක් = අන්නාසි

344. දෙක වේලේ දේශනාව මඩුව මත්වෙලා

දෙක වේලේ = කත්, දේශනාව = බණ; මඩුව = ශාලාව; මත්වෙලා = වෙරි

කත්බණශාලාව වෙරි

බත් කන වෙලාව ශරි

345. එක් මුල්ලකට වී සිට ලොව පුරා ගමන් කරන්නේ = තැපැල් මුද්දරය

346. වෙල මැද හිටගෙනයි තනියම මම ඉන්නේ; තනියක් නම් නැහැ මට කිසි විට දැනෙන්නේ; උදේ, දවල්, රෑ අනුන් බය කරන්නේ; ඉතිං මං කවුදැයි ඔයාලා කියන්නේ = පඹයා

347. ඇතිමුත් කකුල් හතරක් නොමැත කිසි දින ඇවිදින්නේ, ඔබලෑ බරයි මම ඔසවන් ඔහේ ඉන්නේ = පුටුව

348. පුස්තකාලයට ගන්න බැරි පොත = ඉලපොත

349. කේතලෙන් මල්ලක් = මාතලෙන් කෙල්ලක්

350. බොම්සාලේ = සම්බෝලේ

351. මැන්ගිරි ඩිනිකා = ඩිංගිරි මැණිකා

352. කම්බල උඩ = උම්බලකඩ

353. දූනපරේ = පානදූරේ

354. වලාහත = හලාවත

355. මුත්තරබල්ල = බත්තරමුල්ල

356. ඌකි නනත් = නාකි උනත්

357. වහලා ගහනවා = ගහලා වහනවා

358. බකං නිලාගෙන = නිකං බලාගෙන

359. රොම්බස් පිජා පිජා = පිම්බත් රජාරජා

360. අඩු වෙනවා, වැඩි වෙනවා, පෝය දාට වැඩිම වෙනවා = හඳ

361. අලියා නොකන දැල්ල = ගිනි දැල්ල; අලියා නොකන මග = ඉනි මග

362. ගුලක් බලා මා රිංගනවා, එය ඇතුලේ කැරකෙනවා, ගේ දොර බඩු රැක දෙනවා, මා කවුදැයි ඔබ කියනවා = යතුර

363. මගේ මල් පිබිදෙනවා, මගේ කොළ නිදියනවා, මගේ කටු කකුලේ ඇනෙනවා = නිදිකුම්බා ගහ

364. වංගෙඩි කඳන් වැනි කකුලුයි තියෙන්නේ, මහා වැළකිනි හකුලා අරගෙන කන්නේ, මහත දෙහෙත කිසි අඩුවක් නොමවන්නේ, මේකා මොකාදැයි තෝරා කියවන්නේ = අලියා